



2050 වන විට කාබන් විමෝචනය අවම කර්මු • 2050 இல் கார்பன் நடுநிலை எய்தும்

ANNUAL REPORT 2020

ஆண்டறிக்கை 2020

වාර්ෂික වාර්තාව 2020

CARBON NEUTRAL BY 2050





ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය
இலங்கை நிலைபெறுதகு வலு அதிகாரசபை
Sri Lanka Sustainable Energy Authority





2050 වන විට කාබන් විමෝචනය ශුන්‍ය මට්ටමට ඉහළ නංවමු

දිවයිනක
ජීවත් වන අපි ග්ලැසියර් දිය
වීම හා මුහුදු මට්ටම් ඉහළ යාම හේතුවෙන්
දින දින ඉහළ යමින් පවතින ගෝලීය උණුසුම් වීමේ
ප්‍රතිඵලයක් ලෙස මතු වන අභියෝග රැසකට මුහුණ පාමින්
සිටින්නෙමු. එවන් පසුබිමක් තුළ, ඊට පිළියම් යෙදීමට අප වෙත ඉතිරි
වී ඇති කාලය ඉක්ම යාමට පෙර පරිසරය වෙත කාබන් මුදා හැරීම පාලනය
කිරීම සම්බන්ධයෙන් ඉතාම සුපරීක්ෂාකාරී පියවරක් ගැනීම අත්‍යවශ්‍ය කරුණකි.
කලින් කලට විවිධ ගෝලීය මට්ටමේ අනතුරු හැඟවීම් රැසක් නිකුත් කෙරෙන
හෙයින් ප්‍රමාදයකින් තොරව කාලගුණය හා සබැඳි නිසි ක්‍රියාමාර්ග කඩිනමින් අනුග
මනය කිරීම ද අවශ්‍යම පියවරකි.

මේ නිසා, කාබන් විමෝචනයෙන් තොර හෙට දිනක් වෙනුවෙන් 2050 වසර වන විට කාබන්
විමෝචනය උදාසීන කිරීම උදෙසා ශ්‍රී ලංකාව දැනටමත් වැඩ පිළිවෙළක් දියත් කර ඇති අතර
මෙම කාලීන වශයෙන් ඉතා වැදගත් ඉලක්කයෙන් 70% ක් 2030 වන විට සපුරා ගැනීමට
අපේක්ෂිතය. 2020 වන විට අප එකී ඉලක්කයෙන් 30% ක් සාක්ෂාත් කර ගනිමින් සැලකිය
යුතු ප්‍රගතියක් අත්කර ගෙන ඇති අතර, කාලගුණික තත්ත්ව ඉලක්ක කර ගත් ක්‍රියාමාර්ග
අනුගමනය කරමින් විවිධ කර්මාන්ත, නිවාස හා ප්‍රජාවන් තුළ වෙනසෙහි මූලබීජ රෝපණය
කරනු ඵස් නිරතුරුවම කැප වෙමින් සිටින්නෙමු.

අපගේ දැක්ම ජාතික න්‍යාය පත්‍රයෙහි දැක්ම හා සැසඳෙනවා පමණක් නොව සමස්ථ
ලෝකයම අරමුණු කර ගත් ක්‍රියා පිළිවෙත් වෙත ද අනුගත වන්නකි. ශ්‍රී ලංකාවේ
තිරසාර බලශක්තිය සම්බන්ධයෙන් වගකීම පැවරෙන ඉහළම අධිකාරිය වන
අපි සැමට යෙහෙන් දිවි ගෙවීමට හැකි පරිදි මිහිතලය ආරක්ෂා කිරීම
හා අනාගතය තිරසාර අයුරින් ගත කිරීමට හැකි වාතාවරණයක්
උදා කිරීම උදෙසා ගෝලීය උණුසුම ඉහළ යාමට බලපාන
බලපෑම්වලින් ශ්‍රී ලාංකිකයන් මුදවා ගැනීමට
නිරතුරුව ඇපකැප වී සිටින්නෙමු.

අන්තර්ගතය



04 -17 අප ගැන

අපගේ දැක්ම/මෙහෙවර	4-5
අප ගැන	6
මෙම වාර්තාව ගැන	7
කාර්යසාධනයට අදාළ වැදගත් කරුණු	8-9
වැදගත් මං සලකුණු	10-11
සභාපතිතුමාගේ පණිවුඩය	12-13
අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ සමාලෝචනය	14-15
කළමනාකරණ මණ්ඩලය	16
විගණන හා කළමනාකරණ කමිටුව	17

18 -19 ආයතනික පාලනය

ආයතනික පාලනය	18
අවදානම් කළමනාකරණය	19

කළමනාකරණ සාකච්ඡාව හා විශ්ලේෂණය 22 -30

කාර්යසාධන සමාලෝචනය	22-28
2021 කාර්ය සැලසුම	29-30

31 -66 මූල්‍ය ප්‍රකාශන

ආදායම් ප්‍රකාශනය	32
මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය	33
ස්කන්ධය වෙනස් වීම පිළිබඳ ප්‍රකාශනය	34
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය	35
මූල්‍ය ප්‍රකාශන වලට සටහන්	36-52
ආයතනික තොරතුරු	

ජාතික විගණන කාර්යාලය විසින් නිකුත් කරන ලද විගණන වාර්තාව

ජාතික විගණන කාර්යාලය විසින් නිකුත් කරන ලද විගණන වාර්තාව	54-66

54 -66

අපගේ දැක්ම







“බලශක්ති සුරක්ෂිතතාවෙන් හෙබි ශ්‍රී ලංකාවක්”



අපගේ අරමුණ

දේශීය බලශක්ති සම්පත් සංවර්ධනයට සහ ගවේෂණය, සම්පත් සම්පාදනය, පර්යේෂණය සහ සංවර්ධනය සහ දැනුම කළමනාකරණය මගින් බලශක්තිය සංරක්ෂණයට දායකවෙමින් ස්වභාවික, මානුෂික සහ ආර්ථික ධනය තිරසාර පුරුදු මාර්ගයෙන් තහවුරු කරමින් ශ්‍රී ලංකාවේ බලශක්ති සුරක්ෂිතතාවය අත්පත් කරගැනීමේ සමස්ථ ක්‍රියාවලියේදී ජාතියේ මගපෙන්වන්නා ලෙස කටයුතු කිරීම.

අප ගැන

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් බලාත්මක කරන ලද 2007 අංක 35 යන ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරී පනතේ විධිවිධාන ප්‍රකාරව 2007 ඔක්තෝබර් 01 වන දින ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය පිහිටුවන ලදී.





ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය යනු ශ්‍රී ලංකාව තුළ සුනිත්‍ය බලශක්ති ක්ෂේත්‍රයට පුරෝගාමීත්වය ලබා දීමේ වගකීම පැවරී ඇති ආයතනය වේ. ශ්‍රී ලංකාව පුරාවටම බලශක්ති කාර්යක්ෂමතාවට නායකත්වය ලබා දෙන, එමෙන්ම සඵලදායී, කාර්යක්ෂම හා පරිසර හිතකාමී අයුරින් බලශක්ති අවශ්‍යතා ඉටු කිරීමට උපකාරී වනු පිණිස සුනිත්‍ය බලශක්ති ප්‍රභවයන් ප්‍රගාමීව හඳුනා ගන්නා ප්‍රධානතම ආයතනයක් බිහි කිරීමේ පරමාර්ථයෙන් එය ස්ථාපිත කරන ලදී. ශ්‍රී ලංකාවේ අනාගත වර්ධනයට අතිශයින්ම වැදගත් ක්ෂේත්‍රයක් කළමනාකරණය කරනු ලබන ආයතනයක් වශයෙන් සූර්ය, සුළං, ජල හා ජෛව බලශක්ති යනාදී මෙරට සුලභ පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් අඛණ්ඩව සංවර්ධනය කිරීම අපගේ පරමාර්ථයයි.

අනාගතයේදී සුපිරිසිදු, තිරසාර හා දේශීය වශයෙන් සම්පාදනය කර ගනු ලැබෙන බලශක්ති ප්‍රභවයන් වෙත ප්‍රවිශ්ඨ වීමට ශ්‍රී ලංකාවට මඟ පාදනු පිණිස බලශක්ති ක්ෂේත්‍රයෙහි උපායමාර්ගික ආයෝජන වෙත පුරෝගාමීත්වය ලබා දීමට ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ අපි නිරතුරුවම ඇපකැප වී සිටින්නෙමු. අපගේ බලශක්ති ප්‍රභවයන් සංවර්ධනය කිරීමට ප්‍රයත්න දරන අතරම, සුනිත්‍ය බලශක්තිය ආශ්‍රිත ජාතියේ අවශ්‍යතා ඉටු කරනු වස් නවෝත්පාදනීය බලශක්ති විසඳුම් සංවර්ධනය කිරීමට අපට හැකි වනු පිණිස පර්යේෂණ හා සංවර්ධන කටයුතු හා දැනුම් හුවමාරු කිරීමටද අපි උත්සාහ දරන්නෙමු.

මෙම වාර්තාව ගැන

අපගේ ආයතනය පිළිබඳ විස්තීර්ණ පිළිබිඹුවක් හා මෙහි සමාලෝචනයට ලක් කෙරෙන කාල පරිච්ඡේදයට අදාළව එහි සමස්ථ කාර්යසාධනය පිළිබඳ දැක්මක් අපගේ පාර්ශ්වකරුවන් වෙත ලබා දීමේ අරමුණින් අපි 2020 වසර සඳහා වූ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන ඇතුළත් ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ වාර්ෂික වාර්තාව මෙහි ඉදිරිපත් කෙරේ.

වාර්තාකරණ ප්‍රමිති හා මූලධර්ම

මෙම වාර්ෂික වාර්තාවෙහි හෙළිදරවු කර ඇති තොරතුරු අදාළ ව්‍යවස්ථාපිත අවශ්‍යතා හා ආයතනයේ පාලන ව්‍යුහයට අදාළ අවශ්‍යතාවලට අනුකූල බව ද මෙහි ඇතුළත් කර ඇති විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLFRS හා LKAS) අනුකූලව විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් නිසි පරිදි විගණනය කර ඇති බව ද ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය සහතික කරයි.

පරාසය හා සීමා

ආයතනයේ මෙහෙයුම් සමාලෝචනය කරනු පිණිස විශේෂිත කොටසක් මෙම වාර්ෂික වාර්තාවට එක් කර ඇත. මෙම වාර්ෂික වාර්තාවෙහි ඉදිරිපත් කර ඇති තොරතුරු සියල්ලම මූලික වශයෙන් ම 2020 ජනවාරි 01 දින සිට 2020 දෙසැම්බර් 31 දින දක්වා කාල පරිච්ඡේදය තුළ එහි ව්‍යාපාරික මෙහෙයුම්වලට අදාළ වේ.



කාර්යසාධනයට අදාළ වැදගත් කරුණු

පුනර්ජනනීය බලශක්ති උත්පාදනය

ගිගාවොට් පැය **1,866** 2020

1,579 - 2019

කුඩා ජල විදුලි ව්‍යාපෘති වෙතින් ලද සමුච්චිත ධාරිතාවය

මෙගාවොට් **421** 2020

419 - 2019

සූර්ය බලශක්ති ව්‍යාපෘති වෙතින් ලද සමුච්චිත ධාරිතාවය

මෙගාවොට් **75** 2020

57 - 2019

සුළං බලශක්ති ව්‍යාපෘති වෙතින් ලද සමුච්චිත ධාරිතාවය

මෙගාවොට් **148** 2020

128 -2019

ජෛවස්කන්ධ ව්‍යාපෘති වෙතින් ලද සමුච්චිත ධාරිතාවය

මෙගාවොට් **53** 2020

43 - 2019

ජාතික බලශක්ති ජාලයට සම්බන්ධ කර ඇති සූර්ය පියැසි පද්ධති සංඛ්‍යාව

31,165 2020

24,696 - 2019

බලශක්ති කාර්යක්ෂම උපකරණවලින් බලශක්තිය ඉතිරි කිරීම

ගිගාවොට් පැය **780** 2020

738 - 2019

වහල මත ඉදි කළ සූර්ය පියැසි පද්ධති වෙතින් ලද සමුච්චිත ධාරිතාවය

මෙගාවොට් **337** 2020

261 - 2019

විස්තරය	ඒකකය	2019	2020
කාර්යසාධනයට අදාළ වැදගත් කරුණු			
පුනර්ජනනීය බලශක්ති උත්පාදනය	GWh	1,579	**1,866**
කුඩා ජල විදුලි බලාගාර වෙතින් ලද සමුච්චිත ධාරිතාව	MW	419	**421**
සූර්ය බලශක්ති ව්‍යාපෘති (පොළොව මත සවි කළ) වෙතින් ලද සමුච්චිත ධාරිතාව	MW	57	**75**
සුළං බලශක්ති ව්‍යාපෘති වෙතින් ලද සමුච්චිත ධාරිතාව	MW	128	**148**
ජෛවස්කන්ධ ව්‍යාපෘති වෙතින් ලද සමුච්චිත ධාරිතාව	MW	43	**53**
ජාතික බලශක්ති ජාලයට සම්බන්ධ කර ඇති වහල මත ඉදිකළ කුඩා සූර්ය බලාගාර සංඛ්‍යාව	සංඛ්‍යාව	24,696	**31,165**
වහල මත සවි කළ සූර්ය පියැසි පද්ධති ව්‍යාපෘති වෙතින් ලද සමුච්චිත ධාරිතාව	MW	261	**337**
වහල මත සවි කළ සූර්ය පියැසි පද්ධති ව්‍යාපෘති වෙතින් ලද සමුච්චිත ධාරිතාව	GWh	362	
බලශක්ති කාර්යක්ෂම උපකරණ හේතුවෙන් ඉතිරි වූ බලශක්ති ධාරිතාව	GWh	738	**780**
වළක්වන ලද කාබන් ඩයොක්සයිඩ් ප්‍රමාණය	මෙට්‍රික් ටොන්	2,090,338	
මානව ප්‍රාග්ධනය			
සුනිත්‍ය බලශක්ති අධිකාරියේ සමස්ථ කාර්ය මණ්ඩලය	සංඛ්‍යාව	104	**100**
වසර 10 කට වැඩි සේවා කාලයක් සැපිරූ සේවක සංඛ්‍යාව	සංඛ්‍යාව	54	**54**
වසර 5 කට වැඩි සේවා කාලයක් සැපිරූ සේවක සංඛ්‍යාව	සංඛ්‍යාව	77	**79**
සේවකයන් සඳහා වැය කළ මුළු ගෙවීම්	රු. මි.	92	**108**
සමාජ හා සබඳතා ප්‍රාග්ධනය			
පවත්වන ලද බලශක්ති විගණන සංඛ්‍යාව	සංඛ්‍යාව	25	**5**
බලශක්ති කළමනාකරුවන් සංඛ්‍යාව	සංඛ්‍යාව	7	**2**
උපකරණ කුලියට දුන් දින සංඛ්‍යාව	දින	1,710	**900**
පළ කරන ලද බලශක්ති ලේබල්කරණ ප්‍රමිතීන් සංඛ්‍යාව	සංඛ්‍යාව	2	**1**
හම්බන්තොට සූර්ය බලශක්ති උද්‍යානයට පැමිණි සංචාරකයන් සංඛ්‍යාව	සංඛ්‍යාව	1,100	**560**
සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් ලියාපදිංචි කරන ලද සූර්ය බලශක්ති සේවා සමාගම් සංඛ්‍යාව	සංඛ්‍යාව	327	**442**
පළ කරන ලද සූර්ය බලශක්ති ප්‍රමිති සංඛ්‍යාව	සංඛ්‍යාව	1	**1**
පහසුකම් සලසන ලද පර්යේෂණ සංඛ්‍යාව	සංඛ්‍යාව	6	**1**
ප්‍රකාශන සංඛ්‍යාව	සංඛ්‍යාව	8	**7**

වැදගත් මං සලකුණු



2007

- ශ්‍රී ලංකා සූර්ය සම්පත් සිතියම පළ කරන ලදී.

2010

- විදුල්කා ප්‍රදර්ශනය, ජාතික බලශක්ති සම්මන්ත්‍රණය, බලශක්ති කාර්යක්ෂමතා සම්මාන හඳුන්වා දෙන ලදී.
- පළමු අනිවාර්ය බලශක්ති ලේබලය සහිත නිෂ්පාදනය - (සංයුක්ත ප්‍රතිදීප්ත විදුලි පහන) ඉදිරිපත් කිරීම.
- වහල මත සූර්ය බලශක්තියෙන් බලශක්තිය උත්පාදනය කිරීම වෙනුවෙන් නෙට්-මීටරින් ක්‍රමය හඳුන්වා දෙන ලදී.

2011

- පාසල් බලශක්ති සමාජ පිහිටුවන ලදී.
- හම්බන්තොට පිහිටි මෙගාවොට් 1.237 ක ධාරිතාවක් සහිත පළමු ජාලය හා සබැඳි සූර්ය බලාගාරයෙන් විදුලිය සැපයීම ආරම්භ කරන ලදී.

2014

- ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය පිහිටුවන ලදී.
- 6 සිට 11 දක්වා ශ්‍රේණි සඳහා වන ජාතික විද්‍යා විෂය මාලාවට සුනිත්‍ය බලශක්තිය යන විෂයය හඳුන්වා දෙන ලදී.

2015

- ප්‍රතිපත්තිමය අරමුණ සාක්ෂාත් කර ගනිමින් නව පුනර්ජනනීය බලශක්ති ප්‍රභව වෙතින් උත්පාදනය කෙරෙන බලශක්ති දායකත්වය 10% දක්වා ඉහළ නංවන ලදී.

2016

- නෙට්-මීටරින් ක්‍රමවේදය වැඩිදියුණු කරමින් වහල මත සවි කළ සූර්ය පියැසි පද්ධති වෙනුවෙන් සූර්ය බල සංග්‍රාමය වැඩසටහන දියත් කරන ලදී

2017

- දස වැදෑරුම් වැඩසටහන් සමඟින් බලශක්ති ඉල්ලුම් කළමනාකරණය පිළිබඳ ජනාධිපති කාර්යසාධන බලකාය පිහිටුවන ලදී.



- සූර්ය බල සංග්‍රාමය වැඩසටහන යටතේ වහල මත සවි කළ සූර්ය බලාගාර වෙනුවෙන් පිහිටුවන ලද මෙගාවොට් 100 ක බලශක්ති උත්පාදන ඉලක්කය සාක්ෂාත් කර ගන්නා ලදී.
- UNDP/FAO/GEF හි අනුශයින්ම සාර්ථක ඇගයීම් ලද ජෛවස්කන්ධ සුනිත්‍ය බලශක්ති ව්‍යාපෘතිය සම්පූර්ණ කරන ලදී.

- ශ්‍රී ලංකා ජාතික බලශක්ති ප්‍රතිපත්තිය හා උපායමාර්ග පාර්ලිමේන්තුවේ සභාගත කරන ලදී.
- ශ්‍රී ලංකාවේ නිරසාර බලශක්ති නිවාස සැලසුම්කරණය සඳහා මාර්ගෝපදේශය පළ කරන ලදී.
- UNDP/FAO/GEF හි Energy NAMA ව්‍යාපෘතිය සම්පූර්ණ කරන ලදී.

- පුනර්ජනනීය බලශක්ති උත්පාදනය මෙගාවොට් 1,000 දක්වා ඉහළ නංවන ලදී.
- වහල මත සවි කළ සූර්ය සියැසි පද්ධතිවල උත්පාදන ධාරිතාව මෙගාවොට් 300 ඉක්මවන ලදී.
- සිවිලිම් විදුලි පංකා සහ ශීතකරණ සඳහා අදාළ නියාමන රෙගුලාසි සම්පූර්ණ කරන ලදී.
- LED විදුලි බුබුළු සඳහා බලශක්ති ලේබල්කරණ වැඩසටහන ගැසට් කරන ලදී.

සභාපතිතුමාගේ පණිවිඩය

කොවිඩ්-19 වසංගතය හේතුවෙන් 2020 වසර මෑත ඉතිහාසයේ අප අත්විඳි අතිශයින්ම අභියෝගකර වසර වුව ද එම කාල පරිච්ඡේදය තුළ ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියට නායකත්වය ලබා දීමට අවස්ථාව හිමි වීම මා ලද මහත් භාග්‍යයකි. එවැනි බිඳ වැටීමක් මධ්‍යයේ වුව ද මෙහි සමාලෝචිත වසර තුළදී අප අධිකාරිය සැලකිය යුතු මට්ටමේ ප්‍රගතියක් අත් කර ගැනීම හේතුවෙන් 2020 වසර සඳහා වන මෙම වාර්ෂික වාර්තාව ඔබ වෙත ඉදිරිපත් කරනු ලබන්නේ මහත් සතුටිනි.

පුනර්ජනනීය බලශක්තිය සඳහා නව ඉලක්කයක්

අභිනව රජයේ "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්තිමය දැක්ම තුළ පුනර්ජනනීය බලශක්තියේ ඇති වැදගත්කම මෙන්ම ජල, තාප, ගල් අඟුරු හා විකල්ප පුනර්ජනනීය බලශක්ති ප්‍රභව ආදියෙන් සමන්විත මෙරට සමස්ථ බලශක්ති මිශ්‍රණයෙහි අංගයක් ලෙස එයට හිමි වැදගත්කමද අවධාරණය කරන ලදි. 2030 වසර වන විට මෙරට සමස්ථ බලශක්ති මිශ්‍රණය 40% ක් දක්වා පුනර්ජනනීය බලශක්ති මිශ්‍රණය හළ නැංවීමට නියමිත අතරම එම වසර වන විට සමස්ථ බලශක්ති මිශ්‍රණයෙන් 80% ක් ම ජල හා පුනර්ජනනීය බලශක්තියෙන් සමන්විත වනු ඇති බවද එහි සඳහන්ය. එම ප්‍රතිපත්තිමය ඉලක්කය සාක්ෂාත් කරීම සඳහා නව රජය සුනිත්‍ය බලශක්ති සංවර්ධන ක්‍රියාදාමයන්ට ඉහළ ප්‍රමුඛතාවක් ලබා දෙන ලදි.

2020 වසර පිළිබඳ කෙටි සාරාංශයක්

අභිනව ජනාධිපතිතුමන්ගේ පදවි ප්‍රාප්තිය සහ 2020 වසර තුළ රට ගමන් කරන්නට යෙදුනු නව මාවත හේතුවෙන් එකී වසර බලාපොරොත්තු දල්වාලන්නක් බවට පත් වූ අතර අපගේ පුනර්ජනනීය බලශක්ති ඉලක්ක සාක්ෂාත් කර ගනු වස් අදාළ ක්‍රියාමාර්ග කඩිනම් කිරීම උදෙසා සැලකිය යුතු තරමේ සැලසුම් සකස් කරන ලදී.

කෙසේ වෙතත්, වසර මුල් භාගයේදී ව්‍යාප්ත වූ කොවිඩ්-19 වසංගතය හේතුවෙන් දිගු කාලීන වශයෙන් රට වසා දමන්නට සිදු වූ අතර මෙම වයිරස ව්‍යාප්තිය වළක්වාලීම උදෙසා රජය මහත් පරිශ්‍රමයකින් කටයුතු කළ නමුදු ශ්‍රී ලංකාවේ සෑම අංශයකම පාහේ ආයතනවල කටයුතු දැවැන්ත බිඳ වැටීමකට ලක් වූ බව නොරහසකි. එවන් පසුබිමක වගකීම්සහගත ආයතනයක් වශයෙන් ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ මෙහෙයුම් පවත්වා ගෙන යන අතරතුරදී අපගේ සේවකයන් හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් කිසිදු ලෙසකින් අවදානමට ලක් නොවූ බව තහවුරු කරනු පිණිස අපි ඉතා සුපරීක්ෂාකාරීව සැලසුම් කරන ලද පියවර අනුගමනය කළෙමු. සමස්ථයක් ලෙස ගත් කල මෙවැනි විවිධාකාර අභියෝග රැසක් මධ්‍යයේ වුවද වසර පුරාවටම සාර්ථක ලෙස සේවාව ලබා දීමට අපට හැකි වූ බව කියන්නට ලැබීම මා හට සතුටක් දනවයි.

මෙම වසරට අදාළ ඉතාම කැපී පෙනෙන ජයග්‍රහණය වූයේ මෙරට ඉතිහාසයේ මුල්ම වතාවට පුනර්ජනනීය ප්‍රභව ආශ්‍රයෙන් මෙගාවොට් 1,000 ක බලශක්ති උත්පාදනයක් සාක්ෂාත් කර ගැනීමේ අපගේ ප්‍රමුඛ ඉලක්කය සාධනය කර ගැනීමට අපට හැකි වීමයි. සත්‍ය වශයෙන්ම, මෙය සමස්ථ රටම ලැබූ සුවිශාල ජයග්‍රහණයක් බව කිව මනා ය. 2007 වසරේදී ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය පිහිටුවන ලද අතර ඊට පෙර පැවැති ආයතනය වූ බලශක්ති සංරක්ෂණ අරමුදලේ සේවය කරමින් සිටි කාර්ය මණ්ඩලය අන්තර්ග්‍රහණය කර ගනිමින් එහි මෙහෙයුම් ආරම්භ කරන ලදී.

අධිකාරියේ පරමාර්ථ සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය වන මානව සම්පත ආකර්ෂණය කර ගැනීම ඉලක්ක කර ගත් බඳවා ගැනීමේ කාර්ය පටිපාටිය සඳහා අදාළ අනුමැතීන් ලබා ගැනීම වසර කිහිපයක සිට අභියෝගයක් ලෙස පැවතියකි. කෙසේ වෙතත්, මෙහි සමාලෝචනය කෙරෙන වසර තුළදී එකී බඳවා ගැනීමේ පටිපාටිය සාර්ථකව ක්‍රියාත්මක කර ඇති බව සතුටින් දැනුම් දෙමි. මෙම වසරට අදාළ තවත් ප්‍රධාන ජයග්‍රහණයක් වූයේ ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරී පනතේ 8 වගන්තියේ සඳහන් ව්‍යවස්ථාපිත අවශ්‍යතාව සපුරා ලනු පිණිස අනුකූලතාව දක්වා ඇති පස් අවුරුදු පුනර්ජනනීය බලශක්ති ප්‍රභව සංවර්ධන සැලැස්මට අදාළ කටයුතු නිම කිරීමට හැකි වීමයි. සියඹලාණ්ඩුව, පුනරින් හා මන්නාරම යන ප්‍රදේශ ආශ්‍රිත පුනර්ජනනීය බලශක්ති සංවර්ධන උද්‍යානවල කටයුතු කඩිනම් කිරීමට ද අප විසින් පියවර ගන්නා ලද අතර 2021 වසරේදී වැඩිදුර ප්‍රගතියක් ලබා ගැනීමට හැකි වන පරිදි පිහිටුවා ගෙන තිබූ ඉලක්ක සාක්ෂාත් කර ගැනීමටද හැකි විය.

රටෙහි පනවා තිබුණු සීමා හේතුවෙන් අප හට භාවිත කරන්නට හැකි වූයේ ශ්‍රී ලංකාවේ වහළ මත සවි කළ කුඩා සූර්ය බලාගාර ව්‍යාපෘතිය වෙනුවෙන් ලෝක බැංකුව විසින් අනුමත කරන ලද ඇ.ඩො. මිලියන 50ක ණය මුදලින් කොටසක් පමණි. එමෙන්ම, 2021 වසරේ පළමු අර්ධය තුළ එහි ඉතිරි වූ අරමුදල් යොදා ගැනීමටද අපි බලාපොරොත්තු වෙමු. මෙහි සමාලෝචනයට ලක් වන වසර තුළ රජයේ ගොඩනැගිලිවල වහළ මත කුඩා සූර්ය බලාගාර ස්ථාපනය කිරීම සඳහා ඉන්දියානු රජයෙන් ඇ.ඩො. මිලියන 100 ක ණයක් ශ්‍රී ලංකාවට හිමි විය.

අනුරාධපුර, මොනරාගල, හම්බන්තොට හා ත්‍රිකුණාමලය යන දිස්ත්‍රික්කවල අඩු ආදායම්ලාභී නිවාස වෙත සූර්ය විදුලි බලය ලබා දීම සඳහා එකී ණය මුදල් භාවිත කෙරෙනු ඇත.

බලශක්ති කාර්යක්ෂම ගොඩනැගිලි සඳහා වන පිළිවෙත් සංග්‍රහය සකසා මෙහි සමාලෝචිත වසර තුළදී මහජනතාවට ඒ පිළිබඳව අදහස් දැක්වීමට අවස්ථාව විවර කරන ලදී. වාණිජ මට්ටමේ ගොඩනැගිලි අංශයේ බලශක්ති පරිභෝජනයේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීමේ අරමුණින් එම පිළිවෙත් සංග්‍රහය වාණිජ ගොඩනැගිලි සඳහා අනිවාර්ය අවශ්‍යතාවක් ලෙස හඳුන්වා දෙනු ඇත. විදුලි උපකරණ සඳහා බලශක්ති ලේබල්කරණය සම්පූර්ණ කිරීමට පියවර ගන්නා ලද අතර එකී කාර්යය 2021 වන විට නිම කොට 2021 වසර මුල් භාගයේදී පළමු ලේබල් අදාළ පාර්ශ්වකරුවන් වෙත නිකුත් කිරීමට කටයුතු කරනු ලැබේ.

වසංගත තත්ත්වය හේතුවෙන් පැවැති සීමාකම් හමුවේ වුවද හැකි සෑම අවස්ථාවකදීම පාහේ ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය විවිධ පුහුණු වැඩසටහන් පැවැත්වීමට කටයුතු කළේය. ඒ අතරින් එක් වැඩසටහන් වශයෙන් ආරක්ෂක අමාත්‍යාංශය සමඟ එක්ව පවත්වන ලද පුහුණු කරුවන් පුහුණු කිරීමේ දින පහක වැඩමුළුව දැක්විය හැක. පාසල් සිසුන් හා පෙර පාසල් මට්ටම් ඉලක්ක කර ගත් බලශක්ති අධ්‍යාපන වැඩසටහන, පාසල්



බලශක්ති සමාජ වැඩසටහන, බාලදක්ෂ වැඩසටහන හා පෙර පාසල් ගුරුවරුන් පුහුණු කිරීමේ වැඩසටහන යන මේ සියල්ලම වසංගත තත්ත්වය හේතුවෙන් පාසල් වසා දැමීම නිසා අඩාළ විය. කෙසේ වෙතත්, 2021 වසරේදී නැවතත් එකී වැඩසටහන් ආශ්‍රිත සැලකිය යුතු ප්‍රගතියක් දැකීමට අපට හැකි වනු ඇතැයි අපි බලාපොරොත්තු වෙමු.

ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ජන ප්‍රජාවන් හට සහාය දැක්වීම ද වසංගතය හේතුවෙන් යටපත් වුණු අපගේ තවත් ක්‍රියාදාමයකි. 2021 වසරේදී නකල්ස් ප්‍රදේශයේ දුර බැහැර ගම්මාන කිහිපයකටම විදුලිබල පහසුකම ලබා දීමට අපි අපේක්ෂා කරමු. ඇතැම් රජයේ ආයතන සමඟ කටයුතු කිරීමේදී විවිධ හේතූන් මත අභියෝග මතු වීමට ඉඩ ඇතත්, වසර සඳහා පිහිටුවා ගෙන තිබුණු අපගේ ඉලක්ක සාක්ෂාත් කර ගැනීම උදෙසා අදාළ පාර්ශ්වකරුවන් සමඟ සම්ප්‍රයුක්තව කටයුතු කිරීමට අපි පියවර ගත්තෙමු.

අනාගත පෙරදැක්ම

2021 වසර දෙස බැලීමේදී පැහැදිලි වන කරුණක් නම් වසංගතයෙහි බලපෑම පුරෝකථනය කළ හැකි අනාගතය තුළද ඉදිරියටත් පවතිනු ඇති බවයි. රටෙහි ආර්ථිකයේ සෑම පැතිකඩක්ම පාහේ ඍණාත්මක බලපෑම්වලට හසු වනු ඇති බවක් ඉන් අදහස් වේ. කෙසේ වෙතත්, අදාළ පාර්ශ්වකරුවන් සියලුම දෙනා සමඟ එක්ව වැඩ කරමින් අපගේ මධ්‍ය හා දිගු කාලීන ඉලක්ක සාක්ෂාත් කර ගැනීම උදෙසා අප සතු විවිධ ක්‍රියාදාම සවිමත්ව ඉටු කිරීමට අපි තිර අදිටනින් කටයුතු කරන්නෙමු.

විශේෂයෙන්ම, අප සතු පුනර්ජනනීය බලශක්ති ධාරිතා ඉහළ නැංවීම තුළින් බලශක්ති සුරක්ෂිතතාව අත් කර ගැනීම මඟින් නිසැකවම අද පවතින අවිනිශ්චිත ආර්ථික පසුබිම හමුවේ ශ්‍රී ලංකාවේ ආර්ථිකය වර්ධනය කරනු ඇත. අදාළ සෑම අංශයක්ම ආශ්‍රිතව ප්‍රගතිය සනිටුහන් කිරීමට අපි ඇපකැප වන්නෙමු.

ස්තුති කිරීම්

මෙම පණිවුඩය අවසන් කිරීමට පෙරාතුව, ගරු අමාත්‍යතුමාද ඇතුළු විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ ප්‍රධාන නිලධාරීන් සියලුම දෙනා, ගරු රාජ්‍ය ඇමතිතුමා සහ ලේකම්තුමා ප්‍රමුඛ අනෙකුත් නිලධාරීන් මෙම වසර පුරාවටම ලබා දුන් අසීමිත සහයෝගය හා මගපෙන්වීම අගය කිරීමට කැමැත්තෙමි.

එමෙන්ම, වටිනා විදසුන් ලබා දීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ කළමනාකරණ මණ්ඩලය හා ප්‍රමුඛ නිලධාරීන් මෙන්ම මහත් කැපවීමකින්, ධෛර්යයකින් කටයුතු කරමින් ලබා දුන් දායකත්වය වෙනුවෙන් අධිකාරියේ සේවක මහත්ම මහත්මීන් සියලු දෙනා වෙතද කෘතඥතාව පළ කරමි.

මෙම වසර පුරාවටම අනෙකුත් පාර්ශ්වකරුවන් සියලුම දෙනා ලබා දුන් සහයෝගයද ස්තුති පූර්වකව අගයමි. මෙම වසංගත කාල සමයේ විවිධ අභියෝග ජය ගනිමින් ප්‍රගතිය කරා ගමන් කිරීමට අපි සියලු දෙනා එක් වන්ව සමත් වූයෙමු. මෙම ගමන ඉදිරියටත් ගෙන යමින් බලශක්ති තිරසාරතාව අත්කර ගැනීමේ අපගේ ඉලක්කය කරා ශ්‍රී ලංකාව රැගෙන යමු'යි මම ඇරයුම් කරමි.

රංජිත් සේපාල
සභාපති

අධ්‍යක්ෂ ජනරාල්ගේ සමාලෝචනය



පෙර කිසි දා නොවූ විරූ තරමේ අභියෝග රැසකින් ගහණ වූ වසරක අවසානය කරා අප ළඟා වී ඇති නමුදු තවත් සාර්ථක වසරක් වාර්තා කිරීමට ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය සමත් වී තිබීම සතුටට කරුණකි. ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් වශයෙන්, මෙම වසර තුළ අප ආයතනයේ කාර්යසාධනය පිළිබඳ සාරාංශයක් ලබා දෙමින් ඒ පිළිබඳ මගේ අදහස් දැක්වීමට ලැබීම මට දනවන්නේ මහත් අභිමානයකි.

2020 වසරේ වැදගත් කරුණු

ලොව පුරා දෛනික කටයුතු අඩාළ කරමින් සමස්ථ රටවල්ම එකතැන නතර කර දැමීමට සමත් වූ කොවිඩ්-19 වසංගතයේ ව්‍යාප්තිය හේතුවෙන් 2020 යනු නිසැක වශයෙන්ම මෑත ඉතිහාසයේ අතිශයින්ම දුෂ්කර කාල සමය බව කිව හැක. එතෙකුදු වුවත් නිවසේ සිට රාජකාරී කිරීමේ ක්‍රමයක් ඉතා ශීඝ්‍රයෙන් ක්‍රියාත්මක කිරීම තුළින් වසංගතය නිසා ඉස්මතු වූ අභියෝගවලට පිළියම් යෙදීමට ඉදිරිපත් වූ රජයේ ආයතන අතරින් එකක් බවට ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය පත් වීම සතුටට කරුණකි. ඒ අනුව, වසංගතය නිසා මතු වී තර්ජන හමුවේ වුව ද අපගේ නිලධාරීන්ට සිය උපරිම ශක්‍යතාවෙන් සිය දායකත්වය ලබා දීමට හැකියාව ලැබුණි. නව නාක්ෂණයෙන් නිසි ඵල නෙළා ගනිමින් සේවා බිඳ වැටීම් රහිතව හෝ අවම කර ගනිමින් රජය හා පොදු ජනතාව වෙත අපගේ සේවා අඛණ්ඩව ලබා දීමට අපට හැකියාව ලැබුණි.

අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ ''සෞභාග්‍යයේ දැක්ම'' ප්‍රතිපත්තිමය දැක්ම යටතේ 2030 වසර වන විට මෙරට පුනර්ජනනීය බලශක්ති උත්පාදනය 70% ක් දක්වා ඉහළ නැංවිය යුතු අතර එය ආරම්භයේ පැවැති 50% ඉලක්කයට වඩා ඉහළ අපේක්ෂාවකි. මෙය ප්‍රගමනාත්මක පියවරක් වන අතරම එය සාක්ෂාත් කර ගැනීම උදෙසා අප අපගේ ප්‍රයත්නයන්ද වැඩි කිරීම අවශ්‍ය බව ගම්‍ය වේ.

මෙම වසර තුළදී ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරී පනතේ 8 වගන්තියේ සඳහන් ව්‍යවස්ථාපිත අවශ්‍යතාව සපුරමින් පස් අවුරුදු පුනර්ජනනීය බලශක්ති ප්‍රභව සංවර්ධන සැලැස්මට අදාළ කටයුතු නිම කිරීමට හැකි විය.

මෙරට ඉතිහාසයේ මුල්ම වතාවට පුනර්ජනනීය ප්‍රභව ආශ්‍රයෙන් මෙගාවොට් 1,000 ක බලශක්ති උත්පාදනයක් සාක්ෂාත් කර ගැනීමට අපට හැකි වීමද ආයතනයක් වශයෙන්ම රටක් වශයෙන්ද අප විසින් අත්පත් කර ගන්නා ලද විශිෂ්ඨ ජයග්‍රහණයකි. ඒ අනුව, කුඩා ජල විදුලි බලාගාර මඟින් මෙගාවොට 423 ක් ද, සුළං බලාගාර මඟින් මෙගාවොට 178 ක් ද, වහල මත සවි කළ කුඩා සූර්ය බලාගාර මඟින් මෙගාවොට 286 ක් ද මහා පරිමාණ සූර්ය බලාගාර මඟින් මෙගාවොට 72 ක් ද උත්පාදනය කරන්නට අපට හැකි විය.

මෙහි සමාලෝචනයට ලක් කෙරෙන වසර තුළදී වසංගතය විසින් ඉස්මතු කරන ලද අතීත දුෂ්කරතා ජය ගනිමින් නැවත වරක් රටෙහි ජාතික බලශක්ති සැපයුම වෙත පුනර්ජනනීය බලශක්තිය එක් කිරීම වෙනුවෙන් අපගේ උපරිම ශක්ති ප්‍රමාණයෙන් දායක වීමට අපට හැකි විය. වසංගතය නිසා බරපතල සීමාවන් මතු වුවද, ව්‍යාපෘති සියල්ලෙහිම ප්‍රගතිය සමීපව නිරීක්ෂණය කරමින් ඒ අතරින් ඇතැම් ව්‍යාපෘතිවල වැඩ නියමිත කාලය තුළ අවසන් කිරීමටද අපි සමත් වූයෙමු. 2019 වසරේදී වහල මත සවි කළ කුඩා සූර්ය බලාගාර මඟින් මෙගාවොට් 200 ක බලශක්ති ධාරිතාවක් උත්පාදනය කළ ද මෙහි සමාලෝචනයට ලක් වන වසර තුළදී එය මෙගාවොට් 338 දක්වා ඉහළ නැංවීමට අපට හැකියාව ලැබුණි. එපමණක්ද නොව, වසර තුළදී සූර්ය සේවා සැපයුම් සමාගම් 74 ක් අලුතින් ස්ථාපනය කරන්නට යෙදුණු අතර, දැනටමත් එම සේවා ලබා ගෙන සිටින සමාගම් 200 කට අධික සංඛ්‍යාවක් ස්වකීය ලියාපදිංචිය දීර්ඝ කරන ලදී. ඒ අනුව, ශ්‍රී ලංකාවේ සූර්ය බලශක්තිය පරිහරණය කෙරෙන සමාගම් මුළු එකතුව 280 ක් බවට පත් විය. එම සමාගම්වල සේවයේ නියුතු ඉංජිනේරුවන් හා අනෙකුත් තාක්ෂණික භූමිකා දරන සේවකයන් ඉලක්ක කර ගනිමින් පුහුණු වැඩසටහන් රැසක්ම පවත්වන ලද අතර වසංගතය හේතුවෙන් භෞතික වශයෙන් ඔවුන් හමු වීමට නොහැකි වූ අවස්ථාවලදී අන්තර්ජාලය පාදකව එකී වැඩසටහන් පවත්වන ලදී.

මෙරට පළමු මහා පරිමාණ සූර්ය බලශක්ති උද්‍යානය වන සියඹලාණ්ඩුව මෙගාවොට් 100 බලශක්ති උද්‍යානයේ සංවර්ධන කටයුතු ද සිදු කරන ලද අතර පාරිසරික බලපෑම් තක්සේරුව ද ඇතුළත්ව ඒ සඳහා අවශ්‍ය සියලු අනුමැතීන් ලබා ගන්නා ලදී.

ආසියානු සංවර්ධන බැංකුවේ හා ලෝක බැංකුවේ ජාත්‍යන්තර මූල්‍ය සංවිධානය (IFC) වෙතින් ලබා සහාය ඇතිව පුනරීන් බලශක්ති උද්‍යාන ව්‍යාපෘතියේ වැඩ මූලික සම්ක්ෂණ වැඩ කටයුතු නිම කරන ලද අතර ඒ සඳහා ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලියට අදාළ ක්‍රියාකාරකම්ද ආරම්භ කරන ලදී. සුළං බලශක්ති ව්‍යාපෘතිවල ප්‍රධාන අවශ්‍යතාවක් වන 'කුරුලු අධ්‍යයනයද' පවත්වන ලද අතර පාරිසරික හා සමාජ බලපෑම් තක්සේරුවක් සිදු කිරීම සඳහා කටයුතු සම්පාදනය කරන ලදී. එසේම, ලංකා විදුලිබල මණ්ඩලය විසින් පළමු මෙගාවොට් 100 ව්‍යාපෘතිය ආරම්භ කර ඇති මන්නාරම ප්‍රදේශය ආශ්‍රිතව සුළං බලයෙන් බලශක්තිය උත්පාදනය කිරීමට ඇති හැකියාව සොයා බැලීමේ කටයුතුද අප විසින් ඇරඹුවෙමු. මන්නාරම් දූපතේ මෙගාවොට් 100 ධාරිතාවක් සහිත තවත් සුළං බලාගාරයක් සංවර්ධනය කිරීම සඳහා ද පියවර ගන්නා ලදී. දැනටමත් ආරම්භ කර ඇති ව්‍යාපෘති වෙනුවෙන් පූර්ව ශක්‍යතා අධ්‍යයනයක්, පාරිසරික හා සමාජ බලපෑම් තක්සේරුවක්, සුළං මිනුම්ගත කිරීමේ වැඩසටහන් හා ඉඩම් අත්කර ගැනීමේ වෙනුවෙන්ද කටයුතු සම්පාදනය කරන ලදී.

2025 වසර වන විට වහල මත සවි කළ කුඩා සූර්ය බලාගාර ධාරිතාව මෙගාවොට් 1,000 දක්වා ඉහළ නැංවීමේ ඉලක්කය සාක්ෂාත් කර ගනු පිණිස ඉන්දියාවේ එක්සිම් බැංකුවෙන් ලද ඇ.ඩො. 100 ක ණය මුදල යොදා ගනිමින් සූර්ය බල සංග්‍රාමය නමැති බලශක්ති ව්‍යාපෘතිය ශක්තිමත් කරන ලදී. අනුරාධපුර, මොනරාගල, හම්බන්තොට හා ත්‍රිකුණාමලය යන දිස්ත්‍රික්කවල අඩු ආදායම්ලාභී නිවාස වෙත සූර්ය විදුලි බලය ලබා දීම සඳහා එකී ණය මුදල භාවිත කෙරෙනු ඇත. පළමු අක්වෙරළ සුළං බලශක්ති මාර්ග සිතියම සකස් කිරීම ද අප ආරම්භ කළ අතර ඒ වෙනුවෙන් එක්සත් රාජධානිය බලා ගොස් අවශ්‍ය තාක්ෂණික සහාය ලබා ගැනීම වෙනුවෙන් ලෝක බැංකුව හා සාකච්ඡා පැවැත්වීමට මට අවස්ථාව ලැබුණි. එම ව්‍යාපෘතිය සඳහා අදාළ භෞතික අධ්‍යයන සිදු කොට මාර්ග සිතියම සකස් කරනු පිණිස මේ වන විටත් ලෝක බැංකුව විසින් උපදේශකයින් පත් කර ඇත.

ඉල්ලුම් කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් බැලූ කල මෙහි සමාලෝචිත වසර තුළ නිසි නියාමන මැදහත්වීම් ලබා දීම උදෙසා විවිධ ක්‍රියාකාරකම් දියත් කරන ලද අතර, කාර්මික, ගෘහස්ථ හා වාණිජ අංශවල බලශක්ති කාර්යක්ෂමතාව ඉහළ නැංවීම අරමුණු කර ගත් දැනුම්වත්භාවය ඉහළ නැංවීමේ දායකත්වයන්ද අප ලබා දී ඇත.

ඒ අනුව, සිවිලිම් විදුලි පංකා සහ ශීතකරණ සඳහා බලශක්ති ලේබල්කරණ වැඩසටහන සම්පූර්ණ කෙරුණු අතර LED බල්බ සඳහා බලශක්ති ලේබල්කරණය කිරීමේ වැඩසටහන ගැසට් කරන ලදී. එසේම, රූපවාහිනී යන්ත්‍ර, රයිස් කුකර්, ජල පොම්ප හා LED බල්බ ආදී උපකරණ සඳහා බලශක්ති ලේබල්කරණ ප්‍රමිතීන්ද සැකසීම අරඹන ලදී. ශ්‍රී ලංකාවේ බලශක්ති අංශයේ කාර්යසාධනය පිළිබඳ වාර්ෂික විශ්ලේෂණය වන ශ්‍රී ලංකා බලශක්ති තුලනය වාර්තාව ද 2018 වසර සඳහා පළ කරන ලදී.

ඉදිරි ගමන

වසංගත තත්ත්වයේ බලපෑම ඉදිරි මාස හා වසර කිහිපය පුරාවට ද බලපැවැත්වෙනු ඇතැයි අපේක්ෂිත පසුබිමක් තුළ ආර්ථිකය වෙත ද තවදුරටත් ඍණාත්මක බලපෑම් එල්ල වනු ඇත. එසේම, එම තත්ත්වයන් සමනය කර ගනිමින් යථා තත්ත්වයට පත්ව ඉදිරියට යාම වෙනුවෙන් සෑම දෙනාම එකට එක් වූ ප්‍රයත්නයක් දැරීම අවශ්‍ය වනු ඇත. 2030 වසර වන විට 70% ක පුනර්ජනනීය බලශක්ති ධාරිතාවක් ඇති කර ගැනීමේ දුෂ්කර එහෙත් ළඟා කර ගත හැකි ඉලක්කය සමඟින් අපගේ සියලුම ක්‍රියාකාරකම් එය සාක්ෂාත් කර ගැනීම වෙනුවෙන් කේන්ද්‍රගත කිරීමට අපි යොමු වන්නෙමු. එහිදී මහා පරිමාණයේ ව්‍යාපෘති සියල්ලෙන්ම ඉතා වැදගත් දායකත්වයක් ලැබෙන අතරම, එම ඉලක්කය සාක්ෂාත් කර ගැනීම උදෙසා අපගේ ප්‍රගතිය කඩිනම් කර ගැනීමට අමාත්‍යාංශය හා ලංකා විදුලිබල මණ්ඩලය වැනි අපගේ ප්‍රධාන පාර්ශ්වකරුවන්ගේ සමීප සහයෝගය ද අපට අවශ්‍ය වනු ඇත.

ස්තුති කිරීම්

මෙම අභියෝගාත්මක වසර පුරාවට අප වෙත ලබා දුන් මහඟු සහයෝගය වෙනුවෙන් බලශක්ති අමාත්‍යතුමා, සූර්ය බල, සුළං හා ජල විදුලි ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා සහ එකී අමාත්‍යාංශවල ලේකම්වරුන් ඇතුළු අනෙකුත් නිලධාරීන් වෙත බෙහෙවින් ස්තුතිවන්ත වෙමි. එමෙන්ම, වටිනා විදසුන් ලබා දීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය හා ප්‍රමුඛ නිලධාරීන් මෙන්ම මහත් කැපවීමකින්, ධෛර්යයකින් කටයුතු කරමින් ලබා දුන් දායකත්වය වෙනුවෙන් අධිකාරියේ සේවක මහත්ම මහත්මීන් සියලු දෙනා වෙතද කෘතඥතාව පළ කරමි. ආසියානු සංවර්ධන බැංකුව, ලෝක බැංකුව, එක්සිම් බැංකුව හා අනෙකුත් එවැනි ආයතන වෙතින් අපට ලබා දුන් වටිනා සහයෝගය වෙනුවෙන් ද ස්තුතිය පළ කරමි. අප වෙත අඛණ්ඩව සහයෝගය ලබා දීම වෙනුවෙන් අපගේ අනෙකුත් පාර්ශ්වකරුවන් වෙතද කෘතඥතාව පළ කිරීමට මම මෙය අවස්ථාවක් කර ගනිමි. වසංගත තත්ත්වය විසින් මතු කරන ලද අනපේක්ෂිත අභියෝග සාර්ථකව ජය ගැනීම වෙනුවෙන් අප සියලු දෙනාම එක් වන්ව දායකත්වය ලබා දුන් මෙම වසර වනාහි කණ්ඩායමක් වශයෙන් එක්ව වැඩ කිරීමේ බලය මැනවින් ප්‍රකට කළ වසරකි. මෙම සාර්ථකත්වයේ ප්‍රතිඵල ඉදිරි කාලයේදී ද අපගේ ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා අභිප්‍රේරණයෙන් වැඩ කිරීමට අප දිරිමත් කරනු ඇති බව මට විශ්වාසය.

ආචාර්ය අසංක රොද්‍රිගු
අධ්‍යක්ෂ ජනරාල්

කළමනාකරණ මණ්ඩලය

වසන්තා පෙරේරා මිය
විදුලිබල අමාත්‍යාංශයේ ලේකම්

චින්තක එස්. ලොකුහෙට්ටි මහතා
ජනවාරි සිට අගෝස්තු දක්වා

ඊ. ඒ. ආර්. රේණුකා මිය
අතිරේක ලේකම් - සංවර්ධන
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය

අංජලිකා කේ ගුණසේකර මිය
අධ්‍යක්ෂිකා, ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව
මුදල් අමාත්‍යාංශය

දමිත කුමාරසිංහ මහතා
අධ්‍යක්ෂ ජනරාල්
ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිසම

රෝහණ තල්පාවිල මහතා
පත් කරන ලද සාමාජික

භූපති කහතුඩුව මහතා
පත් කරන ලද සාමාජික

ලක්ෂ්මන් සිල්වා මහතා
පත් කරන ලද සාමාජික (ජූනි සිට)

කුලනි එච්. ඩබ්. කරුණාරත්න මිය
අධ්‍යක්ෂ (පරිසර සැලසුම්කරණ හා ආර්ථික), පරිසර අමාත්‍යාංශය

ඒ. එම්. ආර්. ජේ. කේ. ජයසිංහ මහතා
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පරිපාලන), ප්‍රවාහන අමාත්‍යාංශය

ජානක අඹගහවත්ත මහතා

ලතීශා ලියනගේ මිය
සහකාර ලේකම් (ප්‍රතිපත්ති හා ව්‍යාපෘති ඇගයීම්),
කෘෂිකර්ම අමාත්‍යාංශය

රවීන්ද්‍ර හේවාවිතාරණ මහතා
ලේකම්
වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය

කේ. ඩී. චිත්‍රපාල මහතා
ජනවාරි සිට ජූලි දක්වා

නිශාද් උපේන්ද්‍ර මහතා
පත් කරන ලද සාමාජික (මැයි සිට)

චන්ද්‍රරත්න විතානගේ මහතා
ජ්‍යෙෂ්ඨ සහකාර මහ ලේකම්, ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලය (ජූනි සිට)

ඩබ්. ජේ. එල්. එස්. ප්‍රනාන්දු මහතා
පත් කරන ලද සාමාජික (ජූනි සිට)
ශ්‍රී ලංකා බලශක්ති කළමනාකරුවන්ගේ සංගමය

නයනා නාතවිතාරණ මිය
සහකාර ලේකම්, රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

විගණන හා කළමනාකරණ කමිටුව

සාමාජිකයන්:

අංජලිකා කේ ගුණසේකර මිය
අධ්‍යක්ෂිකා, ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව,
මුදල් අමාත්‍යාංශය

නයනා නාතවිතාරණ මිය
සහකාර ලේකම්,
රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

භූපති කහතුඩුව මහතා
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික, ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය

අධීක්ෂකයන්:

එච්. ඒ. ඩී. චාන්දනී මිය
විගණන අධිකාරී, ජාතික විගණන කාර්යාලය

බී. ඒ. ඩී. අබේවර්ධන මිය
ප්‍රධාන අභ්‍යන්තර විගණක,
විදුලිබල අමාත්‍යාංශය

ආයතනික පාලනය

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ කළමනාකරණ මණ්ඩලය කටයුතු කරනු ලබන්නේ සමානාත්මතාව, සාධාරණභාවය, අපක්ෂග්‍රාහී බව, විනිවිදභාවය සහ වගවීම යන මූලධර්ම පහ පදනම් කරගෙන වේ. අපගේ මෙහෙයුම්වල පදනම ලෙස පවතින්නේ එකී මූලධර්ම වන හෙයින් අප අධිකාරිය සිය පාර්ශ්වකරුවන් සියලුම දෙනා සමඟ සවිමත් සබඳතා ගොඩනගා ගනිමින් සුනිත්‍ය බලශක්ති සංවර්ධනයට හිතකර පරිසරයක් බිහි කිරීමෙහි ප්‍රෝත්සාහී වෙයි. ශ්‍රී ලාංකිකයන් සියලුම දෙනාගේත්, සමස්ථ රාජ්‍යයේත් අභිවෘද්ධිය පිණිස හේතු වන ආචාර ධාර්මික ප්‍රමිතීන්ට අනුකූලව අපගේ ක්‍රියාකාරකම් ඉටු කරනු ලැබේ. රජයේ ප්‍රතිපත්තිවලට අනුකූල වන නිවැරදි භූමිකා, ව්‍යුහයන් හා තොරතුරුවල සහාය එකී දායකත්වය වෙත නිරතුරුව ලැබේ.

කළමනාකරණ මණ්ඩලය

2007 අංක 35 දරන ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරී පනත ප්‍රකාරව පවරා ඇති රාජකාරීන් ඉටු කිරීමේ අවසන් වගකීම හා වගවීම කළමනාකරණ මණ්ඩලය වෙත පැවරී ඇත. එයට නායකත්වය දෙනු ලබන්නේ විෂය භාර අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබෙන සභාපතිවරයෙකු/වරියක විසිනි.

වගකීම

පනතෙහි දක්වා ඇති අරමුණු සාක්ෂාත් කර ගැනීම, පනත මඟින් පවරා ඇති බලතල ක්‍රියාවට නැංවීම, අභ්‍යන්තර පාලනයන් නිසි පරිදි ක්‍රියාත්මක කරවීම සහ ලබා දී ඇති මූල්‍ය තොරතුරුවල ඒකාබද්ධතාව සම්බන්ධයෙන් අවසන් වගකීම කළමනාකරණ මණ්ඩලය විසින් දරනු ලැබේ. අධිකාරියේ කටයුතු මෙහෙයවනු ලබන්නේ එහි අධ්‍යක්ෂ ජනරාල් විසින් වන අතර අධ්‍යක්ෂ ජනරාල් යනු කළමනාකරණ මණ්ඩලයේ පොදු නියමය හා පාලනය යටතේ ක්‍රියා කරන ප්‍රධාන විධායක නිලධාරී ද වේ. මූල්‍යමය පැතිකඩ පිළිබඳ අධීක්ෂණයන් කරනු පිණිස විගණන හා කළමනාකරණ කමිටුව නම් වූ උප කමිටුවක සහාය කළමනාකරණ මණ්ඩලය වෙත ලැබේ. තාක්ෂණිකමය වශයෙන් අධික සංකීර්ණතාවක් උසුළන හා කළමනාකරණ මණ්ඩලයේ පරාසයෙන් පිටත පවතින කාරණා සම්බන්ධයෙන් තීරණ ගැනීම පිණිස අවශ්‍යතා ඉස්මතු වූ අවස්ථාවලදී බාහිර උපදේශන කමිටුවල සහාය ද කළමනාකරණ මණ්ඩලය වෙත හිමි වේ.

අධිකාරියට අදාළ ප්‍රසම්පාදන කටයුතු සියල්ලම සිදු කෙරෙනුයේ රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට දැඩිව අනුකූලතාව දක්වමිනි. සිදු කරනු ලබන ප්‍රසම්පාදනයෙහි වටිනාකම මත පදනම්ව ස්වාධීන තාක්ෂණික ඇගයීම් කමිටුවල මඟපෙන්වීම යටතේ අධිකාරියේ නිලධාරීන් විසින් එකී කටයුතු ඉටු කරනු ලැබේ.

සංයුතිය

කළමනාකරණ මණ්ඩලය සාමාජිකයන් 21 කින් සමන්විත වන අතර ඒ අතරින් 12 ක් නිල බලයෙන් පත්වන සාමාජිකයන් වන අතර සභාපතිද ඇතුළුව පත් කරන ලද සාමාජිකයන් 9 දෙනෙකු සිටී.

කළමනාකරණ මණ්ඩල රැස්වීම්

යටත් පිරිසෙයින් මාසයකට එක් වරක් හෝ රැස් වන පරිදි කළමනාකරණ මණ්ඩල රැස්වීම් සංවිධානය කෙරේ. මෙම රැස්වීම්වලදී කළමනාකරණ මණ්ඩලය විසින් අධිකාරියේ උපායමාර්ගික දිශානතිය නියම කිරීම, සියලුම ක්‍රියාකාරකම්වල ප්‍රගතිය හා කාර්යසාධනය සමාලෝචනය කිරීම, සහ ප්‍රත්‍යාවර්තන හා ප්‍රාග්ධනය වියදම් වැඩසටහන් සම්බන්ධ තීරණ ගැනීම සිදු කරනු ලබයි. අධිකාරියේ පරමාර්ථ සාක්ෂාත් කර ගනු පිණිස එහි නිලධාරීන් හට කළමනාකරණ මණ්ඩලයේ සලකා බැලීම පිණිස සිය යෝජනා ඉදිරිපත් කිරීමට අවස්ථාවක්ද මෙම රැස්වීම් මඟින් ලබා දේ.

සෑම රැස්වීමකටම පෙරාතුව කළමනාකරණ මණ්ඩල සාමාජිකයන් හට අදාළ කාරණා සම්බන්ධ ලේඛන ලබා දෙනු ලැබේ. 2020 වසර තුළ කළමනාකරණ මණ්ඩලය මෙම රැස්වීම් සඳහා සහභාගී වීමට අදාළ විස්තර පහත දැක්වේ:

සංඛ්‍යාව	රැස්වීම් දිනය	සහභාගීත්වය
1	2020 පෙබ. 11	12
2	2020 මැයි 21	15
3	2020 ජූනි 18	18
4	2020 ජූලි 28	18
5	2020 අගෝ. 25	17
6	2020 සැප්. 22	16
7	2020 නොවැ. 30	16
8	2020 දෙසැ. 15	16

නෛතික අවශ්‍යතා වෙත අනුකූලතාව දැක්වීම

පනතෙහි විධිවිධාන සහ රජය විසින් කලින් කලට පනවනු ලැබෙන නීති රීති, රෙගුලාසි හා මාර්ගෝපදේශවලට අධිකාරිය අනුකූලතාව දක්වන බව සහතික කිරීමට කළමනාකරණ මණ්ඩලය සෑම ප්‍රයත්නයක්ම දරයි. අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කොට ඇත්තේ ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිතිවලට හා 1971 අංක 38 දරන පමුදල් පනතේ අවශ්‍යතාවලට අනුකූලව බවට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සහතික කරයි.

අවදානම් කළමනාකරණය

අවදානම් කළමනාකරණය යනු මනා කළමනාකරණ පරිචයන් හා පාලනයෙහි සංගෘහිත අංගයක් ලෙස පිළි ගනිමින් ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් තමන්ට බලපාන පොදු අවදානම් මෙන්ම සුනිත්‍ය බලශක්තියට අදාළ ඇතැම් අතිරේක අවදානම්ද හඳුනා ගෙන තිබේ. මෙම සුවිශේෂී අවදානම් ප්‍රධාන වශයෙන්ම බලශක්ති කාර්යක්ෂමතාව ඉහළ නැංවීම හා පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය සහ එය ක්‍රියාත්මක වන ප්‍රතිපත්තිමය පරිසරය හා සබැඳේ. මේ නිසා, සවිමත් මූල්‍ය හා මෙහෙයුම් පාලන පද්ධති පිහිටුවා ඇති බව සහතික කරනු පිණිස අධ්‍යක්ෂ මණ්ඩලය, ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වයේද සහාය ඇතිව අවදානම් කළමනාකරණය වෙත විශේෂ අවධානයක් යොමු කරයි. අභ්‍යන්තර විගණකවරුන් හා කළමනාකරණ කණ්ඩායම ද එකී පද්ධතිවල කාර්යක්ෂමතාව කලින් කලට සමාලෝචනය කරයි.

අවදානම් සංස්කෘතිය

කළමනාකරණ මණ්ඩලය විසින් අධිකාරියේ තත්ත්වය මනාව හඳුනා ගෙන ඇති අතර අවදානම් කළමනාකරණය සම්බන්ධයෙන් පැහැදිලි හා ඒකීය ආකෘතියක් පවත්වා ගෙන ඇත. කළමනාකාරීත්වය ආචාර ධාර්මික මූලධර්ම වෙත දක්වන කැපවීම තුළ තීරණ ගැනීමේදී පාර්ශ්වකරුවන් සියලුම දෙනාගේ සුභසිද්ධිය සැලකිල්ලට ගෙන ඇත. නායකත්වයට අනුකූල වන පරිදි අධිකාරියේ කාර්ය මණ්ඩලයද එවැනි මූලධර්මවල වැදගත්කම හඳුනා ගෙන ඒවා අනුගමනය කිරීමට පියවර ගනී.

අවදානම් හඳුනා ගැනීම

අධිකාරිය අවදානම් හඳුනා ගැනීමේදී බාහිර පරිසරය සමීපව නිරීක්ෂණය කරයි. ඊට වැඩිමනත් වශයෙන්, එකී අවදානම් වර්ගීකරණය කිරීමටද පියවර ගන්නා අතර ඒ අතරින් ඇතැම් අවදානම් ගෝලීය බලශක්ති ක්ෂේත්‍රයේ පොදු ඒවා වන අතර ඇතැම් අවදානම් අප රටටම සුවිශේෂී ඒවා වේ. 2019 වසරේදී ශ්‍රී ලංකා ජාතික බලශක්ති ප්‍රතිපත්තිය හා උපායමාර්ග සම්පාදනය කිරීමට දායක වෙමින් අධිකාරිය විසින් සිය වැඩසටහන් වෙත බලපෑම් එල්ල කරන ප්‍රතිපත්තිමය අවදානම් අවම කරමින් ඉහත ප්‍රතිපත්තියට අනුකූලව වැඩසටහන් හඳුනා ගන්නා ලදි.

අවදානම් කළමනාකරණය

අධිකාරිය පුනර්ජනනීය බලශක්ති ප්‍රභව සංවර්ධනය හා බලශක්තිය අපතේ යාම අඩු කිරීම මූලික අවධානයක් යොමු කළ යුතු ක්ෂේත්‍ර ලෙස හඳුනා ගනී. පොසිල ඉන්ධන මිල අඩු වීම තුලින් පුනර්ජනනීය බලශක්තිය වෙනුවට යොමු විය හැකි ලාභදායී විකල්පයක් බවට පත් විය හැකි නිසා මෙන්ම එහි ප්‍රතිඵලයක් ලෙස බලශක්ති පිරිවැය ආශ්‍රිත විෂමතා ඇති වීම හේතුවෙන් පාරිභෝගිකයන් අතින් බලශක්තිය අපතේ යාම වැඩි වීමට මඟ පැදිය හැකි හෙයින් එවැනි ප්‍රධාන අවදානම් ක්ෂේත්‍ර පුරෝකථනය කොට අධීක්ෂණය කරයි.

ඒ අනුව, පොසිල ඉන්ධන මිල පහත බැස ඇති තත්ත්වයකදී පවා සුනිත්‍ය බලශක්තියට ඇති ඉල්ලුම බිඳ නොවැටෙන පරිදි සුනිත්‍ය බලශක්ති වෙළෙඳපොල හැකි අවම පිරිවැය තත්ත්වයක් යටතේ පවත්වා ගත හැකි පරිදි අවදානම් කළමනාකරණ උපායමාර්ගයබ් පවත්වා ගැනීමට ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය පියවර ගනියි.

වහළ මත සවි කළ කුඩා සූර්ය පද්ධති කර්මාන්තය තුළ තරගකාරීත්වයක් ඇති වීමට දිරිමත් කිරීමක් වශයෙන් අඳුතින් ආරම්භ කරන සමාගම් විශාල ප්‍රමාණයකට සේවා සැපයුම්කරුවන් බවට පත් වීමට ඉඩ සලසමින් සූර්ය බලශක්ති කර්මාන්තයද පෝෂණය කරනු ලැබේ. එපරිද්දෙන්ම, මෙම කර්මාන්තයට සහාය දක්වමින් බලශක්ති කාර්යක්ෂම සේවාවන් ලබා දීමට එම සමාගම්වලට හැකි වන පරිදි අවශ්‍ය සහයෝගය ඒවාට ලබා දෙනු ලැබේ.

පාරිභෝගිකයන්ට දරන්නට සිදු වන ගාස්තු ඉහළ යාම හා බලශක්ති උත්පාදන වියදම් ඉහළ යාම හේතුවෙන් විදුලිබල කර්මාන්තය වෙත සැලකිය යුතු තරමේ අලාභ සිදු වේ. එවැනි හේතූන් මත පෙර නොවූ විරූ තරමේ අවදානම් ඉස්මතු කරමින් පුනර්ජනනීය බලශක්ති කර්මාන්තයට ඉහළ බලපෑමක් එල්ල වීමේ වැඩි ඉඩකඩක්ද පවතී.

සම්පත් අහිමි වීමේ අවදානම

ඉඩම් භාවිත කිරීමේ ක්‍රම හා මානව ක්‍රියාකාරකම් හේතුවෙන් මෙරට වටිනා පුනර්ජනනීය බලශක්ති ප්‍රභව වෙත බරපතල බලපෑමක් එල්ල වේ. ජනාවාස ව්‍යාප්තියත් සමඟම ඵලදායී සුළං බලශක්ති වැඩබිම් විශාල ප්‍රමාණයක් අහිමි වීමේ තර්ජනයක්ද පවතී. එසේම, වනාන්තර හෙළි කිරීම, වාණිජ මටටිමේ වගා බිම් ව්‍යාප්තිය හා කාලගුණික වෙනස්වීම්වල ඍජු ප්‍රතිඵලයක් ලෙස වර්ෂාපතන රටාවන් වෙනස් වීම ආදී හේතු නිසා අතීතයේදී විශිෂ්ඨ ප්‍රතිඵල උදා කළ ජල ප්‍රවාහ ලක්ෂණ ප්‍රකට කළ මනා ජල බලශක්ති සම්පත්ද විශාල ලෙස වෙනස් වෙමින් පවතී. පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘතිවලට එරෙහිව ඇතැම් සිවිල් සමාජ සංවිධාන විසින් ගන්නා ලද නෛතික ක්‍රියාමාර්ග ඉහළ යාම ද එකී ස්වභාවික හේතූන්ට අමතරව බලපෑම් එල්ල කරයි. ඵලදායී පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී අධික ප්‍රමාදයක් සිදු කරමින් ව්‍යාපෘති සංවර්ධකයන්ට එදිරිව නඩු කිහිපයක්ම ගොනු කරන ලද අතර 2020 දී ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය ද එවැනි සිද්ධි 12ක වගඋත්තරකරුවෙකු බවට පත් විය.

බලශක්ති සේවාවන්හි මිල අඩු වීමේ අවදානම

2014 වසරේදී විදුලි ගාස්තු 25% කින් පහත බැසීම හේතුවෙන් ආයතනික මටටමේ පාරිභෝගිකයන්ගේ උනන්දුව අඩු වීම නිසා බලශක්ති සේවා කර්මාන්තය වෙත බලපෑම් එල්ල විය. කර්මාන්ත අංශයේ ආයතන සඳහා දිවා කාලයේදී ඉතා අඩු විදුලි ගාස්තු අදාළ වූ අතර එය හේතුවෙන් නිෂ්පාදන පිරිවැය පහත බසින ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස බලශක්තිය අපතේ යාම වළක්වා ගැනීමේ උනන්දුව අඩු වූ අතර බලශක්ති සේවා අංශය තුළ සැලකිය යුතු මටටමේ වෙළෙඳපොල හැකිළීමක් දක්නට ලැබුණි.

එසේම, කාර්මික තාපන අවශ්‍යතා සඳහා යොදා ගත් පොසිල ඉන්ධන මිල ද අඩු මටටමක පැවතුණි. කෙසේ වෙතත්, ආයතනික පරිශීලකයන් සීමිත ප්‍රමාණයක් මහා පරිමාණ බලශක්ති කාර්යක්ෂමතා ව්‍යාපෘති වෙත යොමු වෙමින් සිය තිරසාර ඉලක්ක හඹා ගිය අතර කාබන් පියසටහන අඩු කරමින් මෙහෙයුම් පිරිවැය අඩු කර ගැනීමට සැලකිය යුතු තරමේ ප්‍රතිලාභ එමගින් හිමි විය.

අවදානම් අධීක්ෂණය හා සමාලෝචනය

අවදානම් පාලනයන් ආශ්‍රිත දුර්වලතා හඳුනා ගෙන අවශ්‍ය අභ්‍යන්තර හා බාහිර වෙනස්කම් සිදු කිරීම උදෙසා අධිකාරියේ අවදානම් කළමනාකරණ විධිවිධාන කලින් කලට තක්සේරු කරනු ලැබේ.

අඛණ්ඩ අධීක්ෂණ හෝ වෙන වෙනම සිදු කරන ඇගයීම් සම්බන්ධයෙන් අවසන් වශකීම ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය හා විගණන හා කළමනාකරණ කමිටුව වෙත පැවරෙන අතර, අභ්‍යන්තර විගණක විසින් අධිකාරියේ විවිධ සේවා සම්පාදන අංශ වෙත අවධානය යොමු කරමින් නිරන්තර පදනමක් මත පද්ධති පාදක විගණනයන් සිදු කරනු ලැබේ. අවදානම් කළමනාකරණ ක්‍රියාවලියෙහි කාර්යක්ෂමතාව වාර්ෂිකව සමාලෝචනය කරනු ලැබෙන අතර පවතින ක්‍රියාවලි සඳහා අවශ්‍ය වෙනස්කම් ඒ අනුව සිදු කෙරේ.





කාර්යසාධන සමාලෝචනය

කාර්යසාධන සමාලෝචනය

2020 දී ක්‍රියාත්මක කළ වැඩසටහන්වල කාර්යසාධනය

2019 වසරේදී ගැසට් කරන ලද 'ජාතික බලශක්ති ප්‍රතිපත්තිය හා උපායමාර්ග' හරහා ඉහළ අවධානයක් යොමු කෙරෙන කාරණා වශයෙන් බලශක්ති සුරක්ෂිතතාව හා තිරසාරව සඳහන් කළ හැක. ඒ අනුව, තිරසාර ක්‍රමවේද ඔස්සේ පහසුවෙන් ලබා ගත හැකි හා පිරිසිදු බලශක්තිය ලබා දීම වැදගත් අවශ්‍යතාවක් ලෙස හඳුනා ගැනුණු අතර එම නිශ්චිත සන්දර්භය මත පිහිටා මෙහි සමාලෝචිත වසර තුළ අදාළ වැඩසටහන් සැලසුම් කරන ලදී. එමෙන්ම, ජාතික හරිතාගාර වායු විමෝචනය අඩු කිරීමේ ඉලක්ක වෙත යොමු වීමට කරන්නට ලැබීම වැදගත් සන්ධිස්ථානයක් වූ අතර එහි ප්‍රමුඛ භූමිකාවක් බලශක්ති ක්ෂේත්‍රයට හිමි වේ. ඒ අනුව, විශේෂයෙන්ම එළැඹෙන දශකය වෙනුවෙන් සුනිත්‍ය බලශක්ති සංවර්ධන ක්‍රියාකාරකම් වෙත ඉහළ කඩිනම් භාවයක් ලබා දිය යුතු වේ.

ඒ සියල්ලටමත් වඩා, සුනිත්‍ය බලශක්ති වෙත රජයෙන් ඉතා ඉහළ අවධානයක් ලැබීමත් සමගම මෙම විෂය බලශක්ති අංශයේ කටයුතු අතර පෙරමුණට පත් විය. 2020 වසරේදී වැඩසටහන් ක්‍රියාත්මක කරන ලද්දේ මෙම විෂයට අදාළ ප්‍රධානතම ජාතික ආයතනය වශයෙන් ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ වැඩසටහන් ක්‍රියාත්මක කෙරෙන ප්‍රධාන කාර්ය පරාසයට සබැඳි පසුබිමක් තුළය.

2007 අංක 35 දරන ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරී පනත මඟින් ආයතනයේ කාර්ය රාමු නිශ්චය කර දැක්වෙන අතර සියලුම ආකාරවල සුනිත්‍ය බලශක්තිය සංවර්ධනය කිරීම, සැම අංශයක් තුළම බලශක්ති කාර්යක්ෂමතාව ඉහළ නැංවීම, බලශක්ති සුනිත්‍යතාවට හිතකර ප්‍රතිපත්ති සම්පාදනය කිරීම, බලශක්ති තොරතුරු කළමනාකරණය හා සුනිත්‍ය බලශක්ති අංශය වෙනුවෙන් අවශ්‍ය ආයෝජන සිදු කෙරෙන බව සහතික කිරීම ආදිය ඊට ඇතුළත් වේ. ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ වැඩසටහන් දියත් කරන ලද්දේ එකී පුළුල් අවධානය සහිතව වූ අතර 2025 වසර කාල ක්ෂිතිජයක් ලෙස ගෙන මධ්‍ය කාලීන ඉලක්ක අනුගමනය කරමින් එම ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කර ඇත.

- මධ්‍යම විදුලිබල ජනන ජාලය තුළ 25% ක් පුනර්ජනනීය බලශක්ති උත්පාදනයක් ලෙස පවත්වා ගැනීම
- වහල මත සවි කළ කුඩා සූර්ය බලාගාර ධාරිතාව මෙ. වො. 1,000 දක්වා ඉහළ නැංවීම
- ගි.වො. 1,500 ක විදුලිබල ඉතිරියක් සාක්ෂාත් කර ගැනීම

පහත දැක්වෙන පරිදි සැපයුම් අංශයේ කළමනාකරණ හා ඉල්ලුම් අංශයේ කළමනාකරණ ක්ෂේත්‍ර ආශ්‍රිතව වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

(A) සැපයුම් අංශ කළමනාකරණය

• පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය

අරමුණ: ජාතික පුනර්ජනනීය බලශක්ති ඉලක්ක සාක්ෂාත් කරනු පිණිස පුනර්ජනනීය බලශක්ති සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට සෘජුව දායක වීම.

• උපායමාර්ගය

අරමුණ: මහා පරිමාණ පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘතිවලදී පුනර්ජනනීය බලශක්ති සංවර්ධන සැලසුම්කරණයන් හා ආරම්භක ව්‍යාපෘති සංවර්ධනයන් සිදු කිරීම.

(B) ඉල්ලුම් අංශ කළමනාකරණය

• බලශක්ති කාර්යක්ෂමතාව ඉහළ නැංවීම හා සංරක්ෂණය

අරමුණ: ජාතික බලශක්ති ඉතිරි කිරීමේ ඉලක්ක සාක්ෂාත් කරනු පිණිස බලශක්ති කළමනාකරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට සෘජුව දායක වීම

• දැනුම් කළමනාකරණය

අරමුණ: බලශක්තිය සම්බන්ධයෙන් සවිඥානික ජාතියක් බිහි කිරීම සඳහා බලශක්ති අධ්‍යාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

සාමාන්‍ය වැඩසටහන්වලට අමතරව, විදුලිබල අමාත්‍යාංශය හා සූර්ය, සුළං හා ජල විදුලි ජනන රාජ්‍ය අමාත්‍යාංශය විසින් දියත් කරන ලද සුනිත්‍ය බලශක්ති සංවර්ධන ප්‍රයත්න, පරිසර අමාත්‍යාංශයේ මූලිකත්වය හිමි වූ ජාතිකමය වශයෙන් තීරණය කළ දායකත්වයන් සංශෝධනය කිරීම සහ රාජ්‍ය හා පෞද්ගලික යන දෙඅංශයේම විවිධ පාර්ශ්වකරුවන් විසින් සිදු කරන ලද අනෙකුත් සියලුම සුනිත්‍ය බලශක්ති සංවර්ධන ක්‍රියාදාම සඳහා ද ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය සහාය දක්වන ලදී.

ප්‍රධාන වැඩසටහන් යටතේ සිදු කරන ලද ක්‍රියාකාරකම්වල විස්තර පහත දැක්වේ.

(A) සැපයුම් අංශ කළමනාකරණ වැඩසටහන්

පුනර්ජනනීය බලශක්ති අංශය

• පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති සඳහා අනුමැතීන් ලබා දීම

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය සිය ව්‍යාපෘති අනුමත කිරීමේ කමිටුව යටතේ බලශක්ති බලපත්‍ර නිකුත් කිරීම හා පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති සඳහා තාවකාලික අනුමැතිය ලබා දීම සිදු කරයි. පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා යොමු කෙරෙන අයදුම්පත් අනුමැතිය සඳහා ව්‍යාපෘති අනුමත කිරීමේ කමිටුව වෙත යොමු කෙරෙන අතර එහිදී පනතේ සඳහන් විධිවිධාන ප්‍රකාරව අදාළ තීරණ ගනු ලැබේ.

මේ හා සබැඳි ව්‍යාපෘති අනුමත කිරීමේ හා ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය තුළ ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය ප්‍රමුඛ භූමිකාවක නිරත වෙයි. නියාමන ක්‍රියාවලි සම්බන්ධයෙන් ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් දායක වන ප්‍රධාන ක්‍රියාකාරකම් වශයෙන් ව්‍යාපෘති අනුමත කිරීමේ කමිටු රැස්වීම් හා අභියාචනා කමිටු රැස්වීම් පැවැත්වීම හා අනෙකුත් ව්‍යාපෘති අනුමත කිරීමේ ආයතන සමග එක්ව කටයුතු කිරීම සහ බලශක්ති සංවර්ධන ක්ෂේත්‍ර ප්‍රකාශයට පත් කිරීම ආදිය ගත හැක. මෙම සමස්ථ ක්‍රියාවලිය තුළ සංවර්ධකයන් වෙනුවෙන් පහසුකම් සම්පාදනය කිරීමට ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය පියවර ගන්නා අතර ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය හා ක්‍රියාත්මක කිරීමෙන් පසු තත්ත්වය අධීක්ෂණය කිරීමද සිදු කරයි.

ලංකා විදුලිබල මණ්ඩලය විසින් ටෙන්ඩර් කැඳවන ලද මෙගාවොට් 1 සූර්ය බලශක්ති ව්‍යාපෘති, මෙගාවොට් 10 සූර්ය බලශක්ති ව්‍යාපෘති හා මෙගාවොට් 10 සුළං බලශක්ති ව්‍යාපෘති ද ඒ යටතට ඇතුළත් වේ. ගත වූ කාලය පුරාවටම සිදු කරන ලද ක්‍රියාමාර්ගවල ප්‍රතිඵලයක් ලෙස ජාතික විදුලිබල ජාලය වෙත මෙගාවොට් 700 කට ආසන්න මුළු ධාරිතාවක් එක් වී ඇති අතර ඊට අදාළ විස්තර පහත දැක්වේ.

• ඉඩම් හා සබැඳි කාරණා සම්බන්ධයෙන් සංවර්ධකයන් වෙත පහසුකම් සම්පාදනය



වවුනතිව් වැඩ බිම

1. වාලච්චේනෙයි හි ලංකා විදුලිබල මණ්ඩලය ටෙන්ඩර් කැඳවූ මෙගාවොට් 10 සූර්ය බලශක්ති ව්‍යාපෘතිය: මඩකලපුව දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලය විසින් අදාළ ඉඩම නැවත මනින ලද අතර අංක BT/KPN/ 2020/71 දරන නව ඉඩම් හිමිකමක් පිළියෙළ කරන ලදී. නව ඉඩම පුරාවිද්‍යාත්මක හා අනෙකුත් ආයතනික ගැටළුවලින් නිදහස් කර ඇත.
2. වවුනතිව් හි ලංකා විදුලිබල මණ්ඩලය ටෙන්ඩර් කැඳවූ මෙගාවොට් 10 සූර්ය බලශක්ති ව්‍යාපෘතිය: ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව විසින් අවසන් අනුමැතිය ලබා ගැනීම සඳහා ඉඩම් අමාත්‍යවරයා වෙත යොමු කර ඇත.
3. සන්ටැක්ටි, බහරන්ඩා හා බෝහිල්වත්ත යන කුඩා ජල විදුලි බලාගාර සඳහා වන නඩු වෙනුවෙන් ඉදිරිලත් විය.
4. රන්මුදු ඔය කුඩා ජල විදුලි ව්‍යාපෘතියේ ඉඩම් අත්කර ගැනීම සම්පූර්ණ කරන ලදී.
5. සිරි ඔය කුඩා ජල විදුලි ව්‍යාපෘතියේ කල්බදු ඉඩම් ගිවිසුම සැකසීම සඳහා රත්නපුර රජයේ තක්සේරු දෙපාර්තමේන්තු කාර්යාලයෙන් තක්සේරු වාර්තාව ඉල්ලා ඇත.
6. St. Heliers කුඩා ජල විදුලි ව්‍යාපෘතියේ : පැරණි ඉඩම් අත්කර ගැනීමේ යෝජනා වෙනුවෙන් ඉඩම් අමාත්‍යාංශය විසින් බලශක්ති අමාත්‍යාවරයාගේ නිර්දේශ ඉල්ලා ඇත.

• සූර්ය බල සංග්‍රාමය

වහල මත සවි කළ කුඩා සූර්ය බලාගාර ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ වැඩසටහන් වන සූර්ය බල සංග්‍රාමය ව්‍යාපෘති යෝජනා ක්‍රම 3 ක් සහිතව පවත්වා ගන්නා ලදී: ශුද්ධ මනුකරණය, ශුද්ධ ගිණුම්කරණය හා ශුද්ධ ජනනය යන ක්‍රමවේද ලංකා විදුලිබල මණ්ඩලයේ හා ලංකා විදුලි (පෞද්.) සමාගමේ සහාය සහිතව ක්‍රියාත්මක කරන ලදී. මේ යටතේ නිවාස, ආගමික ස්ථාන, හෝටල්, වාණිජමය ආයතන හා කර්මාන්ත ආශ්‍රිතව ව්‍යාපෘති ක්‍රියාත්මක කර ඇත. සූර්ය බලශක්ති ධාරිතාව මෙගාවොට් 337 දක්වා ඉහළ නැංවීමට මෙම වැඩසටහන දායක වී ඇති අතර වහල මත සවි කළ කුඩා සූර්ය බලාගාර පද්ධති 31,165 ක් ඔස්සේ ලබා දුන් මෙම දායකත්වය ජාතික විදුලිබල ඉල්ලුමෙන් 3% ක් සපුරයි.

නිෂ්පාදන ගුණාත්මකභාවය සහතික කරමින් ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය හා ලියාපදිංචි වී ඇති සේවා සැපයුම් සමාගම් මගින් සිදු කරන ලද ව්‍යාපෘති ක්‍රියාත්මක කර ඇති අතර ඒ අනුව සිදු කෙරෙන ස්ථාපන ප්‍රමිතීන් අධිකාරියේ ඍජු අධීක්ෂණය යටතේ පවතී. ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ මැදහත්වීම් අතරට පහත දෑ ඇතුළත් වේ:

- ඉංජිනේරුවන්, තාක්ෂණ නිලධාරීන් හා ආයතනික කාර්ය මණ්ඩල වෙනුවෙන් පුහුණු වැඩසටහන් පැවැත්වීම
- වහල මත සවි කළ කුඩා සූර්ය පද්ධති ස්ථාපනය කරන සේවා සැපයුම්කරුවන්ගේ කාර්යසාධන පරීක්ෂාව
- වහල මත සවි කළ කුඩා සූර්ය පද්ධති සඳහා උපකරණ ආනයනය කිරීම හා ස්ථාපනය වෙනුවෙන් අනුමැතිය ලබා දීමට අනුමත කිරීමේ කමිටු රැස්වීම් පැවැත්වීම
- අනෙකුත් අනුමත කිරීමේ ආයතන සමඟ එක්ව කටයුතු කිරීම
- දත්ත හා තොරතුරු පද්ධතිය පවත්වා ගැනීම හා යාවත්කාලීන කිරීම
- වහල මත සවි කළ කුඩා සූර්ය බලාගාර ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් රජයේ ආයතන වෙත තාක්ෂණික සහාය ලබා දීම
- වහල මත සවි කළ කුඩා සූර්ය පද්ධති ව්‍යාපෘති සේවා සැපයුම්කරුවන්ගේ කාර්යසාධනය මත පදනම්ව සේවා ලාභීන්ගේ ගැටළු විසඳීමට මැදහත් වීම
- පාරිභෝගික උපකාරක සේවාවක් පවත්වා ගැනීම
- NVQ සිසුන් පුහුණු කිරීමේ වැඩසටහන් පැවැත්වීම
- ප්‍රමිති යාවත්කාලීන කිරීම

• සූර්ය බලශක්ති සේවා සැපයුම් ආයතන ලියාපදිංචි කිරීම

නව ලියාපදිංචියක් අපේක්ෂා කරන සමාගම් තම සමාගමේ පසුබිම සහ ඒවායෙහි තාක්ෂණික කාර්ය මණ්ඩලය හා ඔවුන්ගේ සුදුසුකම් පිළිබඳ විස්තර (සුදුසුකම් ඇතුළුව), ඔවුන් ආනයනය කිරීමට අදහස් කරන උපකරණ (ඉන්වර්ටර හා පැනල) පිළිබඳ විස්තර ලබා දිය යුතු අතර එකී තොරතුරු මත පදනම්ව ලියාපදිංචිය සඳහා ඔවුන් සුදුසුකම් ලබන්නේද යන්න පිළිබඳව කමිටුව තීරණයක් ගනී. පවතින ලියාපදිංචිය අලුත් කර ගැනීමට අපේක්ෂා කරන සමාගම් තමන් විසින් සිදු කරන ලද ස්ථාපනයන් පෙන්වමින් ඉදිරිපත් කිරීමක් සිදු කළ යුතුය. අලුත් කිරීමේ අයදුම්පත් නිල වශයෙන් සලකා බැලීමට අමතරව එකී ඉදිරිපත් කිරීම්වලදී තීරක මණ්ඩල සාමාජිකයන් විසින් එකී කටයුතුවල ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා අදාළ උපදෙස් ලබා දේ.

අලුතින් ලියාපදිංචි කිරීමේ හා ලියාපදිංචිය අලුත් කිරීමේ ක්‍රියාවලිය තුළ ඉතා වැදගත් නිර්ණායකයක් වන්නේ නිෂ්පාදන හා ස්ථාපන ප්‍රමිතිවලට නිසි අනුකූලතාව දැක්වීමයි.

2020 මැද භාගය වන විට ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් සූර්ය බලශක්ති සේවා සැපයුම්කරුවන් 270 ක් ලියාපදිංචි කරන ලද අතර විවිධ මට්ටම්වල ඍජු රැකියා අවස්ථා 8,500 ක් සහ වක්‍ර රැකියා අවස්ථා 3,700 ක් පමණ නිර්මාණය වීමට එය හේතු විය.

කාර්යසාධන සමාලෝචනය

- **ආරක්ෂක හමුදා සාමාජිකයන් ඉලක්ක කර ගත් පුහුණු වැඩසටහන්**

නිරන්තරයෙන් ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය පුහුණු වැඩසටහන් පවත්වයි. බලශක්ති සේවා සැපයුම් ආයතන වෙතින් කාන්තාවන් වෙත ඇති අවස්ථා ඉතා සීමිත වීම හේතුවෙන් මෙම වසරේදී කාන්තාවන් පුහුණු කිරීමේ වැඩසටහන් වෙත විශේෂ අවධානයක් යොමු කරන ලදී. ඒ අනුව, ආරක්ෂක අමාත්‍යාංශය හා එක්ව ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් 'සූර්ය බලශක්ති පිළිබඳව ශ්‍රී ලංකා ආරක්ෂක හමුදාවල සේවයේ නියුතු කාන්තා ශ්‍රම බලකායයෙහි ශක්‍යතා සංවර්ධනය' යන තේමාවෙන් දින පහක් පුරා අංග සම්පූර්ණ පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදී.

ශ්‍රී ලංකා යුද හමුදාව, නාවික හමුදාව, ගුවන් හමුදාව හා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් කාන්තා නිලධාරීන් 21 ක් ඊට සහභාගී විය. 2020 අගෝස්තු 18 සිට 22 දක්වා පැවැත්වුණු මෙම වැඩසටහනෙහි කොටසක් ලෙස දේශන පැවැත්වීම්, සූර්ය පැනල හා කේබල් නිෂ්පාදනාගාර වෙත සිදු කළ නිරීක්ෂණ චාරිකා සහ හම්බන්තොට සූර්ය බලශක්ති උද්‍යානයෙහි ප්‍රායෝගික පුහුණුවක් ලබා දීම සිදු කෙරිණ.







ශ්‍රී ලංකා පොලිසිය වෙනුවෙන්ද පුහුණුවක් පවත්වන ලදී. එම වැඩසටහන මිරිහානේ පිහිටි පොලිස් සන්නිවේදන කොට්ඨාසයේ පවත්වන ලදී.

- **සූර්ය බලශක්ති තාක්ෂණය පිළිබඳව NAITA සිසුන් පුහුණු කිරීම**

නිපුණතා සංවර්ධන, වෘත්තීය පුහුණු, පර්යේෂණ හා නවෝත්පාදන අමාත්‍යාංශය විසින් පවත්වන ලද සූර්ය පැනල ආකෘති නිෂ්පාදන ව්‍යාපෘතියේ කොටසක් වශයෙන් ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු ආයතනයේ සිසුන් සඳහා ද සූර්ය බලශක්ති තාක්ෂණය පිළිබඳව පුහුණු වැඩසටහන් පවත්වන ලදී.





නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශයෙහි පැවැත්වුණු ව්‍යාපෘතිය පිළිබඳ සාකච්ඡාවක්

ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු ආයතනයෙහි මාස 5 ක න්‍යායික පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කර ඇති සිසුන් වෙනුවෙන් හම්බන්තොට සූර්ය බලශක්ති උද්‍යාන පරිශ්‍රයෙහි වඩා වැඩිදියුණු කළ පුහුණු වැඩසටහනක් පවත්වන ලදී.

- **පුනර්ජනනීය බලශක්ති අනුරූපණාගාර පවත්වා ගැනීම**

සූර්ය බලශක්ති පද්ධතියෙහි සාමාන්‍ය නඩත්තු කටයුතු සිදු කරන අතරම හම්බන්තොට සූර්ය බලාගාරය හා ඉඳුරන කුඩා ජල විදුලි බලාගාරය මෙහෙයුම්ගත කරන ලදී. හම්බන්තොට බලාගාරයට ඇති බරපතල දුෂ්කරතාවක් ලෙස අලි වැටවල් හඳුනා ගන්නා ලද අතර විදුලි වැටවල්වලට අදාළ අලුත්වැඩියා කටයුතු සිදු කරන ලදී. ඉඳුරාන අනුරූපණාගාරය ටරිබයින් කෞතුකාගාරයක් දක්වා ව්‍යාප්ත කිරීමට අවශ්‍ය පියවර ගැණුනි.

කාර්ය මණ්ඩලය පැනල සේදීම් සිදු කරමින්





Governor යන්ත්‍රය කොටසක්



Flywheel යන්ත්‍රය කොටස්



කාර්යසාධන සමාලෝචනය

උපායමාර්ග අංශය

• පුනර්ජනනීය බලශක්ති සංවර්ධන සැලැස්ම

සුනිත්‍ය බලශක්ති සංවර්ධන ක්‍රියාවලිය සලකා බැලීමේදී බලශක්ති ප්‍රභවයන් පෝෂණය කරනු පිණිස පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය උපරිම ප්‍රවේශයකින් සිදු කළ යුතු වේ. මෙම සන්දර්භය තුළ දිගු කාලීන පුනර්ජනනීය බලශක්ති සංවර්ධන ක්‍රියාවලියක් සලකා බැලීමේදී, ඉහළම ප්‍රමුඛතාවක් ලබා දෙන කාරණාවක් වන්නේ මහා පරිමාණ පුනර්ජනනීය බලශක්ති සංවර්ධන ව්‍යාපෘති උදෙසා සුදුසු බිම් හඳුනා ගැනීමයි. ගත වූ දශක කිහිපය තුළ පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය සඳහා සුදුසු ඉඩම් සෙවීමේදී භූගෝලීය තොරතුරු පද්ධති බෙහෙවින් යොදා ගැනුණි. පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය සම්බන්ධ තීරණ ගැනීමේදී භූ-අවකාශීය තොරතුරු සමුදායක් ඒකාබද්ධ කර ගැනීමට අවශ්‍ය පහසුකම් එවැනි පද්ධති වෙතින් ලැබේ. මේ නිසා, GIS Optimization Model යොදා ගනිමින් සූර්ය, සුළං හා ජෛවස්කන්ධ යන පුනර්ජනනීය බලශක්ති ප්‍රභව සංවර්ධනය කිරීම සඳහා වඩා හොඳින් උචිත ඉඩම් හඳුනා ගැනුණි. පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය විශේෂයෙන් පවතින විවිධ සීමාවන්ද එහිදී සැලකිල්ලට ගන්නා ලදී. පුනර්ජනනීය බලශක්ති සංවර්ධන ව්‍යාපෘති ස්ථානවල යෝග්‍යතාව ආකෘතිගත කිරීමේදී යොදා ගන්නා ලද නිර්ණායක වූයේ සම්පත් පැවතීම, ඉඩම් භාවිතය, මාර්ග වෙත ඇති දුර, බිම් පෙදෙස, GSS වෙත ඇති දුර, නාගරික මධ්‍යස්ථාන මා බැහැර කළ යුතු ප්‍රදේශ (වනාන්තර හා වන ජීවී රක්ෂිත, පුරාවිද්‍යාත්මක රක්ෂිත, වෙරළ සංරක්ෂණ ප්‍රදේශ, නාගරික මධ්‍යස්ථාන, ගුවන් තොටුපලවල් හා මාර්ග ආදිය) යනාදියයි.

- පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය උදෙසා ඉඩම් භාවිත රටා තෝරා ගන්නා ලදී.

• සියඹලාණ්ඩුව මෙගාවොට් 100 සූර්ය බලශක්ති උද්‍යානය

මෙරට පළමු මහා පරිමාණ සූර්ය බලශක්ති උද්‍යානය වන සියඹලාණ්ඩුව මෙගාවොට් 100 බලශක්ති උද්‍යානයේ ආරම්භක සංවර්ධන කටයුතු සිදු කරන ලදී. අවශ්‍ය සියලුම අනුමැතීන් ලබා ගත් අතර ව්‍යාපෘති වැඩබිම මෙන්ම සම්ප්‍රේෂණ මාර්ග වෙනුවෙන් ආරම්භක පාරිසරික තක්සෙරුවක් සිදු කරන ලදී. ව්‍යාපෘති සංවර්ධන ක්‍රියාකාරකම් සැලසුම් කිරීම උදෙසා සියඹලාණ්ඩුව වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හා ලංකා විදුලිබල මණ්ඩලය සමඟ සවිස්තර සාකච්ඡා පවත්වන ලදී. ඒ අනුව ඉඩම් අත්කර ගැනීම ඇතුළු ඊළඟ අදියර වෙත යොමු වීමට අපේක්ෂා කෙරේ.



• පුනරීන් සුළං-සූර්ය දෙමුහුන් බලශක්ති උද්‍යානය

පුනරීන් යනු මෙරට සුළං බලශක්ති උත්පාදනය සඳහා ඉහළම විභවයක් පවතින හා ඉතා ඉහළ සුළං සම්පතක් පවතින ප්‍රදේශයකි. මෙම ඉඩම් ප්‍රදේශ ගොවිතැනට නුසුදුසු ලඳු බිම් වන බැවින් සහ පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය සඳහා අතිශයින් යෝග්‍ය ලක්ෂණ සහිත බැවින් මහා පරිමාණ සූර්ය-සුළං දෙමුහුන් පුනර්ජනනීය බලශක්ති සංවර්ධන ව්‍යාපෘතියක් සඳහා පුනරීන් ප්‍රදේශය තෝරා ගෙන ඇත. මෙම ව්‍යාපෘතියේ මුළු ඇස්තමේන්තුගත සුළං බලශක්ති ධාරිතාව මෙගාවොට් 239 ක් හා සූර්ය බලශක්ති ධාරිතාව මෙගාවොට් 150 ක් වන අතර මුළු ව්‍යාපෘති ප්‍රදේශය හෙක්ටයාර 1170 කි. එම ප්‍රදේශයේ මූලික සමීක්ෂණ වැඩ කටයුතු නිම කරන ලද අතර ඒ සඳහා ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලියට අදාළ ක්‍රියාකාරකම්ද ආරම්භ කරන ලදී. 'කුරුලු අධ්‍යයනයද' පවත්වන ලදී. ව්‍යාපෘතියේ පාරිසරික හා සමාජ බලපෑම් තක්සේරුවක් සිදු කිරීම සඳහා කටයුතු සම්පාදනය කරන ලදී.

• මන්නාරම දෙවැනි අදියරේ මෙගාවොට් 100 සුළං බලශක්ති උද්‍යානය

එසේම, ලංකා විදුලිබල මණ්ඩලය විසින් පළමු මෙගාවොට් 100 ව්‍යාපෘතිය ආරම්භ කර ඇති මන්නාරම ප්‍රදේශය ආශ්‍රිතව සුළං බලයෙන් බලශක්තිය උත්පාදනය කිරීමට ඇති හැකියාව සොයා බැලීමේ කටයුතු ද අප විසින් අරඹන ලදී. දැනටමත් පවතින වැඩිදුර ධාරිතා හඳුනා ගැනීමේ මූලික අධ්‍යයනයවලට අනුව මන්නාරම දූපත ආශ්‍රිතව සුළං බලයෙන් මෙගාවොට් 150 ක විදුලි ධාරිතාවක් සහ මන්නාරම දිස්ත්‍රික්කය ආශ්‍රිතව මෙගාවොට් 290 ක ධාරිතාවක් පෙන්නුම් කර ඇත. ඒ අනුව, මන්නාරම් දූපතේ මෙගාවොට් 100 ධාරිතාවක් සහිත තවත් සුළං බලාගාරයක් සංවර්ධනය කිරීම සඳහාද පියවර ගන්නා ලදී. සූර්ව ශක්‍යතා අධ්‍යයනයක්, පාරිසරික හා සමාජ බලපෑම් තක්සේරුවක්, සුළං මිනුම්ගත කිරීමේ වැඩසටහන් හා ඉඩම් අත්කර ගැනීමේ වෙනුවෙන්ද කටයුතු සම්පාදනය කරන ලදී.

B. ඉල්ලුම අංශ කළමනාකරණ වැඩසටහන්

දැනට පවතින ස්වේච්ඡාත්මක ප්‍රවේශය අවධානාත්මක අනිවාර්ය ප්‍රවේශයක් දක්වා වැඩිදියුණු කරමින් බලශක්ති කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමටද පියවර ගන්නා ලදී. ඊට අදාළ පළමු පියවර වශයෙන්, අවසන් පාරිභෝගික කණ්ඩායම් වෙතින් බලශක්ති කාර්යසාධනයට අදාළ තොරතුරු ලබා ගැනීම වෙනුවෙන් රෙගුලාසියක් කෙටුම්පත් කරන ලදී. අදාළ කාණ්ඩය තුළ සිටින අනෙකුත් අවසන් පාරිභෝගිකයන්ට සාපේක්ෂව තමන් සතු බලශක්ති කාර්යසාධන මට්ටම වටහා ගැනීමට අවස්ථාවක් එමගින් පාරිභෝගිකයන්ට හිමි වන අතර එහි ප්‍රතිඵලයක් ලෙස ඔවුන්ගේ බලශක්ති කාර්යසාධනය වැඩිදියුණු කර ගැනීමට මංපෙත් සැලසේ.

මෙම විධිවිධානය 2021 වසරේදී ක්‍රියාත්මක කිරීමට නියමිත අතර ඒ අනුව යම් දෙන ලද පාරිභෝගිකයෙකුගේ ප්‍රතිඵල මට්ටම් හා බලශක්ති දර්ශක වාර්තා කිරීම අනිවාර්ය බවට පත් වෙන තත්ත්වයකට මග පෑදේ. ඊළඟ පියවර වශයෙන්, අඩු කාර්යසාධනයක් ප්‍රකට කරන පාරිභෝගිකයන් තමන්ට අදාළ පරිශ්‍ර සම්බන්ධ විස්තරාත්මක බලශක්ති විගණනයක් සිදු කොට වැඩිදියුණු කිරීමේ සැලැස්මක් සකසා ගැනීම අවශ්‍ය වනු ඇත. සමස්ථයක් ලෙස ගත් කල, රට තුළ බලශක්ති කාර්යසාධන ක්‍රමවේදය අනිවාර්යයෙන්ම ක්‍රියාත්මක කළ යුතු තත්ත්වයක් උදා වනු ඇත.

● බලශක්ති කාර්යක්ෂමතාව ඉහළ නැංවීම හා සංරක්ෂණය

අරමුණ: බලශක්ති කළමනාකරණයට සහයවම දායක වීම.

බලශක්ති සංරක්ෂණ ක්ෂේත්‍රය තුළ පහත කාණ්ඩ තුන යටතේ වාණිජ, කාර්මික හා ගෘහස්ථ යන අංශ සැලකිල්ලට ගනිමින් වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත.

- නියාමන වැඩිදියුණු කිරීම
- බලශක්ති කාර්යක්ෂම සේවා සවිගැන්වීම
- පුහුණුව හා දැනුම්වත්භාවය

2020 වසර තුළ ක්‍රියාත්මක කර ඇති වැඩසටහන් පහතින් දක්වා ඇත.

1. බලශක්ති කළමනාකරණ පද්ධති පිහිටුවීම

බලශක්ති කළමනාකරු වැඩසටහන, බලශක්ති විගණක වැඩසටහන වැනි දිගු කාලීන වැඩසටහන් ඔස්සේ ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් වාණිජ හා කාර්මික අංශ තුළ බලශක්ති සංරක්ෂණයට සහාය දක්වයි. මේ වන විට බලශක්ති කළමනාකරුවන් 226 දෙනෙකු හා බලශක්ති විගණකවරුන් 22 දෙනෙකු ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියෙහි ලියාපදිංචි වී ඇත. ඊට අමතරව, 2018 සිට මේ දක්වා බලශක්ති කළමනාකරණ නිලධාරීන් වෙනුවෙන් බලශක්ති සංරක්ෂණය හා පුනර්ජනනීය බලශක්තිය පිළිබඳ දිස්ත්‍රික් මට්ටමේ වැඩමුළු පවත්වා ඇත.

ඊට සමගාමීව 2020 වසරේදී මාතර, ගාල්ල හා හම්බන්තොට දිස්ත්‍රික්ක ආවරණය කරමින් වැඩමුළුවක් පවත්වන ලදී (සහභාගී වූවන් 100ක්). බලශක්ති කළමනාකරුවන්, බලශක්ති විගණකවරුන් හා අනෙකුත් අදාළ වැඩසටහන් වෙනුවෙන් පුහුණුකරුවන් ලියාපදිංචි කිරීම සඳහා අයදුම්පත් කැඳවා ඇත. එසේම, බලශක්ති පිල් ලකුණු (benchmarking) කිරීම අනිවාර්ය බලශක්ති කාර්යක්ෂමතාව ඉහළ නැංවීමේ වැඩසටහන් ලෙසට පත් කෙරෙන නියාමන රෙගුලාසියක් පළ කිරීමට පියවර ගෙන තිබේ.

2. ප්‍රමිති හා නියාමන රගුලාසි හඳුන්වා දීම

නිසි නියාමන මැදිහත්වීම් ලබා දීම උදෙසා විවිධ ක්‍රියාකාරකම් දියත් කරන ලද අතර, කාර්මික, ගෘහස්ථ හා වාණිජ අංශවල බලශක්ති කාර්යක්ෂමතාව ඉහළ නැංවීම අරමුණු කර ගත් දැනුම්වත්භාවය ඉහළ නැංවීමේ දායකත්වයන්ද අප ලබා දී ඇත. ඒ අනුව, බලශක්ති කාර්යක්ෂම ගොඩනැගිලි සඳහා වන පිළිවෙත් සංග්‍රහය 2020 සම්පූර්ණ කරන ලදුව මෙහි සමාලෝචිත වසර තුළදී මහජනතාවට ඒ පිළිබඳව අදහස් දැක්වීමට අවස්ථාව විවර කරන ලදී. වාණිජ මට්ටමේ ගොඩනැගිලි අංශයේ බලශක්ති පරිභෝජනයේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීමේ අරමුණින් එම පිළිවෙත් සංග්‍රහය වාණිජ ගොඩනැගිලි සඳහා අනිවාර්ය අවශ්‍යතාවක් ලෙස හඳුන්වා දෙනු ඇත. ඊට අමතරව, ඉංග්‍රීසි මාධ්‍යයෙන් පළ කර ඇති 'ශ්‍රී ලංකාවේ තිරසාර බලශක්ති නිවාස සැලසුම්කරණය සඳහා මාර්ගෝපදේශනය' සිංහල හා දමිළ භාෂාවන්ට පරිවර්තනය කෙරෙමින් පවතී. උපකරණ බලශක්ති ලේබල්කරණ වැඩසටහනේ ප්‍රගතිය පහත පරිදි වේ.

විස්තරය	ප්‍රගතිය
LED පැනල සඳහා අවම බලශක්ති කාර්යසාධන ප්‍රමිතිය	ප්‍රමිතිය පිළියෙළ කෙරෙමින් පවතී.
සිවිලිම් පංකා සඳහා බලශක්ති ලේබල්කරණය	මි.මී. 1400 විශ්කම්භයකින් යුතු සිවිලිම් පංකා සඳහා වන බලශක්ති ලේබලය පිළිබඳව ජනමාධ්‍ය ඔස්සේ මහජන දැනුම්වත්භාවය ඇති කෙරේ. අනෙකුත් විශ්කම්භ සහිත සිවිලිම් පංකා වෙනුවෙන්ද බලශක්ති ලේබල්කරණ වැඩසටහන ව්‍යාප්ත කිරීමට යෝජිත අතර පළමු පියවර ලෙස මි.මී. 1200 පංකා සඳහා එය ක්‍රියාත්මක කෙරේ.
ශීතකරණ සඳහා බලශක්ති ලේබල්කරණය	කෙටුම්පත් කළ ප්‍රමිතිය ශීතකරණවලට අදාළව සම්පූර්ණ කර ඇති අතර එය දේශීය ප්‍රමිතිය ලෙස පළ කිරීමට සූදානමින් පවතී.
LED බල්බ සඳහා බලශක්ති ලේබල්කරණය	LED බල්බ බලශක්ති ලේබල්කරණයට ලක් කිරීම අනිවාර්ය කෙරෙන ගැසට් නිවේදනය පළ කර ඇත.
රූපවාහිනී, රයිස් කුකර් හා ජල පොම්ප සඳහා බලශක්ති ලේබල්කරණය	රූපවාහිනී, රයිස් කුකර් හා ජල පොම්ප සඳහා බලශක්ති ලේබල්කරණ ප්‍රමිති සැකසීම අරඹා ඇත.

3. උපදේශන සේවා

ගෘහස්ථවලට පිළිතුරු දීම හා දැනුම්වත්භාවය ඉහළ නැංවීමේ වැඩසටහන් ආදිය පැවැත්වීම තුළින් ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය විවිධ උපදේශන සේවා ඔස්සේ වාණිජ හා රාජ්‍ය අංශයේ ආයතන සතු බලශක්තිමය ගැටළු විසඳා ගැනීමට උපකාර දක්වයි. බලශක්ති විගණන කටයුතුවලදී කුලී පදනම මත ලබා ගෙන භාවිත කළ හැකි ඉතා හොඳින් නඩත්තු කෙරෙන උපකරණ බැංකුවක් ද අධිකාරිය සතු වේ. 2020 දී එම උපකරණ භාවිතය දින 900 ක් පමණ වේ. අල්ට්‍රාසොනික් ප්‍රවාහ මාපකය, ඉන්ධන වායු විශ්ලේෂකය, තාප රූපණ කැමරාව, වායු ප්‍රවාහ මාපකය හා ජල ප්‍රවාහ උගුල් පිරික්සනය යන උපකරණ මිල දී ගැනීමේ ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර ඇත. බලශක්ති විගණන සිදු කිරීම හා බලශක්ති කාර්යක්ෂමතාව ඉහළ නැංවීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා බලශක්ති සේවා සමාගම් ලියාපදිංචි වී ඇති අතර මේ වන විට එවැනි සමාගම් 50 ක් ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය යටතේ ලියාපදිංචි වී සිටී. එසේම, රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව, සුගතදාස ක්‍රීඩා සංකීර්ණය, මුදල් කොමිසම, ආපදා කළමනාකරණ දෙපාර්තමේන්තුව හා SLIDA වැනි ආයතන සඳහා 2020 වසරේදී උපදේශන සේවා හා බලශක්ති විගණන සේවා ලබා දී ඇත.

කාර්යසාධන සමාලෝචනය

4. බලශක්ති තුලන වාර්තාව

ශ්‍රී ලංකා බලශක්ති තුලන වාර්තාව යනු ශ්‍රී ලංකාවේ බලශක්ති අංශයේ කාර්යසාධනය පිළිබඳ විශ්ලේෂණයකි. ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය එම විශ්ලේෂණය වාර්ෂිකව පළ කරන අතර 2018 ට අදාළ බලශක්ති තුලන වාර්තාව මේ වන විට සකස් කෙරෙමින් පවතී. එපමණක්ද නොව, බලශක්ති තුලන දත්ත ලබාගත හැකි අන්තර්ජාල දත්ත පද්ධතියක් හඳුන්වා දීමට අදහස් කරන අතර එය සංවර්ධනය කිරීම වෙනුවෙන් ලංසු කැඳවීමේ ලේඛන මේ වන විට පිළියෙළ කෙරෙමින් පවතී.

5. නියමු ව්‍යාපෘති පිහිටුවීම්

ත්‍රිත්ව ජනනය හෙවත් සංයුක්ත සිසිලනය, තාපය හා බලය යන අවස්ථාවෙන් අදහස් වන්නේ එක් බලශක්ති ප්‍රභවයක් යොදා ගෙන එකම අවස්ථාවේදී විදුලි බලන ජනනය කිරීම හා ඒ අතරම ප්‍රයෝජනවත් ලෙස තාපනය හා සිසිලනය සිදු කිරීමයි. ප්‍රාථමික ඉන්ධන මගින් ජනනය කරනු ලැබෙන බලශක්තියෙන් 80% ම ත්‍රිත්ව උත්පාදනය සඳහා යොදා ගත හැක. මේ වන විට මෙම තාක්ෂණය බලශක්තියෙන් උපරිම ප්‍රයෝජන ගත හැකි හොඳම ක්‍රමවලින් එකකි. මෙම තත්ත්වය තුළ එම ක්‍රමවේදය කාර්මාන්ත තුළට හඳුන්වා දිය හැකි ආකාර සොයා බැලීමට ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය තීරණය කර තිබේ. බියගම අපනයන සැකසුම් කලාපය ආශ්‍රිතව ත්‍රිත්ව බල උත්පාදන පද්ධතියක් පිහිටුවීම පිළිබඳ අධ්‍යයනයක් දැනටමත් සිදු කර ඇති අතර ඊට අදාළ ශක්‍යතා අධ්‍යයනය පිළිබඳ ඉදිරිපත් කිරීමක් ආයෝජන මණ්ඩල නිලධාරීන් හා බියගම අපනයන කලාපයෙන් තෝරා ගත් කර්මාන්තශාලා වෙනුවෙන් පවත්වා ඇත.

6. ඉල්ලුම් අංශ කළමනාකරණ මෙහෙයුම

මෙහෙයුම පහත ක්ෂේත්‍ර යටතේ පවත්වා ඇති ඉල්ලුම අංශ කළමනාකරණ වැඩසටහනේ ප්‍රගතිය පහත දැක්වේ.

ක්ෂේත්‍රය	ඉටු කරන ලද කාර්යයන්
කාර්යක්ෂම වායුසමනය	වායුසමන පරීක්ෂණාගාරයක් පිහිටුවීම සඳහා අදාළ පිරිවිතර හා මූල්‍ය සම්පාදන යෝජනා පිළියෙළ කොට ආධාර ලබා දෙන ආයතන කිහිපයකටම යොමු කර ඇත. එම යෝජනාව අනුමැතිය සඳහා විදේශ සම්පත් දෙපාර්තමේන්තුව වෙත යවා ඇත.
කාර්යක්ෂම ශීතකරණ	ශීතකරණ මාරු කිරීමේ වැඩසටහන යටතේ සිදු කෙරෙන නියමු අධ්‍යයනය වෙනුවෙන් ශීතකරණ සිලින්ඩර ප්‍රසම්පාදනය කිරීමට අදළ ලංසු ලේඛන පිළියෙළ කෙරේ.
කාර්යක්ෂම සිසිලන	සිසිලන සමීක්ෂණයක් සඳහා (terms of reference) යොමු කිරීමේ අනුදේශ පිළියෙළ කෙරෙමින් ඇත.
කාර්යක්ෂම පංකා	ගෘහස්ථ විදුලි උපකරණ සමීක්ෂණය සඳහා දත්ත තහවුරු කර ඇති අතර එම දත්ත ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව වෙත බාර දීම සිදු වෙමින් පවතී.
සුහුරු නිවාස	ගෘහස්ථ අංශයේ බලශක්ති කාර්යක්ෂම පිළිවෙත් පිළිබඳ පොත් පිංචක් පළ කර ඇත.
තාපදීප්ත බුබුළු භාවිතයෙන් ඉවත් කිරීම	LED බුබුළු බෙදාහැරීමේ වැඩසටහනේ පළමු අදියර සම්පූර්ණ කර ඇත.

දැනුම් කළමනාකරණය

- **බලශක්ති අධ්‍යාපන වැඩසටහන**

වසංගත තත්ත්වය හේතුවෙන් බලශක්ති සමාජ ඇගයීමේ වැඩසටහන කල් දැමීමට සිදු විය.

- බලශක්ති සමාජ භාර ගුරුවරුන් සඳහා වන අන්තර්ජාලය පාදක 'දැනුම ව්‍යාප්ත කිරීමේ වැඩසටහන' අධ්‍යාපන අමාත්‍යාංශයේ ඉල්ලීම මත සකස් කිරීමට සැලසුම් කර ඇත.
- පුහුණු කරුවන් පුහුණු කිරීම සඳහා වන ක්‍රියාකාරකම් මාර්ගෝපදේශ කෙටුම්පත් සම්පූර්ණ කර ඇත.
- දෘෂ්‍ය ඉගැනුම් ආධාරක සකස් කිරීම සඳහා ප්‍රසම්පාදන කටයුතු සිදු කෙරෙමින් පවතී.

- **සංරක්ෂා සඟරාව පළ කිරීම**

සිසුන් හා මහ ජනතාව වෙත නවතම දැනුම ව්‍යාප්ත කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය 'සංරක්ෂා' නමින් කාර්තුමය සඟරාවක් පළ කරයි. තුන්වැනි කාර්තුවට අදාළ සඟරාවේ ඩෙස්ක්ටොප් අනුවාදය නිම කර ඇති අතර අනෙක් සඟරා දෙක බෙදා හැර ඇත.

- **පෙර පාසල් ගුරු පුහුණුව**

- අධ්‍යයන කිරීමට අවශ්‍ය ලේඛන සකස් කර ඇත.
- වසංගත තත්ත්වය හේතුවෙන් පෙර පාසල් ගුරුවරුන් පුහුණු කිරීමේ වැඩසටහන කල් දැමීමට සිදු විය.

- **බාලදක්ෂ වැඩසටහන**

බලශක්ති කළමනාකරණ ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් ගෘහස්ථ පාරිභෝගිකයන්ගේ දැනුම ඉහළ නැංවීමට දායක කර ගනු පිණිස බාලදක්ෂයන් අතර අත් පත්‍රිකා 100,000 ක් බෙදා හැරීම සඳහා බාල දක්ෂ සම්මේලනය හා ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය එක්ව සැලසුම් කර ඇත. එම අත් පත්‍රිකාවේ රූපික නිමැවුම අවසන් කර ඇති අතර වසංගත තත්ත්වය හේතුවෙන් එය බෙදා හැරීම කල් දමන්නට සිදු විය.

- **බලශක්ති ලේබල්කරණ ප්‍රවර්ධනය**

සියලුම රජයේ මාධ්‍ය ආයතන හා එක්ව සිවිලිම් විදුලි පංකා ලේබල් කිරීම ප්‍රවර්ධනය කළෙමු.

- **ප්‍රකාශන මුද්‍රණය**

නිරන්තරව ප්‍රකාශන යාවත්කාලීන කර ඇති අතර අනාගත අවශ්‍යතා මත පදනම්ව ඒවා මුද්‍රණය කෙරෙනු ඇත.

- **මාධ්‍ය උපායමාර්ගික සැලැස්ම**

විස්තීර්ණ මාධ්‍ය උපායමාර්ගික සැලැස්මක් සඳහා වන යොමු කිරීමේ අනුදේශ පිළියෙළ කෙරෙමින් පවතී.

2021 කාර්ය සැලැස්ම

සැපයුම් අංශ කළමනාකරණ වැඩසටහන්

පුනර්ජනනීය බලශක්ති අංශය

01 - සම්පත් පැවරුම

අනාගතයේදී ආකර්ෂණය විය හැකි සංවර්ධකයන් වෙනුවෙන් පුනර්ජනනීය බලශක්ති සම්පත් වෙන් කිරීම, ඉඩම් සම්බන්ධ කාරණා හා අනෙකුත් අදාළ මැදහත්වීම් ආශ්‍රිත පහසුකම් සැලසීම් යනාදිය සිදු කෙරෙනු ඇත.

02 - පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති අධීක්ෂණය

අදළ තක්සේරු කිරීම් ද සහිතව ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය අධීක්ෂණය කිරීම සිදු කෙරෙනු ඇත.

03 - පුනර්ජනනීය බලශක්ති නියමු ව්‍යාපෘති

විවිධ නවීන තාක්ෂණයන් යොදා ගැනීමට ඉඩ සලසනු පිණිස පුනර්ජනනීය බලශක්ති නියමු ව්‍යාපෘති ක්‍රියාත්මක කෙරෙනු ඇත. ජලයේ පාවෙන පෘෂ්ඨ මත සූර්ය බලශක්ති ජනනය, සුළං බලයෙන් සහිත හයිබ්‍රිඩ්ජන් තාක්ෂණය හා සූර්ය හා ජෛවස්කන්ධ දෙමුහුන් බලශක්ති උත්පාදනය ආදී නියමු ව්‍යාපෘති මේ යටතේ සැලසුම් කර ඇත.

4 - පුනර්ජනනීය බලශක්ති සේවා

2025 වසරේදී වහල මත සවි කළ කුඩා සූර්ය බලාගාර ධාරිතාව මෙගාවොට් 1000 දක්වා වැඩි කර ගැනීමේ ඉලක්කය සහිතව අවශ්‍ය මැදහත්වීම්ද සිදු කරමින් සූර්ය බල සංග්‍රාමය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කෙරෙනු ඇත. ඒ අනුව, ගුණාත්මකභාවය හා පද්ධති කාර්යසාධනය සහතික කිරීම සඳහා අවශ්‍ය පියවර ගනු ලැබෙන අතර, වහල මත සවි කළ කුඩා සූර්ය විදුලි පද්ධති ස්ථාපනය ආශ්‍රිත ධාරිතා ගොඩනැංවීමේ වැඩසටහන් ක්‍රියාත්මක කෙරෙනු ඇත. වහල මත සවි කළ සූර්ය විදුලි ව්‍යාපෘති සඳහා මූල්‍යකරණ පහසුකම් සම්පාදනය ආසියානු සංවර්ධන බැංකුව යෝජිත ඉන්දීය ණය පහසුකම යොදාගෙන ද ක්‍රියාත්මක කෙරෙනු ඇත.

05 - විදේශ මූල්‍ය ආධාර සහිත ව්‍යාපෘති

ආසියානු සංවර්ධන බැංකුවේ අනුග්‍රාහකත්වය මත ක්‍රියාත්මක වන සැපයුම් විශ්වසනීයත්වය ඉහළ නැංවීමේ ව්‍යාපෘතිය සහ එක්සත් ජාතීන්ගේ සංවර්ධන අරමුදලේ අනුග්‍රාහකත්වය ලබන ජෛවස්කන්ධ බලශක්ති සංවර්ධන ව්‍යාපෘතිය ඉදිරියටත් කරගෙන යනු ලැබේ.

06 - හම්බන්තොට සූර්ය බලශක්ති උද්‍යානය

වල් අලින් සඳහා ආරක්ෂක පද්ධතිය වැඩිදියුණු කරමින් හා ජල පීඩන පද්ධතියක් හඳුන්වා දෙමින් අවශ්‍ය වැඩිදියුණුකිරීම් සහිතව හම්බන්තොට සූර්ය බලශක්ති උද්‍යානයේ මෙහෙයුම් පවත්වා ගැනීමට නියමිත වේ. එසේම, එහි පුහුණු මධ්‍යස්ථානයක් පිහිටුවීමටද පියවර ගැනෙනු ඇත.

07 - ඉඳුරන කුඩා ජල බලාගාරය

ඉඳුරන කුඩා පරිමාණ ජල බලාගාරයේ මෙහෙයුම් ද පවත්වා ගැනෙනු ඇත.

උපායමාර්ග අංශය

01 - පුනර්ජනනීය බලශක්ති සංවර්ධන සැලැස්ම

ලංකා විදුලිබල මණ්ඩලයේ විදුලි ජනන හා සම්ප්‍රේෂණ සැලසුම් අංශය හා එක්ව පුනර්ජනනීය බලශක්ති ප්‍රභව සිතියම් හා පුනර්ජනනීය බලශක්ති ප්‍රභව ඉන්වෙන්ටරිය මත පදනම්ව පුනර්ජනනීය බලශක්ති ප්‍රභවය සංවර්ධන සැලසුම් සිදු කෙරෙනු ඇත.

02 - සුළං ප්‍රභව තක්සේරුව

ජාතික සුළං මිනුම් කුළුණු ජාලය භාවිත කරමින් සිදු කරන ලද දීප ව්‍යාප්ත සුළං ප්‍රභව තක්සේරුව නිසා මහා පරිමාණ හා මධ්‍යම පරිමාණ සුළං බලශක්ති ව්‍යාපෘති පිහිටුවීමට සහාය ලැබී ඇත.

03 - පුනරීන් සුළං-සූර්ය දෙමුහුන් බලශක්ති උද්‍යානය

පුනරීන් සුළං-සූර්ය දෙමුහුන් බලශක්ති උද්‍යානයට අදාළ මූලික කටයුතු තවදුරටත් ඉදිරියට ගෙනයනු ඇත. දැනට අවසන් අදියරේ පවතින කුරුළු සහ වවුල් අධ්‍යයනයන්, පාරිසරික හා සමාජ බලපෑම් තක්සේරුව, භූතාක්ෂණික අධ්‍යයනය හා පුරාවිද්‍යාත්මක බලපෑම් තක්සේරුව සැලසුම් කර තිබේ. ඉඩම් අත්කර ගැනීමේ ක්‍රියාවලිය සිදු කිරීමට නියමිතව ඇත.

04 - සියඹලාණ්ඩුව මෙගාවොට් 100 සූර්ය බලශක්ති උද්‍යානය

සියඹලාණ්ඩුව මෙගාවොට් 100 සූර්ය බලශක්ති උද්‍යානයට අදාළ ආරම්භක ව්‍යාපෘති සංවර්ධන කටයුතු දැනට සිදු කෙරෙමින් පවතින අතර ඊට අදාළ පාරිසරික බලපෑම් තක්සේරුව නිම කර තිබේ. වැඩ බිමෙහි මිනුම්කරණ කටයුතු හා ඉඩම් අත්පත් කර ගැනීමට අදාළ කටයුතු සැලසුම් කර ඇති අතර ඒවා නිම වූ පසුව ව්‍යාපෘතිය ටෙන්ඩර් කැඳවීම සඳහා සූදානම් වනු ඇත.

05 - මන්නාරම - දෙවැනි අදියර

මන්නාරම ප්‍රදේශය ආශ්‍රිතව උත්පාදනය කළ හැකි සමස්ථ සුළං බලශක්ති ධාරිතාව මෙගාවොට් 375 ක් බවට හඳුනා ගෙන ඇති අතර ආරම්භක මෙ.වො. 100 ව්‍යාපෘතිය වැඩ ලංකා විදුලිබල මණ්ඩලය විසින් සංවර්ධනය කර ඇත. මෙගාවොට් 100 ක ධාරිතාවක් සහිත එහි දෙවන අදියරේ වැඩ කටයුතු ආරම්භ කර ඇති අතර ඊට අදාළ පූර්ව ශක්‍යතා අධ්‍යයනය හා පාරිසරික හා සමාජ බලපෑම් තක්සේරුව සැලසුම් කර තිබේ.

2021 කාර්ය සැලැස්ම

ඉල්ලුම් අංශ කළමනාකරණ වැඩසටහන්

බලශක්ති කළමනාකරණ අංශය

01 - බලශක්ති කළමනාකරණ පද්ධති පිහිටුවීම

දත්ත වාර්තාකරණ මෘදුකාංගයක් හඳුන්වා දෙමින් බලශක්ති පරිභෝජන පිල් ලකුණු (benchmarks) පිහිටුවීමට පියවර ගැනෙනු ඇත. බලශක්ති පරිභෝජන මිනුම්වලට අදාළ රෙගුලාසි හඳුන්වා දීම තුළින් ඊට අදාළ නියාමන යටිතලපහසුකම් ස්ථාපිත කෙරෙනු ඇත. එසේම, බලශක්ති කළමනාකරුවන්, බලශක්ති විගණකවරුන්, බලශක්ති සේවා සැපයුම් සමාගම් හා පුහුණුකරුවන් සඳහා සහතිකකරණ ක්‍රමවේද ඉදිරියට පවත්වා ගැනෙනු ඇත.

02 - බලශක්ති කාර්යක්ෂම ගොඩනැගිලි සඳහා වන පිළිවෙත් සංග්‍රහය

බලශක්ති කාර්යක්ෂම ගොඩනැගිලි සඳහා වන පිළිවෙත් සංග්‍රහය පළ කොට ඊට අදාළ ශක්‍යතා/ධාරිතා ගොඩනැගීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ. එසේම, එම පිළිවෙත් සංග්‍රහය අනිවාර්ය කරමින් නියාමන පසුතලයක්ද පිහිටුවනු ලැබේ. මීට අමතරව, ගෘහස්ථ බලශක්ති කාර්යක්ෂමතා මාර්ගෝපදේශ පිළිබඳ දැනුම්වත් කිරීමේ වැඩසටහන් පවත්වනු ලැබේ.

03 - විදුලි උපකරණ සඳහා බලශක්ති ලේබල්කරණය

බලශක්ති ලේබල්කරණ වැඩසටහන ඉදිරියට ගෙන යනු ලබන අතර LED බල්බ ශීතකරණ, වායුසමීකරණ යන්ත්‍ර, මෝටර්, ජල පොම්ප, රයිස් කුකර්, ගෑස් කුකර්, රූපවාහිනී, පරිගණක ආදිය මෙම වැඩසටහනට ඇතුළත් කෙරේ.

4 - බලශක්ති තොරතුරු

බලශක්ති දත්ත රැස් කොට බෙදා හැරීම සිදු කෙරෙන අතර ශ්‍රී ලංකා බලශක්ති තුලනය 2020 ප්‍රකාශයට පත් කරනු ලැබේ. ජාතිකව නිර්ණය කරන ලද විමෝචාහරණ හා තිරසාර සංවර්ධන ඉලක්ක දත්ත වාර්තා කිරීම සඳහා වන පද්ධති ද ඇතුළත්ව දත්ත රැස් කිරීම උදෙසා පරිගණක මෘදුකාංග පද්ධති සංවර්ධනය කිරීමට පියවර ගැනේ. බලශක්ති පරිභෝජන රටා සම්බන්ධයෙන් පාරිභෝගිකයන් පාදක කරගත් සමීක්ෂණයක් සිදු කිරීමට පියවර යොදා ඇත.

05 - මෙහෙයුම් ඉල්ලුම අංශ කළමනාකරණ වැඩසටහන

තාපදීප්ත පහන් ඉවත් කිරීමේ අරමුණින් LED විදුලි බුබුළු බෙදා හැරීමේ වැඩසටහන ඉදිරියට කරගෙන යනු ලැබේ. වීදි ආලෝකකරණය සඳහා පවතින සුදුසු තාක්ෂණයන් සම්බන්ධ අධ්‍යයනයක් සිදු කොට අදාළ රෙගුලාසි පළ කරනු ලැබේ. බලශක්ති කාර්යක්ෂම සිසිලන, ශීතකරණ හා ආලෝකකරණ මෙවලම් සම්බන්ධ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ.

06 - උපදේශන සේවා

බලශක්ති විගණනය, උපකරණ සහාය හා බලශක්ති කාර්යක්ෂමතාව පිළිබඳ උපදේශන සේවා ආදී ක්‍රම ඔස්සේ වාණිජ හා කාර්මික ආශ්‍රවලට සිය බලශක්ති පද්ධති වැඩිදියුණු කර ගැනීමට අවශ්‍ය සහාය ලබා දීමට කටයුතු කරනු ලැබේ.

07 - ජයග්‍රහණ ඇගයීමට ලක් කිරීම

වාසස්ථාන ආශ්‍රිත බලශක්ති කාර්යක්ෂමතා මාර්ගෝපදේශය හරහා පුද්ගල වාසස්ථාන ආශ්‍රිතව බලශක්ති කාර්යක්ෂමතාව ඉහළ නැංවීමේ වැදගත්කම සැලකිල්ලට ගනිමින්, බලශක්ති කාර්යක්ෂම නිවාස ඇගයීමේ ක්‍රමවේදයක් ඇති කොට එය ශ්‍රී ලංකා ජාතික බලශක්ති කාර්යක්ෂමතා සම්මාන වැඩසටහනට ඇතුළත් කරනු ලැබේ.

08 - පර්යේෂණ හා සංවර්ධන / නියමු ව්‍යාපෘති

බලශක්ති කාර්යක්ෂම තාක්ෂණයන් පිළිබඳ පර්යේෂණ හා සංවර්ධන නියමු ව්‍යාපෘති පවත්වනු ලැබේ.

දැනුම් කළමනාකරණ අංශය

01 - බලශක්ති අධ්‍යාපන වැඩසටහන

පාසල් සිසුන් හා පෙර පාසල් මට්ටම ඉලක්ක කර ගත් බලශක්ති අධ්‍යාපන වැඩසටහන, පාසල් බලශක්ති සමාජ වැඩසටහන, බාලදක්ෂ වැඩසටහන හා පෙර පාසල් ගුරුවරුන් පුහුණු කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කරනු ලැබේ.

02- සන්නිවේදන වැඩසටහන

මාධ්‍ය, කියවීම සඳහා ඇති ප්‍රකාශන, ප්‍රවර්ධන වීඩියෝ, ප්‍රදර්ශන ආදී විවිධ සන්නිවේදන නාලිකා හරහා සමාජය තුළ බලශක්ති කාර්යක්ෂමතාව පිළිබඳ දැනුම්වත්භාවය ඉහළ නැංවීමේ අරමුණින් තිරසාර බලශක්ති පිළිබඳ සන්නිවේදන වැඩසටහන් පවත්වනු ලැබේ.

03 - කාන්තාවන් සවිබල ගැන්වීමේ වැඩසටහන

සුනිත්‍ය බලශක්ති සංවර්ධන ක්‍රියාවලිය තුළ කාන්තාවන් විශේෂයෙන්ම ඉලක්ක කර ගනිමින් බලශක්ති කාර්යක්ෂමතාව හා සබැඳි පරිගණක යෙදුම් නිර්මාණය කෙරේ.

04 - ඉඳුරන ව්‍යාපෘතිය සක්‍රීය කිරීම

ඉඳුරන ජල විදුලි බලශක්ති පුහුණු මධ්‍යස්ථානයේ සංවර්ධන කටයුතු සිදු කිරීමට නියමිත අතර අධ්‍යාපන අංශයේ සම්පත් දායකයන් පුහුණු කිරීමේ හා විශ්වවිද්‍යාල සිසුන් ඉලක්ක කර ගත් ප්‍රායෝගික පරීක්ෂණ කට්ටල ඇති කිරීම ඊට ඇතුළත් වේ.

මූල්‍ය ප්‍රකාශන

ආදායම් ප්‍රකාශනය

2020 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා (සියලු අගයන් ශ්‍රී ලංකා රුපියල්වලිනි)	සටහන	2020	2019 ප්‍රතිප්‍රකාශිත
ආදායම			
මෙහෙයුම් ආදායම	3	**294,715,582**	280,933,012
මෙහෙයුම් නොවන ආදායම	4	**41,367,716**	85,770,181
මුළු ආදායම		**336,083,298**	366,703,193
වියදම් -			
ව්‍යාපෘති/ක්‍රියාකාරකම් වියදම්	5		
පුනර්ජනනීය බලශක්තිය	5.1	**35,919,399**	48,476,570
බලශක්ති කළමනාකරණය	5.2	**14,219,330**	33,195,655
දැනුම් කළමනාකරණය	5.3	**5,736,895**	8,963,770
උපායමාර්ගික ක්‍රියාකාරකම්	5.4	**5,727,915**	9,667,808
		61,603,539	100,303,803
පුනරාවර්තන වියදම්	6		
වැටුප් හා දීමනා	6.1	**108,185,111**	92,202,463
ගමන් වියදම් හා සංයුක්ත දීමනා	6.2	**769,938**	1,647,123
සැපයුම්	6.3	**4,648,745**	3,976,402
නඩත්තු වියදම්	6.4	**8,359,168**	10,288,766
කොන්ත්‍රාත් සේවා	6.5	**54,835,600**	56,708,875
ක්ෂය වියදම්	6.6	**46,326,457**	44,125,670
වෙනත් පුනරාවර්තන වියදම්	6.7	**11,166,182**	11,115,186
		234,291,201	220,064,485
මුලු වියදම		**295,894,740**	320,368,288
අතිරික්තය/(ඌනතාවය)		**40,188,558**	46,334,905

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් එම අධිකාරිය වෙනුවෙන් පිළියෙල කරන ලදී.



අධ්‍යක්ෂ (මූල්‍ය)



අධ්‍යක්ෂ ජනරාල්



සභාපති

මෙහි 36 සිට 38 දක්වා පිටුවල ඇතුළත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ 39 සිට 52 දක්වා පිටුවල සඳහන් සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල සංගෘහිත අංගයකි. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කොට ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අධිකාරියේ කළමනාකරණ මණ්ඩලය සාමූහික වගකීම දරයි. මෙම මූල්‍ය ප්‍රකාශන කළමනාකරණ මණ්ඩලය විසින් අනුමමත කර ඇති අතරරර ඔවුන්ගේ අත්සන් පහත පරිදි දක්වා ඇත.

අධ්‍යක්ෂකගේ නම	අත්සන
1. ඒ කේ ගුණසේකර	
2.	

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

2020 දෙසැම්බර් 31 දිනට (සියලු අගයන් ශ්‍රී ලංකා රුපියල්වලිනි)	සටහන	2020	2019 ප්‍රතිප්‍රකාශිත
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපල, පිරියත හා උපකරණ	10		
නිදහස් වත්කම්	10.1	**474,698,637**	505,929,113
කල්බදුමය වත්කම්	10.2	**37,449,436**	38,977,984
අස්පෘශ්‍ය වත්කම්	11	**2,472,914**	2,285,407
නොනිමි කාර්ය	12	**71,726,510**	70,759,244
ආයෝජන	13	**111,803,519**	102,332,758
මුළු ජංගම නොවන වත්කම්		**698,151,016**	720,284,505
ජංගම වත්කම්			
ලැබිය යුතු දෑ	14	**23,312,323**	29,747,743
වෙනත් ජංගම වත්කම්	15	**40,449,258**	33,993,375
මුදල් හා මුදල්වලට සමාන දෑ	16	**458,733,159**	437,313,627
මුළු ජංගම වත්කම්		**522,494,740**	501,054,745
මුළු වත්කම්		**1,220,645,756**	1,221,339,250
හිමිකම් හා බැරකම්			
සමුච්චිත අරමුදල්	17	**22,100,336**	22,100,336
ශුද්ධ අතිරික්තය/(ඌනතාවය)		**198,550,939**	181,091,009
විලම්බිත ප්‍රදාන	18	**338,856,524**	377,274,934
ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අරමුදල	20	**385,061,629**	370,902,975
සුනිත්‍ය ඇප අරමුදල		**115,895,545**	107,419,486
ප්‍රත්‍යාගණන සංචිතය		**101,217,000**	101,217,000
මුළු හිමිකම්		**1,161,681,973**	1,160,005,740
ජංගම නොවන වගකීම්			
පාරිතෝෂික ගෙවීම්		**34,010,857**	24,427,119
මුළු ජංගම නොවන වගකීම්		**34,010,857**	24,427,119
ජංගම වගකීම්			
වෙනත් ගෙවිය යුතු දෑ	19	**19,903,441**	31,856,906
ඉඩම් අත්පත් කර ගැනීම මත ශුද්ධ තැන්පතු		**5,049,485**	5,049,485
මුළු ජංගම වගකීම්		**24,952,926**	36,906,391
මුළු හිමිකම් හා බැරකම් ප්‍රමාණය		**1,220,645,756**	1,221,339,250

මෙහි 36 සිට 38 දක්වා පිටුවල ඇතුළත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ 39 සිට 52 දක්වා පිටුවල සඳහන් සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල සංගෘහිත අංගයකි.

ඡන්ද වෙනස්වීම් සිඳුවීම් ප්‍රකාශනය

2020 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා
(සියලු අගයන් ශ්‍රී ලංකා රුපියල්වලිනි)

විස්තරය	සමුච්චිත අරමුදල	ශුද්ධ අනිරික්තය /(හිඟය)	විලම්බිත ප්‍රදාන	ප්‍රත්‍යාගණන සංචිතය	ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අරමුදල	සුනිත්‍ය ඇප අරමුදල	එකතුව
2018 දෙසැම්බර් 31 දිනට ශේෂය	22,100,336	189,150,948	423,846,967	101,217,000	335,605,770	98,275,578	1,170,196,599
පෙර වසර සඳහා ගැලපුම්		(9,953,731)					(9,953,731)
2019.01.01 දිනට ප්‍රතිප්‍රකාශිත ශේෂය	22,100,336	179,197,217	423,846,967	101,217,000	335,605,770	98,275,578	1,160,242,868
2019 වසර සඳහා වැඩි/(අඩු) වීම		46,334,905	(46,572,033)				(237,128)
ඇපකර අරමුදල වෙත මාරු කළ මුදල්		(9,143,908)				9,143,908	-
බලශක්ති අරමුදල වෙත පැවරීම් - ආදායම		(44,628,149)			44,628,149		-
බලශක්ති අරමුදල වෙත පැවරීම්- ව්‍යාපෘති වියදම්		9,330,944			(9,330,944)		-
ඉඩම් ප්‍රත්‍යාගණනය							
දෙසැම්බර් 31 දිනට ශේෂය	22,100,336	181,091,009	377,274,934	101,217,000	370,902,975	107,419,486	1,160,005,740
පෙර වසර සඳහා ගැලපුම්		(93,915)					(93,915)
2020 වසර සඳහා වැඩි/(අඩු) වීම		40,188,558	(38,418,410)				1,770,148
ඇපකර අරමුදල වෙත යොමු කිරීම්		(8,476,059)				8,476,059	-
බලශක්ති අරමුදල වෙත පැවරීම් - ආදායම		(19,817,444)			19,817,444		-
බලශක්ති අරමුදල වෙත පැවරීම්- ව්‍යාපෘති වියදම්		5,658,790			(5,658,790)		-
ඉඩම් ප්‍රත්‍යාගණනය							
දෙසැම්බර් 31 දිනට ශේෂය	22,100,336	198,550,939	338,856,524	101,217,000	385,061,629	115,895,545	1,161,681,973

මෙහි 36 සිට 38 දක්වා පිටුවල ඇතුළත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ 39 සිට 52 දක්වා පිටුවල සඳහන් සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල සංඝටක අංගයකි.

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

2020 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා (සියලු අගයන් ශ්‍රී ලංකා රුපියල්වලිනි)	සටහන	2020	2019 (ප්‍රතිප්‍රකාශිත)
මෙහෙයුම් ක්‍රියාකාරකම් වෙතින් ලද මුදල් ප්‍රවාහ			
වසර සඳහා අතිරික්තය/(ඌනතාවය)		**40,188,558**	46,334,905
ගැලපීම්:			
අලාභ හා හානි වීම්		**-**	-
පොලී ආදායම	3 , 8	**(22,439,783)**	(21,829,607)
විලම්බිත ප්‍රදාන ක්‍රමක්ෂය	7	**(38,418,410)**	(46,572,033)
බලශක්ති අරමුදල වෙතින් මාරු කළ මුදල්		**-**	-
සේවා පාරිතෝෂික ප්‍රතිපාදන		**9,917,344**	2,035,590
වාහන පරිත්‍යාග කිරීම්		**(7,800,000)**	-
ස්ථාවර වත්කම් බැහැර කිරීමෙන් ලාභය		**-**	(12,359,442)
ක්ෂය කිරීම්	5.6	**46,326,457**	44,125,670
කාරක ප්‍රාග්ධන වෙනස්වීම්වලට පෙර මෙහෙයුම් ලාභ/(අලාභ)		**27,774,166**	11,735,083
වෙනත් ජංගම වත්කම්වල වැඩි/(අඩු) වීම		**(1,015,167)**	(22,482,644)
ජංගම වගකීම්වල වැඩි/(අඩු) වීම		**(11,953,465)**	12,676,245
මෙහෙයුම් ක්‍රියාකාරකම් වෙතින් ලද මුදල් ප්‍රවාහ		**14,805,534**	1,928,684
පාරිතෝෂික ගෙවීම්		**(333,606)**	(1,516,201)
මෙහෙයුම් ක්‍රියාකාරකම් වෙතින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහ		**14,471,928**	412,483
ආයෝජන ක්‍රියාකාරකම් වෙතින් ලද/(භාවිත) මුදල් ප්‍රවාහ			
දේපල, පිරියත හා උපකරණ මිල දී ගැනීම්	9.1	**(3,928,516)**	(13,650,053)
අස්පෘශ්‍ය වත්කම්		**(2,026,415)**	(600,400)
නොනිමි කාර්ය	11	**(967,266)**	(26,702,037)
ස්ථාවර තැන්පතු හා භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජන	12	**(9,470,761)**	(8,745,716)
පොලී ආදායම	3 , 8	**23,434,485**	21,431,414
ස්ථාවර වත්කම් බැහැර කිරීම		**-**	12,359,442
සංවර්ධකයන්ට ලබා දුන් ණය		**-**	-
ආයෝජන ක්‍රියාකාරකම් වෙතින් ලද/(භාවිත) ශුද්ධ මුදල් ප්‍රවාහ		**7,041,527**	(15,907,350)
මූල්‍යකරණ ක්‍රියාකාරකම් වෙතින් ලද/(භාවිත) මුදල් ප්‍රවාහ			
විලම්බිත ප්‍රදාන	18		-
ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අරමුදල		**-**	-
සමුච්චිත අරමුදල්		**(93,923)**	-
සුනිත්‍ය ඇපකර අරමුදල		**-**	-
විදේශීය ආධාරකරුවන්ට ආපසු ගෙවිය යුතු ණය		**-**	-
ආසියා සංවර්ධන බැංකුව වෙතින් ලබා ගත් ණය (L 2892 SRI)	13	**-**	-
ආසියා සංවර්ධන බැංකුව වෙතින් ලබා ගත් ණය බෙදා හැරීම (L 2733 SRI)	13	**-**	-
මූල්‍යකරණ ක්‍රියාකාරකම් වෙතින් ලද/(සඳහා භාවිත වූ) ශුද්ධ මුදල් ප්‍රවාහ		**(93,923)**	-
මුදල් හා මුදල් සමානයන්හි ශුද්ධ ඉහළ යාම/පහළ යාම		**21,419,532**	(15,494,867)
වසර ආරම්භයේදී මුදල් හා මුදල්වලට සමාන දෑ	16	**437,313,627**	452,808,494
වසර අවසානයේදී මුදල් හා මුදල්වලට සමාන දෑ		**458,733,159**	437,313,627

මෙහි 36 සිට 38 දක්වා පිටුවල ඇතුළත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ 39 සිට 52 දක්වා පිටුවල සඳහන් සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල සංගෘහිත අංගයකි.

මූල්‍ය ප්‍රකාශනවලට සටහන්

1. ආයතනික තොරතුරු

1.1 සාමාන්‍ය

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය 2007 ඔක්තෝබර් 01 දින පිහිටුවන ලදී. එය කොළඹ 07, ආනන්ද කුමාරස්වාමී මාවතේ අංක 72 දරන ස්ථානයේ පිහිටා ඇත.

1985 අංක 02 දරන බලශක්ති සංරක්ෂණ අරමුදල් පනත අහෝසි කොට ඒ වෙනුවට 2007 අංක 35 දරන ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරි පනත බලාත්මක කරන ලදී. 2007 සැප්තැම්බර් 30 දින දක්වා බලශක්ති සංරක්ෂණ අරමුදල යටතේ පැවැති වත්කම් හා වගකීම් සියල්ලම 2007 ඔක්තෝබර් 1 දින සිට ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ ගිණුම් වෙත පවරන ලදී.

1.2 අධිකාරියේ ප්‍රධාන ක්‍රියාකාරකම්

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ ප්‍රධාන ක්‍රියාකාරකම් වන්නේ බලශක්ති සංවර්ධන ක්ෂේත්‍ර ප්‍රකාශයට පත් කිරීමද ඇතුළුව පුනර්ජනනීය බලශක්ති ප්‍රභව සංවර්ධනය කිරීම, බලශක්ති කාර්යක්ෂමතා හා සංරක්ෂණ විධිවිධාන ක්‍රියාවට නැංවීම, බලශක්ති සුරක්ෂිතතාව, විශ්වසනීයත්වය හා බලශක්ති සැපයුමෙහි පිරිවැය කාර්යක්ෂමතාව ප්‍රවර්ධනය කරන වැඩසටහන් පැවැත්වීම හා බලශක්ති සැපයුම හා ඉල්ලුමට අදාළ තොරතුරු කළමනාකරණය කිරීම යනාදියයි.

1.3 අධිකාරියේ අරමුදල්

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරී පනතේ විධිවිධානවලට අනුව ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය අරමුදල් 3 ක් පවත්වා ගත යුතු වේ. එනම්:

1.3.1 අධිකාරියේ අරමුදල

මෙම අරමුදල් පවත්වා ගනු ලැබෙනුයේ පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද ආරම්භක ප්‍රාග්ධනය, බලපත්‍ර ගාස්තු, ණය, කල්බදු කුලී ගාස්තු හා අනෙකුත් ලැබෙන මුදල් නැන්පත් කිරීම සඳහාය. පනතේ විධිවිධාන ප්‍රකාරව අධිකාරිය විසින් තමන් වෙත පැවරී ඇති බලතල, කාර්යභාරයන් හා රාජකාරීන් ඉටු කිරීමේදී දරන්නට සිදු වන වියදම් ආවරණය කිරීම සඳහා අවශ්‍ය සියලු මුදල් මෙම අරමුදලින් ගෙවනු ලැබේ.

1.3.2 ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අරමුදල

මෙම පනත පවත්වා ගනු ලබන්නේ ඒකාබද්ධ අරමුදලින් ලද ආරම්භක ප්‍රදාන, සෙස් බදුවලින් ඉදිරියට ගෙන ආ ශේෂ, හිමිකම් ගාස්තු, ව්‍යාත්තීය සේවා සඳහා අයකරනු ලැබෙන ගාස්තු, කල්බදු කුලී වෙනින් ලැබෙන මුදල්, අයදුම්පත් ගාස්තු හා කාබන් වත්කම් කළමනාකරණය කිරීමේ ගාස්තු තැන්පත් කිරීම සඳහාය.

පුනර්ජනනීය බලශක්ති සංරක්ෂණාගාර සඳහා වන සහනාධාර, බලශක්ති කාර්යක්ෂම උපකරණ හා තාක්ෂණයන් ප්‍රවර්ධනය කිරීම සඳහා වන සහනාධාර, ඉන්ධන මාරු කිරීම උදෙසා ගෙවන සහනාධාර, දැනුම්වත් කිරීමේ වැඩසටහන් සඳහා වැය වන වියදම් හා බලශක්ති සංරක්ෂණ විධිවිධාන දිරිගැන්වීමේ දිරි දීමනා යනාදිය ගෙවනු ලබන්නේ මෙම අරමුදලිනි.

1.3.3 සුනිත්‍ය ඇප අරමුදල

මෙම අරමුදලේ අරමුණ වන්නේ බලශක්ති කාර්යක්ෂමතාවට අදාළ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ණය ලබා ගැනීමට අයදුම් කරන ආයෝජකයන් වෙනුවෙන් ඇපකර ලබා දීමයි. පනතේ විධිවිධානවලට අනුව, ඒකාබද්ධ අරමුදලෙන් ආරම්භක ප්‍රාග්ධනයක්, නිකුත් කරන ඇපකර සඳහා වාර්ෂික මුල් මුදලක් හා පොලියක් සහ අධිකාරියේ අරමුදල වෙනින් ලැබෙන මුදල් මෙම අරමුදලට බැර කළ යුතුය.

1.4 සේවක සංඛ්‍යාව

2020 දෙසැම්බර් 31 දිනට ආයතනයේ සේවක සංඛ්‍යාව 101 කි.

2.1 වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සාරාංශය

2.1.1 පිළියෙළ කිරීමේ පදනම සහ අනුකූලතාව

ගිණුම්කරණ ප්‍රතිපත්තිද ඇතුළුව 2020 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ ශේෂ පත්‍රය, ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස් වීම පිළිබඳ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙළ කොට ඇත්තේ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූලවය.

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල්වලින් ඉදිරිපත් කර ඇත. මෙම මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය සම්මුතිය යටතේ උපචිත පදනම මත පිළියෙළ කර ඇත. සුදුසු අවස්ථාවලදී ගිණුම්කරණ ප්‍රතිපත්ති, සටහන් මඟින් හෙළිදරවු කර තිබේ.

2.1.2 සංසන්දනාත්මක සංඛ්‍යා

වත්මන් මූල්‍ය වර්ෂයට අදාළ ඉදිරිපත් කිරීමෙහි වෙනස්වීම්වලට ගැලපෙන පරිදි සංසන්දනාත්මක සංඛ්‍යා ගලපා ඇත. 2019 වසරට අදාළ සංසන්දනාත්මක සංඛ්‍යා ප්‍රතිප්‍රකාශිතය.

2.2.1 රජයේ ප්‍රදාන වෙනුවෙන් ගිණුම්කරණය හා රජයේ සහාය හෙළිදරවු කිරීම

රජයෙන් ලැබෙන ප්‍රදාන ප්‍රාග්ධන ප්‍රදාන හා පුනරාවර්තන ප්‍රදාන ලෙස කාණ්ඩ දෙකකට බෙදා ඇත. කාර්ය මණ්ඩල වැටුප්, ගොඩනැගිලි කුලී වැනි පුනරාවර්තන වියදම් අවශ්‍යතා ඉටු කර ගනු පිණිස පුනරාවර්තන ප්‍රදාන යොදා ගැනේ. ස්ථාවර වත්කම් මිල දී ගැනීමේ හා වැඩසටහන් (ක්‍රියාකාරකම්) වියදම් ආවරණය කර ගැනීමේ අරමුණු සඳහා ප්‍රාග්ධන ප්‍රදාන යොදා ගැනේ. ක්‍රියාකාරකම්/වැඩසටහන් වියදම් පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම්වලින් සමන්විත වන බැවින් ඒවා ප්‍රාග්ධන ප්‍රදානවලින් දරනු ලැබේ.

ස්ථාවර වත්කම් මිල දී ගැනීම සඳහා භාවිත කෙරෙන රජයේ ප්‍රාග්ධන ප්‍රදාන වසර සඳහා ආදායමක් ලෙස සැලකේ.

ක්‍රියාකාරකම්/වැඩසටහන් වියදම්වලට අදාළ ප්‍රදාන, වැඩසටහන්/ක්‍රියාකාරකම් වියදම් සඳහා ප්‍රාග්ධන ප්‍රදාන යටතේ ආදායම් ප්‍රකාශනයෙහි බැරකමක් ලෙස ඉදිරිපත් කෙරේ.

2.2.2 විදේශ ආධාර සඳහා ගිණුම්කරණය

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය විදේශ ආධාර මත ව්‍යාපෘති රැසක් ක්‍රියාත්මක කරයි. ඒ සඳහා වැඩි වශයෙන්ම සහාය ලැබෙනුයේ ආසියානු සංවර්ධන බැංකුව හා එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන වෙතින් ණය හා ප්‍රදාන වශයෙනි. කෙසේ වෙතත්, ඇතැම් ගෙවීම් හා ණය සඳහා මුදල් ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ නිර්දේශ මත සෘජුවම ශ්‍රී ලංකා මහ බැංකුව හා ආසියානු සංවර්ධන බැංකුව වෙතින් ලබා ගැනේ. ඒවා මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්ගත කර ඇත.

2.2.3 දිගු කාලීන ආයෝජන සඳහා ගිණුම්කරණය

ආයෝජන රජයේ භාණ්ඩාගාර බිල්පත් හා ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ ස්ථාවර තැන්පතු ස්වරූපයෙන් සිදු කෙරෙන අතර පිරිවැය පදනම මත ප්‍රකාශිතය. ස්ථාවර තැන්පතු හා භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජන වෙතින් වසර අවසානයේදී ලැබිය යුතු පොලී අදාළ අරමුදල වෙත බැර කෙරේ.

2.2.4 ආදායම හඳුනා ගැනීම

බලශක්ති බලපත්‍ර ගාස්තු, විදුලි බලය විකිණීමෙන් ලැබෙන ආදායම, පුනර්ණූ පාඨමාලා ගාස්තු, ප්‍රදර්ශනවලින් ලැබෙන ආදායම, උපකරණ කුලියට දීමෙන් ලැබෙන ආදායම හා වෙනත් ආදායම් 'ආදායම්' යන්නෙන් නියෝජනය වේ.

සුනිත්‍ය ඇපකර අරමුදල වෙතින් ලැබෙන පොලියෙන් කොටසක් ආදායමක් ලෙස සැලකෙන අතර කොටසක් නැවත ආයෝජනය කෙරේ. අරමුදල පවත්වා ගැනීමේ පිරිවැය/අරමුදලට ලැබෙන ආදායම ආවරණය කිරීමට ඉන් කොටසක් යොදා ගැනේ.

2.2.5 අසම්භව්‍ය වගකීම් සහ අසම්භව්‍ය වත්කම්

2008 මාර්තු 31 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් ලංකා විදුලිබල මණ්ඩලය වෙත රු. මිලියන 897 ක් ලෙස ඇස්තමේන්තුගත කර ඇති වටිනාකමක් සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති නිපැයුම් වෙතින් විදුලිය මිලට ගැනීම වෙනුවෙන් ගෙවීම අවශ්‍ය වේ. මේ වන විට, මහා භාණ්ඩාගාරය වෙතින් ලැබෙන ප්‍රදාන අරමුදලක් හෝ සෙස්, හිමිකම් ගාස්තු ආදි ස්වරූපයෙන් සිදු කරන ඉපැයීමක් හෝ වන්නේ නම් මිස ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය සතුව එම ගෙවීම සිදු කිරීමේ කිසිදු මාර්ගයක් නොමැත. මේ නිසා, එය අසම්භාව්‍ය වගකීමක් ලෙස පමණක් හෙළිදරවු කර ඇත.

එසේම, ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය, හම්බන්තොට සූර්ය බලාගාරයෙන් ජනනය කෙරෙන විදුලිය මාසික පදනමක් මත ලංකා විදුලිබල මණ්ඩලය වෙත අලෙවි කරයි. කෙසේ වෙතත්, 2020 වසරේ අවසන් මාස කිහිපය තුළ එලෙස අලෙවි කරන ලද විදුලිබල නිෂ්පාදනය සඳහා ගෙවීම් ලැබුණේ 2021 වසරේදීය.

2.3 දේපල, පිරියත හා උපකරණ

2.3.1 පිරිවැය හා තක්සේරු කිරීම

ස්ථාවර වත්කම්, සමුච්චිත ක්ෂය කිරීම්වලින් පිරිවැය අඩු කොට දක්වනු ලැබේ. ස්ථාවර වත්කම් සඳහා හානිකරණ ප්‍රතිපාදන ගණනය කරනු ලබන්නේ සෘජු රේඛීය ක්‍රමය අනුව වේ. හම්බන්තොට සූර්ය බලාගාරයෙන් විදුලිය ලබා දීමට අදාළව ලංකා විදුලිබල මණ්ඩලය සමඟ එළැඹ ඇති බලශක්තිය මිලට ගැනීමේ ගිවිසුම 2031 වසරේදී ඉකුත් වේ. මේ නිසා, එකී බලාගාරයේ නැවත තක්සේරු කරන ලද ස්ථාවර වත්කම් ඉදිරි වසර 12 ක කාලය තුළ ක්ෂය කිරීමට ලක් කරනු ඇත.

හම්බන්තොට සූර්ය බලාගාරය 2018 දී නැවත තක්සේරු කරන ලදි.

මූල්‍ය ප්‍රකාශනවලට සටහන්

2.3.2 ක්ෂය කිරීම්

ස්ථාවර වත්කම් මත ක්ෂය කිරීම් අනුපාත තීරණය කරනුයේ වත්කම්වල ඇස්තමේන්තුගත ආයු කාලය මත පදනම්ව වන අතර එය සංශෝධනය කිරීම්වලට ලක් විය හැක. දැනට පවතින අනුපාත පහත දැක්වේ:

අයිතමය	ක්ෂය අනුපාතය
ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ	25%
මෝටර් වාහන	20%
ඡායා පිටපත් යන්ත්‍ර	25%
පරිගණක	33.33%
විදුලි භාණ්ඩ	25%
පුස්තකාල පොත්	20%
බලශක්ති උපකරණ	33.33%
ප්‍රදර්ශන උපකරණ	25%
සුළං කුළුණු	20%
ගොඩනැගිලි හා ඉදිකිරීම්	5%
ශීතකරණ පරීක්ෂණාගාරය	20%
සූර්ය බලශක්ති/කුඩා ජල බලශක්ති ව්‍යාපෘති	
සූර්ය පැනල	8.33%
ලෝහමය ව්‍යූහ/ඉදිකිරීම්	8.33%
ගොඩනැගිලි	5%
විදුලි බෙදහැරීම් පාලක	8.33%
අපවර්තන	8.33%
ට්‍රාන්ස්ෆෝමර්	8.33%
විදුලි ඉලෙක්ට්‍රොනික් උපකරණ	8.33%
සනීපාරක්ෂාව හා ජලනල වැඩ	8.33%
රැහැන්	8.33%
ගෘහභාණ්ඩ සවිකිරීම් හා කාර්යාල උපකරණ	25%
මෙවලම්	8.33%
යන්ත්‍රපුත්‍ර	20%
වෙනත්	20%

2.3.3 අස්පෘශ්‍ය වත්කම්

වෙන වෙනම අස්පෘශ්‍ය වත්කම් අත්පත් කර ගනු ලැබෙන අතර පිරිවැය මත ආරම්භක හඳුනා ගැනීම පාදකව මිනුම්ගත කෙරේ. ව්‍යාපාරික සංයෝගකරණයකදී අත්පත් කර ගනු ලැබෙන අස්පෘශ්‍ය වත්කම්වල පිරිවැය මිනුම්ගත කරනුයේ අත්පත් කර ගන්නා දිනට පැවැති ඒවායෙහි සාධාරණ අගය මත ය. ආරම්භක හඳුනා ගැනීමෙන් අනතුරුව, සමුච්චිත ක්‍රමක්ෂය හා සමුච්චිත හානිකරණ අලාභ (තිබේ නම්) අඩු කොට පිරිවැය ක්‍රමයට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි දක්වනු ලැබේ.

අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය කරනුයේ ඒවායෙහි තක්සේරුගත ප්‍රයෝජනයට ගත හැකි ආයු කාල සැලකිල්ලට ගෙන (ගිවිසුම් කාල සීමාව ඉක්මවා නොයන) සරල රේඛීය පදනමක් මත වේ.

2.3.4 2020 දෙසැම්බර් 31 දිනට පූර්ණ වශයෙන් ක්ෂය කිරීමට ලක් වූ එහෙත් භාවිත වෙමින් පැවති වත්කම්

ගෘහ භාණ්ඩ හා සවිකිරීම්	18,720,462/-
මෝටර් වාහන	51,186,495/-
ඡායා පිටපත් යන්ත්‍ර	2,994,191/-
පරිගණක	34,810,610/-
විදුලි උපකරණ	429,197/-
පුස්තකාල පොත්	1,438,352/-
බලශක්ති උපකරණ	91,583,387/-
සුළං කුළුණු	47,238,802/-
ශීතකරණ පරීක්ෂණාගාර	42,165,337/-
සූර්ය බලශක්ති/කුඩා ජල බලශක්ති ව්‍යාපෘති	
ගෘහ භාණ්ඩ හා සවිකිරීම්	3,014,514/-
යන්ත්‍රෝපකරණ	4,001,375/-
වෙනත්	60,039,664/-
ප්‍රදර්ශන උපකරණ	354,853/-
UNDP ව්‍යාපෘති උපකරණ	19,500/-

2.4 වගකීම් හා ප්‍රතිපාදන

2.4.1 පාරිතෝෂික

මූල්‍ය වර්ෂයේ අවසන් මාසය මත පදනම්ව සේවා කාලයට අදාළ සෑම වසරක්ම සඳහා සේවකයාගේ වැටුපෙන් අඩකඩ සමාන වටිනාකමක් ගිමිකම් ලබන සේවකයන් සියලුම දෙනා වෙනුවෙන් වෙන් කෙරේ.

2.4.2 සේවක අර්ථසාධක අරමුදල හා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල

අදාළ රීති හා රෙගුලාසිවලට අනුකූලව සේවක අර්ථසාධක අරමුදල හා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල වෙත දායක වීමට සේවකයන් ගිමිකම් කියයි. ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය එම අරමුදල් වෙත දක්වන දායකත්වය පිළිවෙළින් 12% ක් හා 3% ක් වේ.

2.4.3 ඉඳුරන ඉඩම

ජල බලශක්ති ප්‍රවර්ධනය සඳහා වන සරච්චන්ද්‍ර රාජකරුණා අනුස්මරණ මධ්‍යස්ථානය වෙනුවෙන් පාර්ලිමේන්තු මන්ත්‍රී හර්ෂණ රාජකරුණා මහතා විසින් පරිත්‍යාග කරන ලද ඉඳුරන ඉඩමේ (රූම් 2, පර්චස් 32.32)හිමිකම් ඔප්පුව මෙතෙක් තක්සේරු කර නොමැත. මේ නිසා, එය මූල්‍ය ප්‍රකාශනවල වත්කමක් ලෙස දක්වා නොමැත.

2.4.4 කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය

2020 දෙසැම්බර් 31න් අවසන් වූ වසර සඳහා වන මෙම මූල්‍ය ප්‍රකාශන සඳහා 2021 මැයි 20 දින කළමනාකරණ මණ්ඩලය විසින් අනුමැතිය ලබා දෙන ලදී.

2020 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා

(සියලු අගයන් ශ්‍රී ලංකා රුපියල්වලිනි)

03 සටහන - මෙහෙයුම් ආදායම

	සටහන	2020	2019 ප්‍රතිප්‍රකාශිත
භාණ්ඩාගාර ආදායම (ප්‍රාග්ධනය)	7	**75,904,009**	65,600,000
භාණ්ඩාගාරයෙන් ආදායම (ප්‍රාග්ධනය)	8	**38,418,410**	46,572,033
ක්‍රමක්ෂිත විලම්බිත ප්‍රදාන		**113,112,314**	103,688,168
භාණ්ඩාගාරයෙන් ආදායම (පුනරාවර්තී)	FARDF (17)	**-**	-
බලශක්ති උත්පාදනය - හම්බන්තොට		**31,001,480**	21,915,211
බලශක්ති උත්පාදනය - ඉඳුරන		**1,694,889**	1,846,645
බලශක්ති කළමනාකරුවන් පුහුණු වැඩසටහනේ ආදායම		**55,750**	25,000
බලශක්ති කළමනාකරණ මාර්ගෝපදේශය		**500**	-
සූර්ය බලශක්ති සිතියමේ ආදායම		**25,000**	35,000
සුළං දත්ත ආදායම		**2,000,000**	-
බලශක්ති විගණන ආදායම		**-**	88,000
බලශක්ති බලපත්‍ර ආදායම		**26,435,330**	24,818,830
සූර්ය බලශක්ති ලියාපදිංචි ගාස්තු		**6,067,900**	16,190,700
සූර්ය බලශක්ති උපකරණ ලියාපදිංචි ගාස්තු		**-**	153,425
සූර්ය බලශක්ති පුහුණු වැඩසටහන් ආදායම		**-**	-
එකතුව		**294,715,582**	280,933,012

04 සටහන - මෙහෙයුම් නොවන ආදායම

	සටහන	2020	2019 ප්‍රතිප්‍රකාශිත
UNDP ව්‍යාපෘති (NAMA)		**3,782,513**	4,521,803
ටෙන්ඩර් ගාස්තු		**30,500**	64,000
සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ ගාස්තු		**192,250**	235,250
ආපදා ණය පොලී		**336,204**	553,477
වෙනත් ආදායම්		**930,910**	295,908
විශේෂ අත්තිකාරම් පොලිය		**1,836**	4,244
විදුල්කා ප්‍රදර්ශන කුටි ලියාපදිංචි ගාස්තු		**-**	2,300,000
UNDP ව්‍යාපෘති (ජෛවස්කන්ධ)		**-**	11,664,000
බලශක්ති අරමුදලෙන් ආදායම	9	**19,817,444**	44,628,149
පොලී ආදායම		**8,476,059**	9,143,908
ස්ථාවර වත්කම් බැහැර කිරීම		**-**	12,359,442
වාහන		**7,800,000**	-
එකතුව		**41,367,716**	85,770,181

මූල්‍ය ප්‍රකාශනවලට සටහන්

05 සටහන - ව්‍යාපෘති වියදම්

05-1 සටහන පුනර්ජනනීය බලශක්තිය

	2020	2019 ප්‍රතිප්‍රකාශිත
සම්පත් වෙන් කිරීම හා සංවර්ධනය	717,075	3,802,791
ප්‍රගති අධීක්ෂණය	245,375	371,484
තාක්ෂණික සංවර්ධන හා පර්යේෂණ	-	1,435,479
ආධාර මඟින් මූල්‍ය සම්පාදනය කෙරෙන ව්‍යාපෘති - UNDP ජෙවස්කන්ධ	-	9,068,613
ආධාර මඟින් මූල්‍ය සම්පාදනය කෙරෙන ව්‍යාපෘති - ADB (L 2892 SRI)	-	47,820
NAMA ව්‍යාපෘතිය	102,805	16,572,380
හම්බන්තොට පුනර්ජනනීය බලශක්ති වැඩ බිමේ මෙහෙයුම්	9,352,292	8,684,008
ඉඳුරන බලාගාරයේ මෙහෙයුම්	2,653,900	580,379
විදුලිබල සැපයුමේ විශ්වසනීයත්වය ඉහළ නැංවීමේ ව්‍යාපෘතිට සහාය වීම	5,380	60,697
සූර්ය බල සංග්‍රාමය	22,842,572	7,852,919
එකතුව	35,919,399	48,476,570

05-2 සටහන - බලශක්ති කළමනාකරණය

	2020	2019 ප්‍රතිප්‍රකාශිත
බලශක්ති කළමනාකරණ පර්ශදයක් පිහිටුවීම	269,583	1,520,776
ප්‍රමිති හා නියාමන රෙගුලාසි හඳුන්වා දීම	2,350,895	1,903,381
උපදේශනාත්මක මග පෙන්වීම් හා සේවා සැපයීම්	1,994,889	61,065
ජයග්‍රහණ ඇගයීමට ලක් කිරීම	529,962	1,865
ක්ෂේත්‍ර විශේෂිත වැඩසටහන්	206,025	389,450
පර්යේෂණ හා සංවර්ධන වැඩසටහන්	-	1,911,600
බලශක්ති විගණන වැඩසටහන්	15,839	44,797
ඉල්ලුම කළමනාකරණය වැඩසටහන්	8,852,137	27,345,571
නියමු ව්‍යාපෘති ස්ථාපිත කිරීම	-	17,150
එකතුව	14,219,330	33,195,655

05-3 සටහන - දැනුම් කළමනාකරණය

	2020	2019 ප්‍රතිප්‍රකාශිත
බලශක්ති අධ්‍යාපන වැඩසටහන්	416,301	1,240,828
ප්‍රවර්ධන වැඩසටහන්	5,320,594	6,148,110
විදුල්කා ප්‍රදර්ශනය	-	1,574,832
එකතුව	5,736,895	8,963,770

05-4 සටහන - උපායමාර්ගික ක්‍රියාකාරකම්

	2020	2019 ප්‍රතිප්‍රකාශිත
සූර්ය බලශක්ති පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය ක්‍රියා කරවීම	**44,145**	18,220
තාක්ෂණික සංවර්ධන	**1,450,603**	1,908,997
පුනරීන් බලශක්ති උද්‍යානය	**3,360,805**	235,909
සූර්ය බලශක්ති උද්‍යානය	**396,000**	6,539,920
සුළං බල සංවර්ධනය	**476,362**	964,762
එකතුව	**5,727,915**	9,667,808

06 සටහන - පුනරාවර්තන වියදම්

06-1 වැටුප් හා දීමනා

	2020	2019 ප්‍රතිප්‍රකාශිත
කාර්ය මණ්ඩල වැටුප්	**63,368,727**	52,901,697
ජීවන වියදම් දීමනාව	**9,034,740**	8,381,360
ගැලපුම් දීමනා	**-**	417,633
සේවක අර්ථසාධක අරමුදල 12%	**9,178,492**	7,969,448
සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල 3 %	**2,294,624**	1,992,362
අනිකාල දීමනා හා නිවාඩු දින වැඩ කිරීම වෙනුවෙන් ගෙවීම	**6,155,547**	8,129,782
තමන්ගේම වාහන භාවිත කිරීම්	**1,350,000**	1,801,667
ඉන්ධන දීමනා	**1,997,597**	2,070,024
ඍත්තිය දීමනා	**4,413,540**	5,090,400
NAITA වැටුප්	**474,500**	1,412,500
පාරිතෝෂික වියදම්	**9,917,344**	2,035,590
එකතුව	**108,185,111**	92,202,463

06-2 සටහන - ගමන් වියදම් හා සංයුක්ත දීමනා

	2020	2019 ප්‍රතිප්‍රකාශිත
ගමන් වියදම් - දේශීය	**708,413**	1,231,131
ගමන් වියදම් - විදේශීය	**61,525**	415,992
එකතුව	**769,938**	1,647,123

06-3 සැපයුම්

	2020	2019 ප්‍රතිප්‍රකාශිත
මුද්‍රණ, ලිපි ද්‍රව්‍ය හා කාර්යාල අවශ්‍යතා	**1,251,996**	763,980
ඉන්ධන හා ලිහිසි ද්‍රව්‍ය	**3,287,329**	3,105,432
වෙනත් - පුවත්පත් හා විවිධ සේවා	**109,420**	106,990
එකතුව	**4,648,745**	3,976,402

මූල්‍ය ප්‍රකාශනවලට සටහන්

06-4 සටහන - නඩත්තු

	2020	2019 ප්‍රතිප්‍රකාශිත
වාහන, රක්ෂණ හා බලපත්‍ර ගාස්තු	**7,814,316**	9,445,109
බලාගාර යන්ත්‍රෝපකරණ	**342,171**	49,950
කාර්යාල උපකරණ	**23,633**	785,933
ගොඩනැගිලි හා ඉදිකිරීම්	**179,048**	7,774
එකතුව	**8,359,168**	10,288,766

06-5 සටහන - කොන්ත්‍රාත් සේවා

	2020	2019 ප්‍රතිප්‍රකාශිත
කාර්යාල කුලී සහ කුලී ගාස්තු	**50,752,980**	50,199,531
තැපැල් හා විදුලි සංදේශ ගාස්තු	**3,173,271**	5,276,668
ප්‍රවාහන	**159,349**	434,076
විගණන ගාස්තු	**750,000**	798,600
එකතුව	**54,835,600**	56,708,875

06-6 - ක්ෂය කිරීම්, හානි කිරීම් හා ක්‍රමක්ෂය කිරීම්

	2020	2019 ප්‍රතිප්‍රකාශිත
ලී බඩු හා කාර්යාල උපකරණ	**683,361**	689,991
මෝටර් වාහන	**771,749**	1,169,946
ඡායා පිටපත් යන්ත්‍ර	**232,688**	453,938
පරිගණක	**1,696,887**	1,158,906
විදුලි උපකරණ	**4,442**	4,442
පුස්තකාල පොත්	**197,000**	197,000
බලශක්ති උපකරණ	**1,803,930**	1,845,700
සුළං කුළුණු හා උපකරණ	**1,708,811**	1,029,340
හම්බන්තොට හා ඉඳුරන බලශක්ති උද්‍යාන	**34,778,528**	34,160,832
UNDP ව්‍යාපෘති සඳහා ස්ථාවර වත්කම්	**104,465**	104,860
විදුලි පංකා පරීක්ෂණ විද්‍යාගාරය	**977,139**	
කල්බදු ඉඩම් ක්‍රමක්ෂය කිරීම	**1,528,548**	1,528,548
අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය කිරීම	**1,838,909**	1,782,167
එකතුව	**46,326,457**	44,125,670

06-7 සටහන - වෙනත් පුනරාවර්තී වියදම්

	2020	2019 ප්‍රතිප්‍රකාශිත
කාර්යාල හා විවිධ වියදම්	**5,844,658**	1,117,548
පුවත්පත් වෙළෙඳ දැන්වීම්	**464,454**	184,275
රක්ෂණ	**2,539,340**	2,445,673
භාෂා පරිවර්තන ගාස්තු	**3,783**	206,981
කළමනාකරණ මණ්ඩල රැස්වීම් වියදම්	**793,970**	1,349,218
සංග්‍රහ වියදම්	**497,199**	489,633
දේශීය/විදේශීය පුහුණු වැඩසටහන්	**974,994**	3,467,135
බැංකු ගාස්තු	**47,784**	80,896
බදු වියදම් (හිමිකම් නොකී VAT, NBT හා WHT)	**-**	1,773,827
එකතුව	**11,166,182**	11,115,186

07 සටහන - භාණ්ඩාගාරයෙන් ආදායම (ප්‍රාග්ධනය)

	2020	2019 ප්‍රතිප්‍රකාශිත
මහා භාණ්ඩාගාරයෙන් ලද ප්‍රාග්ධන ප්‍රදාන	**75,904,009**	65,600,000
එකතුව	**75,904,009**	65,600,000

08 සටහන - ක්‍රමක්ෂිත විලම්බිත ප්‍රදාන

	2020	2019 ප්‍රතිප්‍රකාශිත
වත්මන් වසර සඳහා ක්ෂය කිරීම්	**38,418,410**	46,572,033
එකතුව	**38,418,410**	46,572,033

09 සටහන - බලශක්ති අරමුදලෙන් ලද ආදායම

	2020	2019 ප්‍රතිප්‍රකාශිත
බලශක්ති කළමනාකරණ ආදායම	**583,720**	1,723,450
පුනර්ජනනීය බලශක්තිය වෙතින් ආදායම	**5,270,000**	30,219,000
ශුද්ධ පොලී ආදායම	**13,963,724**	12,685,699
එකතුව	**19,817,444**	44,628,149

මූල්‍ය ප්‍රකාශනවලට සටහන්

10 සටහන - දේපල, පිරියත හා උපකරණ

2020 දෙසැම්බර් 31 දිනට

10-1 සටහන - නිදහස් වත්කම්

විස්තරය	2020.01.01 දිනට ප්‍රතිප්‍රකාශිත ශේෂය	අත්පත් කරගැනීම	ප්‍රතිතක්සේරුව	බැහැර කිරීම	2020.12.31 දිනට ශේෂය
ඉඩම - හම්බන්තොට	101,217,000				101,217,000
ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ	21,334,865	402,589	-	-	21,737,454
මෝටර් වාහන	51,186,495	7,800,000	-	-	58,986,495
ඡායා පිටපත් යන්ත්‍ර	4,809,941	-	-	-	4,809,941
පරිගණක	38,859,909	274,600	-	-	39,134,509
විදුලි භාණ්ඩ	446,964	-	-	-	446,964
පුස්තකාල පොත්	1,438,352	-	-	-	1,438,352
බලශක්ති උපකරණ	96,995,177	2,057,250	-	-	99,052,427
සුළං කුළුණු හා උපකරණ	65,961,089	1	-	-	65,961,090
ශීතකරණ පරීක්ෂණාගාර	42,165,337	-	-	-	42,165,337
විදුලි පංකා පරීක්ෂණ විද්‍යාගාරය	4,885,693	-			4,885,693
සූර්ය බලශක්ති/සුළු ජල බලශක්ති ව්‍යාපෘති					
අ. සූර්ය පැනල	79,329,510	-		-	79,329,510
ආ. ලෝහ වියුහ/ඉදිකිරීම්	57,650,000	-		-	57,650,000
ඇ. ගොඩනැගිලි	131,017,606	-		-	131,017,606
ඈ. විදුලි බෙදහැරුම් පාලක	10,007,800	-		-	10,007,800
ඊ. අපවර්තන	61,054,625	-		-	61,054,625
උ. ට්‍රාන්ස්ෆෝමර්	4,700,000	-		-	4,700,000
ඌ. විදුලි ඉලෙක්ට්‍රොනික් උපකරණ	31,619,040	-		-	31,619,040
එ. සනීපාරක්ෂක හා ජල පොම්ප සවිකිරීම්	82,881,814	-		-	82,881,814
ඒ. රැහැන්	30,000,000	-		-	30,000,000
ඔ. ගෘහභාණ්ඩ සවි කිරීම් හා කාර්යාල උපකරණ	3,057,984	1,092,760		-	4,150,744
ඕ. මෙවලම්	5,700,000	-		-	5,700,000
ක. යන්ත්‍රෝපකරණ	9,240,841	43,317	-	-	9,284,158
ග. වෙනත්	60,045,364	58,000	-	-	60,103,364
ප්‍රදර්ශන උපකරණ	354,853	-	-	-	354,853
UNDP ව්‍යාපෘති සඳහා ස්ථාවර වත්කම්	524,300	-	-	-	524,300
එකතුව	996,484,559	11,728,517	-	-	1,008,213,076

ක්ෂය කිරීම් ගිණුම

විස්තරය	2019.01.01 දිනට ප්‍රතිප්‍රකාශිත ශේෂය	ක්ෂය කිරීම්	බැහැර කිරීම	2020.12.31 දිනට සමුච්චිත ක්ෂය කිරීම්	2020.12.31 දිනට ශුද්ධ පොත් අගය
ඉඩම - හම්බන්තොට	-	-	-	-	101,217,000
ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ	19,434,920	683,360		20,118,280	1,619,174
මෝටර් වාහන	51,013,104	771,748		51,784,852	7,201,643
ඡායා පිටපත් යන්ත්‍ර	4,400,477	232,687		4,633,164	176,777
පරිගණක	35,192,146	1,696,886		36,889,032	2,245,477
විදුලි භාණ්ඩ	438,081	4,442		442,523	4,441
පුස්තකාල පොත්	1,241,352	197,000		1,438,352	-
බලශක්ති උපකරණ	93,231,095	1,803,930		95,035,025	4,017,402
සුළං කුළුණු හා උපකරණ	60,848,440	1,708,811		62,557,251	3,403,839
ශීතකරණ පරීක්ෂණාගාර	41,587,728	-		41,587,728	577,609
විදුලි පංකා පරීක්ෂණ විද්‍යාගාරය	1,472,400	977,140		2,449,540	2,436,153
සූර්ය බලශක්ති/සුළු ජල බලශක්ති ව්‍යාපෘති					
අ. සූර්ය පැනල	6,610,793	6,610,792		13,221,585	66,107,925
ආ. ලෝහ ව්‍යූහ/ඉදිකිරීම්	4,804,167	4,804,167		9,608,334	48,041,666
ඇ. ගොඩනැගිලි	54,112,098	6,550,880		60,662,978	70,354,628
ඈ. විදුලි බෙදහැරුම් පාලක	834,014	833,983		1,667,997	8,339,803
ඉ. අපවර්තන	5,087,886	5,087,886		10,175,772	50,878,853
උ. ට්‍රාන්ස්ෆෝමර්	391,667	391,667		783,334	3,916,666
ඌ. විදුලි ඉලෙක්ට්‍රොනික් උපකරණ	31,619,040	-		31,619,040	-
එ. සනීපාරක්ෂක හා ජල පොම්ප සවිකිරීම්	6,906,818	6,906,818		13,813,636	69,068,178
ඒ. රැහැන්	2,500,000	2,500,000		5,000,000	25,000,000
ඔ. ගෘහභාණ්ඩ සවි කිරීම් හා කාර්යාල උපකරණ	3,025,777	32,176		3,057,953	1,092,791
ඕ. මෙවලම්	475,000	-		475,000	5,225,000
ක. යන්ත්‍රෝපකරණ	4,588,728	1,055,678		5,644,406	3,639,752
ග. වෙනත්	60,040,539	4,477		60,045,016	58,348
ප්‍රදර්ශන උපකරණ	354,853	-		354,853	-
UNDP ව්‍යාපෘති සඳහා ස්ථාවර වත්කම්	344,323	104,465		448,788	75,512
එකතුව	490,555,446	42,958,993	-	533,514,439	474,698,637

10-2 සටහන - කල්බදු වත්කම්

විස්තරය	2020.12.31 දිනට ශේෂය	අත්පත් කරගැනීම	ක්‍රමක්ෂය කිරීම්	දෙසැම්බර් 31 දිනට ශේෂය
ඉඩම - බත්තරමුල්ල	38,977,984	-	1,528,548	37,449,436
එකතුව	38,977,984	-	1,528,548	37,449,436

11 සටහන - අස්පාශ්‍ය වත්කම්

විස්තරය	දෙසැම්බර් 31 දිනට ශේෂය	අත්පත් කරගැනීම	ක්‍රමක්ෂය කිරීම්	දෙසැම්බර් 31 දිනට ශේෂය
පරිගණක මෘදුකාංග	2,285,407	2,026,415	1,838,909	2,472,914
දත්ත හා තොරතුරු	-	-	-	-
එකතුව	2,285,407	2,026,415	1,838,909	2,472,914

මූල්‍ය ප්‍රකාශනවලට සටහන්

12 සටහන - නොනිමි කාර්ය

	2020	2019 ප්‍රතිප්‍රකාශිත
සුනිත්‍ය බලශක්ති විශිෂ්ටතා මධ්‍යස්ථානය (SLSEA)	**23,290,653**	23,290,653
විදුලියෙන් ක්‍රියාත්මක වන අනුරූ වාහන	**7,956,800**	7,956,800
පුනරින් ව්‍යාපෘතිය	**23,726,194**	23,726,194
හම්බන්තොට සූර්ය බලශක්ති උද්‍යාන පුහුණු මධ්‍යස්ථානය ඉදිකිරීම	**1,540,962**	-
ඉඳුරන කුඩා ජල බලාගාරය	**15,211,901**	15,785,597
එකතුව	**71,726,510**	70,759,244

13 සටහන - ආයෝජන

ස්ථාවර තැන්පතු (ජා.ඉ.බැ, බොරැල්ල)

තැන්පතු ලියාපදිංචි අංකය	කල් පිරීම් දිනය	ආයෝජන අනුපාතය	2020 සඳහා ශුද්ධ පොලිය	2020.12.31 දිනට තැන්පතු	2020.01.01 දිනට තැන්පතු
2/0061/11/33861	9/21/21	5.50%	143,136	1,762,902	1,605,119
2/0061/11/33853	9/21/21	5.50%	143,136	1,762,902	1,605,119
2/0061/11/33888	9/21/21	5.50%	138,199	1,762,902	1,605,119
2/0061/11/33772	9/21/21	5.50%	143,136	1,762,902	1,605,119
2/0061/11/33837	9/21/21	5.50%	143,136	1,762,902	1,605,119
2/0061/11/33845	9/21/21	5.50%	143,136	1,762,902	1,605,119
2/0061/11/33756	9/21/21	5.50%	143,136	1,762,902	1,605,119
2/0061/11/33764	9/21/21	5.50%	143,135	1,762,902	1,605,119
2/0061/11/33802	9/21/21	5.50%	143,135	1,762,902	1,605,119
2/0061/11/33713	9/21/21	5.50%	143,135	1,762,902	1,605,119
2/0061/11/33896	9/21/21	5.50%	143,135	1,762,902	1,605,119
2/0061/11/33799	9/21/21	5.50%	143,135	1,762,902	1,605,119
2/0061/11/33870	9/25/21	5.50%	53,893	661,086	601,919
2/0061/09/60845	10/20/21	5.50%	54,918	657,083	598,273
2/0061/11/34051	9/30/21	5.50%	348,398	4,252,197	3,871,617
2/0061/09/49981	5/2/21	8.50%	1,245,364	13,061,250	11,820,136
Total			3,558,399	41,549,342	37,758,488

භාණ්ඩාගාර බිල්පත් - (මහජන බැංකු මූලස්ථානය)

තැන්පතු ලියා. අංකය	කල් පිරීම් දිනය	ආයෝජන අනුපාතය	2020 සඳහා ශුද්ධ පොලිය	2020.01.01 දිනට තැන්පතු	2020.01.01 දිනට තැන්පතු
LKB00523C152	15/01/2021	8.35%	1,851,933	21,977,070	19,893,930
LKB00323A151	09/07/2021	5.1%	3,065,727	48,277,107	44,680,340
එකතුව			4,917,660	70,254,177	64,574,270
මුළු ආයෝජනය				111,803,519	102,332,758

14 සටහන - ලැබිය යුතු දෑ

	2020	2019 ප්‍රතිප්‍රකාශිත
ස්ථාවර තැන්පතු මත ලැබිය යුතු පොලිය	**1,163,653**	1,396,109
භාණ්ඩාගාර බිල්පත් මත ලැබිය යුතු පොලිය	**2,928,372**	3,690,620
ලංකා විදුලිබල මණ්ඩලය - RCL කුලිය	**8,033,271**	8,033,271
බලශක්ති උත්පාදනය - හම්බන්තොට/ඉඳුරන	**10,814,850**	15,415,745
සේවකයන්ගෙන් අය විය යුතු මුදල්	**209,689**	213,589
සේවකයන්ගෙන් ලැබිය යුතු - දුරකතන ගාස්තු	**4,520**	4,520
විකිණීම් - ලැබිය යුතු දෑ (Energy Fund)	**-**	869,921
දේශීය පුහුණු වැඩසටහන්	**116,000**	82,000
Aitken Spence Travel	**6,309**	6,309
Heritance Ahungalla	**35,659**	35,659
එකතුව	**23,312,323**	29,747,743

15 සටහන - වෙනත් ජංගම වත්කම්

	සටහන	2020	2019 ප්‍රතිප්‍රකාශිත
ආපසු ගෙවනු ලබන තැන්පතුව			
ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය		**2,500**	2,500
වෛද්‍ය රක්ෂණ		**500**	500
ඉන්ධන ආදිය		**186,500**	186,500
හම්බන්තොට - ලංකා විදුලිබල මණ්ඩලය		**52,000**	52,000
ඉඳුරන - ලංකා විදුලිබල මණ්ඩලය		**62,500**	62,500
සූරියවැව - ලංකා විදුලිබල මණ්ඩලය		**1,500**	1,500
දුරකතන		**8,776**	8,776
හම්බන්තොට නේවාසිකාගාර කුලී		**132,000**	132,000
Spring Water Pvt Ltd		**3,500**	3,500
American Premium Water		**23,000**	23,000
මොබිටෙල්		**2,000**	2,000
W.D.G.S. Onil - ODSM		**-**	2,100,000
බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාව		**439,902**	520,233
විදුල්කා ප්‍රදර්ශනය		**25,000**	25,000
අත්තිකාරම්			
වැඩසටහන් ආදිය සඳහා අත්තිකාරම්		**405,622**	470,070
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - රුවන්වැල්ල		**6,341,674**	-
නැගෙනහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව		**911,329**	911,329
උතුරු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව		**790,191**	790,191
වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව		**-**	400,800
දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව		**1,544,949**	1,544,949
ලේකම් - ඌව/වයඹ පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය - NAMA		**1,391,750**	1,391,750
ප්‍රධාන ලේකම් දකුණු/නැගෙනහිර පළාත් - NAMA		**2,880,050**	2,880,050
අත්තිකාරම් - මාර්ග සංවර්ධන අමාත්‍යාංශ ලේකම් (මධ්‍යම) NAMA ව්‍යාපෘතිය		**2,231,265**	2,231,265
වෙනත්	22	**7,818,029**	6,785,378
එකතුව		**25,254,537**	20,525,791

මූල්‍ය ප්‍රකාශනවලට සටහන්

	2020	2019 ප්‍රතිප්‍රකාශිත
චක්‍රීය අරමුදල		
ආපදා ණය	**15,085,854**	13,100,565
විශේෂ අත්තිකාරම්	**51,385**	5,385
උත්සව අත්තිකාරම්	**24,489**	41,989
ගංවතුර ණය	**32,993**	319,645
	15,194,721	13,467,584
වෙනත් ජංගම වත්කම් එකතුව	**40,449,258**	33,993,375

16 සටහන - මුදල් හා මුදල්වලට සමාන දෑ

	2020	2019 ප්‍රතිප්‍රකාශිත
ජා.ඉ.බැ. ඉතුරුම් ගිණුම - 100610493406	**187,046,758**	180,115,763
මහජන බැංකු ජංගම ගිණුම - 078100188503576	**7,492,484**	4,227,731
මහජන බැංකු ජංගම ගිණුම - 078100278503576	**4,620,072**	4,620,072
ලංකා බැංකු ජංගම ගිණුම - 8002630	**1,069,504**	2,697,932
ලංකා බැංකු ජංගම ගිණුම - 74944408	**54,842,958**	48,209,002
ලංකා බැංකු ඉතුරුම් ගිණුම - 75803419	**198,149,579**	185,208,026
ලංකා බැංකු ජංගම ගිණුම - 80595356	**5,511,804**	12,235,101
එකතුව	**458,733,159**	437,313,627

17 සටහන - සමුච්චිත අරමුදල

2007 සැප්තැම්බර් 30 දිනට පැවැති බලශක්ති සංරක්ෂණ අරමුදලේ සමුච්චිත අරමුදල් 2007 ඔක්තෝබර් 1 දින සිට ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය වෙත පවරන ලදී. ඊට පහත දෑ ඇතුළත් වේ:

	2020	2019 ප්‍රතිප්‍රකාශිත
2007 සැප්තැම්බර් 30 දිනට සමුච්චිත අරමුදල	**7,076,392**	7,076,392
ආරම්භක ප්‍රාග්ධනය	**5,000,000**	5,000,000
ප්‍රාග්ධන ප්‍රදාන - විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය	**5,761,145**	5,761,145
UNDP ප්‍රාග්ධන ප්‍රදාන	**3,612,560**	3,612,560
ආහාර හා කෘෂිකර්ම සංවිධානයෙන් ලද ආධාර ප්‍රධාන	**650,239**	650,239
එකතුව	**22,100,336**	22,100,336

18 සටහන - විලම්බිත ප්‍රදාන

	2020	2019 ප්‍රතිප්‍රකාශිත
2008 ප්‍රාග්ධන ප්‍රදාන	**33,770,435**	33,770,435
2009 ප්‍රාග්ධන ප්‍රදාන	**11,955,533**	11,955,533
2009 විදෙස් ප්‍රදාන - ජපානය	**24,165,380**	24,165,380
2010 ප්‍රාග්ධන ප්‍රදානය - හම්බන්තොට සූර්ය බලශක්ති උද්‍යානය	**46,693,991**	46,693,991
- ක්‍රමක්ෂය නොවූ ප්‍රාග්ධන ප්‍රදාන	**10,646,819**	10,646,819
2010 විදෙස් ප්‍රදාන - ජපානය	**11,419,569**	11,419,569
2011 ප්‍රාග්ධන ප්‍රදාන - ඉඳුරන කුඩා ජල බලාගාරය	**15,523,945**	15,523,945
- ක්‍රමක්ෂය නොවූ ප්‍රාග්ධන ප්‍රදාන	**68,798,341**	68,798,341
2011 විදෙස් ප්‍රදාන - ජපානය	**1,155,016,402**	1,155,016,402
- කොරියානු	**191,097,075**	191,097,075
2012 විලම්බිත ප්‍රදාන - ආසියානු සංවර්ධන බැංකුව	**15,082,346**	15,082,346
2012 ප්‍රාග්ධන ප්‍රදාන	**23,581,236**	23,581,236
2013 විලම්බිත ප්‍රදාන - ආසියානු සංවර්ධන බැංකුව	**43,416,071**	43,416,071
2013 විලම්බිත ප්‍රදාන - KOICA	**35,662**	35,662
2013 ප්‍රාග්ධන ප්‍රදාන - FARDF	**41,873,961**	41,873,961
2014 ප්‍රාග්ධන ප්‍රදාන	**20,487,827**	20,487,827
2015 ප්‍රාග්ධන ප්‍රදාන	**14,655,015**	14,655,015
2016 ප්‍රාග්ධන ප්‍රදාන	**17,855,251**	17,855,251
2017 ප්‍රාග්ධන ප්‍රදාන	**19,806,619**	19,806,619
අඩු කළා:		
- ගත වූ වසරවල විලම්බිත ආදායම්	**(1,388,606,544)**	(1,342,034,511)
- වසර සඳහා විලම්බිත ආදායම	**(38,418,410)**	(46,572,033)
- ඉන්වර්ටර බැහැර කිරීම මත විලම්බිත ආදායම		
එකතුව	**338,856,524**	377,274,934

මූල්‍ය ප්‍රකාශනවලට සටහන්

(සියලු අගයන් ශ්‍රී ලංකා රුපියල්වලිනි)

19 සටහන - වෙනත් ගෙවිය යුතු

	2020	2019 ප්‍රතිප්‍රකාශිත
බලශක්ති අරමුදලින් අධිකාරියේ අරමුදලට ගෙවිය යුතු		-
ස්වීච් ඒෂියා පාලන ගිණුම	4,548,176	4,548,176
විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය	500	500
උපචිත වියදම්	3,893,540	10,827,979
හිමිකම් නොකී චෙක්පත්	1,260,442	1,260,442
පුනර්ජනනීය සූර්ය බලශක්ති ලියාපදිංචි ගාස්තු	295,860	295,860
මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය	470,000	470,000
ගෙවිය යුතු EPF	1,259,912	-
ගෙවිය යුතු ETF	188,987	-
විගණන ගාස්තු	1,416,166	2,274,976
ගෙවිය යුතු වැට් බදු	-	-
ගෙවිය යුතු රැඳවුම් බදු	379,602	379,602
ගෙවිය යුතු උපයන විට ගෙවීමේ බදු	220	
ගෙවිය යුතු මුද්දර ගාස්තු	-	7,675
Jeewa Shakthi Associates - සමීක්ෂණ ගාස්තු	252,875	252,875
ලංසු ලේඛන	335,500	20,000
වෙනත්	370	370
ගෙවිය යුතු වෙනත් අඩු කිරීම්	47,323	47,323
ඔන්ලයින් තැන්පතු ගිණුම	730,933	
ණය අවදානම		
පුනර්ජනනීය බලශක්තිය - E Net Solutions (Private) Ltd.	1,667,500	1,667,500
බලශක්ති උපකරණ අත්පත් කරගැනීම	326,025	326,025
රඳවා ගැනීම්	2,066,659	2,249,488
නාරාහේන්පිට ජාතික පොළ	99,405	99,405
Kondasinghe Constructions	-	6,465,264
විවිධ ණයගිමියෝ		
ශ්‍රී ලංකා රේගුව	310,748	310,748
ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය - සුභසාධන සංගමය	442	442
ආපසු ගෙවනු ලබන තැන්පතුව		
E-Net solutions (Pvt) Ltd	10,000	10,000
ENL Consultant	150,000	150,000
Zigma Technologies	10,000	10,000
Rainco Renewable Energy Co.	30,000	30,000
විදුල්කා ප්‍රදර්ශනය	9,256	9,256
ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව	54,000	54,000
ආපසු ගෙවනු ලබන තැන්පතුව - වාහන	14,000	14,000
ATA International	50,000	50,000
විදුල්කා සම්මන්ත්‍රණය - Entertainment Ltd	25,000	25,000
එකතුව	19,903,441	31,856,906

20 සටහන - ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අරමුදල

	සටහන	2020	2019
2020.12.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය			
ජංගම නොවන වත්කම්		-	-
ජංගම වත්කම්			
සුනිත්‍ය බලශක්ති අධිකාරියේ ජංගම ගිණුම (FOA) - Energy plus ගොඩනැගිල්ල		**48,678,878**	48,678,878
මුදල් හා මුදල් සමාන දෑ			
ජා. ඉ. බැ. ඉතුරුම් ගිණුම		**187,046,758**	180,115,763
ලංකා බැංකු ඉතුරුම් ගිණුම		**198,149,579**	185,208,026
		433,875,215	414,002,667
සමුච්චිත අරමුදල		**370,902,975**	335,605,770
වසර සඳහා අතිරික්තය/(හිඟය)		**14,158,654**	35,297,205
මුළු සමුච්චිත අරමුදල		**385,061,629**	370,902,975
ජංගම වගකීම්			
SLSEA ජංගම ගිණුම (FOA)		**48,783,882**	43,099,692
ගෙවිය යුතු වැට් බදු		**-**	-
එකතුව		**433,845,511**	414,002,667
ආදායම			
බලශක්ති අරමුදලෙන් ආදායම	9	**19,817,444**	44,628,149
වියදම්			
සම්පත් පැවරීම හා සංවර්ධනය			
පළාත් බලශක්ති වැඩසටහන්			
පුනර්ජනනීය බලශක්ති සේවා වැඩසටහන			7,276,625
ඉඳුරාන පුහුණු මධ්‍යස්ථානය		**5,657,927**	
සූර්ය බලශක්ති ව්‍යාපෘතිය			
බලශක්ති අධ්‍යාපන වැඩසටහන			
බැංකු ගාස්තු		**863**	
ප්‍රවර්ධන වැඩසටහන්			2,054,319
		5,658,790	9,330,944
අතිරික්තය/(හිඟය)		**14,158,654**	35,297,205

21 සටහන - ශ්‍රී ලංකා සුනිත්‍ය ඇපකර අරමුදල

	2020	2019
ආදායම		
පොලී ආදායම - ස්ථාවර තැන්පතු	**3,558,399**	3,405,343
පොලී ආදායම - භාණ්ඩාගාර බිලිපත්	**4,917,660**	5,738,565
මුළු ආදායම	**8,476,059**	9,143,908
අඩු කළා:		
වියදම්	**-**	-
මුළු වියදම්	**-**	-
ශුද්ධ අතිරික්තය/(හිඟය)	**8,476,059**	9,143,908

මූල්‍ය ප්‍රකාශනවලට සටහන්

22 සටහන

	2020	2019
අත්තිකාරම් - ශ්‍රී ලංකා ජාතික රෝහල	-	
අත්තිකාරම් - Co-Energy (Pvt) Ltd	2,128,894	2,128,894
ලැබිය යුතු/අත්තිකාරම් - (වෙනත්)	855,264	892,417
අත්තිකාරම් - හම්බන්තොට දිස්ත්‍රික් ලේකම්	23,993	23,993
අත්තිකාරම් - සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව	26,777	26,777
අත්තිකාරම් - Co-Energy (Pvt) Ltd	521,735	521,735
අත්තිකාරම් - කෑගල්ල දිස්ත්‍රික් ලේකම්	10,712	10,712
අත්තිකාරම් - කොළඹ විශ්වවිද්‍යාලය	2,790,700	2,790,700
අත්තිකාරම් - ISB වයඹ පළාත	390,150	390,150
අත්තිකාරම් - Indi creation	222,500	
අත්තිකාරම් - Alpha Industrial Pvt Ltd	330,264	
අත්තිකාරම් - D.R. Industries Pvt Ltd	478,040	
ආසියානු සංවර්ධන බැංකුව - Exterm WEB	39,000	
	7,818,029	6,785,378

විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. | පිඅවි/සී/එස්එල්එස්ඊඒ/එස්එස්/2018/28

ඔබේ අංකය உமது இல. Your No.

දිනය திகதி Date | 2020 මාර්තු 03 දින

සභාපති

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

යටෝක්ත වාර්තාව සහ විගණිත මූල්‍ය ප්‍රකාශන මේ සමග එවා ඇත.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති

පිටපත්: 1. ලේකම්, පුනර්ජනනීය විදුලිබල ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය - දැ.ගැ.පි.

2. ලේකම්, මූදල් අමාත්‍යාංශය - දැ.ගැ.පි.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය
எனது இல.
My No. ENR/B/SLSEA/FA/2020

ඔබේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date 2022 ජූනි 23 දින

සභාපති

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේ දී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

(අ) පූර්ව කාලපරිච්ඡේද වැරදි අතීතානුයෝගී ලෙස නැවත ප්‍රකාශ කිරීම නිසා පූර්ව වර්ෂයේ විගණිත මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ රු.1,221,120,648 ක් වූ රේඛීය අයිතමයන් 6 ක් රු. 24,461,699 කින්, සහ ආදායම් ප්‍රකාශනයේ සඳහන් රු. 293,185,927 ක් වූ රේඛීය අයිතමයන් 3 ක් රු 2,838,673 කින් ප්‍රතිශෝධනය කර තිබුණද, මෙම ප්‍රතිශෝධිත අයිතමයන් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 3 ප්‍රකාරව වරදෙහි ස්වභාවය, එක් එක් රේඛීය අයිතමය සඳහා නිවැරදි කළ යුතු මුදල, පැරණිතම පෙර කාලපරිච්ඡේදය ආරම්භයේ නිවැරදි කරන ප්‍රමාණය සහ අතීතානුයෝගී නැවත ප්‍රකාශ කිරීම ප්‍රායෝගික නොවන්නේ නම් ඊට හේතු ගිණුම්කරණ සටහනක් මඟින් හෙළිදරව් කළ යුතු වුවද, එසේ සිදුකර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී ලැබිය යුතු එකතුකළ අගය මත බදු ගිණුමට සහ ගෙවිය යුතු එකතුකළ අගය මත බදු ගිණුමට පිළිවෙලින් රු. 8,299,107 ක් සහ රු. 3,091,028 ක් වශයෙන් පූර්ව වර්ෂ ගැලපීම් සිදුකර තිබුණද, ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 3 ප්‍රකාරව වැරදි අතීතානුයෝගීව නිවැරදි කිරීමේදී මූල්‍ය ප්‍රකාශනවල පූර්ව වර්ෂයේ සංසන්දනාත්මක රේඛීය අයිතම ප්‍රතිශෝධනය කර නොතිබුණු අතර, අවශ්‍ය හෙළිදරව් කිරීම් ද සිදුකර නොතිබුණි. තවද ජර්නල් වවුචර් සමඟ අදාල මූලාශ්‍ර ලේඛණ ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) 2018 වර්ෂයේදී සපයා, සවිකර, ක්‍රියාත්මක කර තිබුණු රු. 4,885,693 ක් වූ ෆෑන් ටෙස්ටින් ලැබ් උපකරණ සහ 2015 දී ලැබී තිබුණු රු 12,816,562 ක් වූ වින්ඩ් ටවර් උපකරණ සමාලෝචිත වර්ෂයේදී වත්කම් ලෙස හඳුනාගෙන ගිණුම්ගත කර තිබුණු අතර එම උපකරණවලට අදාල පූර්ව වර්ෂයේ ක්ෂය ප්‍රමාණය රු. 3,540,450 කි. නමුත් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 3 ප්‍රකාරව, වරද අතීතානුයෝගීව නිවැරදි කිරීමේදී පූර්ව වර්ෂයේ සංසන්දනාත්මක ක්ෂය අයිතමය ප්‍රතිශෝධනය කර නොතිබුණි. එසේම ප්‍රමිතියේ 54 පරිච්ඡේදය ප්‍රකාරව අවශ්‍ය හෙළිදරව් කිරීම්ද සිදුකර නොතිබුණි.

(ඈ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 ප්‍රකාරව ජංගම නොවන වත්කම්වල ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය කළ යුතු අතර, අපේක්ෂා කරන තත්ත්වයන් ඇස්තමේන්තුවලින් වෙනස් වන්නේ නම් එම වෙනස්කම් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කළ යුතුය. එහෙත් 2020 දෙසැම්බර් 31 දිනට සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණු නමුත් දැනටමත් භාවිතා කරනු ලබන පිරිවැය රු. 357,996,793 ක් වූ වත්කම් වර්ග 14 ක ඵලදායී ජීවිත කාලය නැවත සමාලෝචනය කර මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම්ට කටයුතු කර නොතිබුණි.

(ඉ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 ප්‍රකාරව යම් වත්කමක් හුවමාරු නොවන ගණුදෙනුවක් හරහා අත්පත් කර ගෙන ඇති විට එහි පිරිවැය එම වත්කම අත්පත් කර ගත් දිනට පැවති සාධාරණ වටිනාකම මත මැනිය යුතු වුවද, සරත්චන්ද්‍ර රාජකරුණා අනුස්මරණ ජාත්‍යාන්තර මධ්‍යස්ථානය සඳහා 2017 වර්ෂයේ දී පරිත්‍යාග වශයෙන් ලද ඉඳුරාන ඉඩම මෙම වාර්තාවේ දින වන විටත් අගය කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 15 ප්‍රකාරව අයවැය ලේඛනය ක්‍රියාත්මක කිරීමේ දී පැහැනගින අයවැය ලේඛනයේ ඇති වටිනාකම් සහ සත්‍ය වටිනාකම් අතර සැසඳීමක් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කළ යුතු වුවත්, අධිකාරිය විසින් ඊට අනුගතව කටයුතු කර නොතිබුණි.

(උ) අධිකාරියට එරෙහිව නඩු කටයුතු 18 ක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම පැවති නමුත් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 08 ප්‍රකාරව එම කටයුතු වලින් පැහැනැගිය හැකි අසම්භාව්‍ය වගකීම් පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල අදාල හෙළිදරව් කිරීම් කර නොතිබුණි.

(ඌ) 2020 දෙසැම්බර් 31 දිනට පශ්චාත් සේවක ප්‍රතිලාභ වෙන් කිරීම සහ 2020 වර්ෂය සඳහා පශ්චාත් සේවක ප්‍රතිලාභ ගෙවීම් වටිනාකම් පිළිවෙළින් රු.32,678,558 ක් සහ රු. 8,391,212 ක් විය යුතු වුවද, එම වටිනාකම් පිළිවෙළින් රු. 34,010,857 ක් සහ රු. 9,723,511 ක් ලෙස ගිණුම් ගත කිරීම හේතුවෙන් 2020 දෙසැම්බර් 31 දිනට පශ්චාත් සේවක ප්‍රතිලාභ වෙන් කිරීම් ශේෂය සහ සමාලෝචිත වර්ෂය සඳහා වූ පශ්චාත් සේවක ප්‍රතිලාභ ගෙවීම් වටිනාකම රු. 1,332,299 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(එ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු ගිණුම් විෂයයන් 03 කට අදාළව මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු අගයන් හා ඊට අනුරූපීව ඉදිරිපත් කර තිබුණු විස්තරාත්මක ලේඛන අතර එකතුව රු. මිලියන 55.96 ක වෙනසක් නිරීක්ෂණය වුවද එම වෙනස්කම් පරීක්ෂා කර බලා මූල්‍ය ප්‍රකාශනවල ගැලපීමට කටයුතු කර නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 අධිකාරියේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන අධිකාරියේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතික වීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

අධිකාරියේ 2020 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විට දී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීම ද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේ දී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මහහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබෙද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම් යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය වීකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම් කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා අධිකාරිය පවත්වාගෙන ගොස් නිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේ දී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට අධිකාරිය සම්බන්ධ වී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීතිරීති / විධානයට යොමුව	විස්තරය
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	
(i) මුදල් රෙගුලාසි 396 (ඇ)	මාස 06 ඉකුත් වූ ඉදිරිපත් නොකළ චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396(ඇ) ප්‍රකාරව කටයුතු කළ යුතු වුවත්, අධිකාරිය විසින් 2020 දෙසැම්බර් 31 දිනට රු. 30,632,380 ක් වූ ඉදිරිපත් නොවූ චෙක්පත් අතුරින් 2014 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා ලියන ලද එකතුව රු. 6,781,378 ක් වටිනා චෙක්පත් 60 ක් සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි.
(ii) මුදල්රෙගුලාසි 880(i)	612 වැනි අධිකාරය වන රජයේ නිලධාරීන්ගේ ඇප ආඥාපනතට අනුකූලව සුනිත්‍ය බලශක්ති අධිකාරියේ ඇප තැබිය යුතු නිලධාරීන් කිසිවෙකු ඇප ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය	
II වැනි පරිච්ඡේදයේ 15:1 (ix)	නියමිත දිනට කාර්යක්ෂමතා කඩඉම් පැවැත්වීම සඳහා පත්කිරීම් බලධරයා ද/ පරිපාලන බලධරයා ද/ ආයතන ප්‍රධානියා ද සම වගකීමකට බැඳේ. තවද, 15.1(ii) ඡේදය ප්‍රකාරව වැටුප් පරිමාණය නියම කිරීමේ දී එහි 04 වන වැටුප් පියවරට එළඹීමට පෙර පළමු කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතු අතර, යම් නිලධාරියෙකු සිය තනතුරෙහි ඉදිරි වැටුප් වර්ධකයන් ලැබීමට සුදුසුකම් ලබන්නේ ද යන්න තීරණය කිරීම මෙමඟින් අපේක්ෂා කරයි. එසේ වුවත්, අධිකාරිය විසින් කාර්යක්ෂමතා කඩඉම් පවත්වා නොතිබුණු අතර නිලධාරීන්ට වැටුප් වර්ධක ලබා දී තිබුණි.
(ඇ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ	
(i) 2008 පෙබරවාරි 06 දිනැති අංක 05/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය	සියලුම රාජ්‍ය ආයතන විසින් තම ආයතනය සඳහා පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් හඳුන්වා දිය යුතු වුවද අධිකාරිය විසින් මෙම වාර්තාවේ දිනය වන විටත් ඒ සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි.
(ii) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය	සෑම ඉන්ධන පරීක්ෂාවකටම පසු මාස 12 ක කාල සීමාවකින් පසුව හෝ කිලෝමීටර 25,000 ක දුර ප්‍රමාණයක් ධාවනය කිරීමෙන් පසුව හෝ එන්ජිමට සම්බන්ධ ප්‍රධාන අලුත්වැඩියාවකට පසුව හෝ යන කාරණා අතරින් මුලින්ම යෙදෙන අවස්ථාවට පසුව නැවත ඉන්ධන පරීක්ෂාවක් කලයුතු වුවත්, අධිකාරියේ වාහන සම්බන්ධයෙන් ඉන්ධන පරීක්ෂාවන් ඊට අනුකූලව සිදුකර නොතිබුණි.
(iii) 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය	චක්‍රලේඛයේ ඇමුණුම් අංක 02 ආකෘතිය පදනම් කරගෙන කාර්ය මණ්ඩලයේ සියලු දෙනාට අදාළව පවත්නා සහ පැවතිය යුතු නිපුණතා අතර පරතරය පියවීම පිණිස කවර ආකාරයේ මානව සම්පත් සංවර්ධනයක් සිදුවිය යුතුද යන්න හඳුනා ගැනීම සඳහා මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සකස් කළ යුතු වුවත් අධිකාරිය විසින් ඊට අනුකූලව කටයුතු කර නොතිබුණි.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

(ඇ)	2017 ජූලි 25 දිනැති අංක 02/2017 දරන ජාතික අයවැය චක්‍රලේඛය	• තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීම පිළිබඳ 2020 වර්ෂය තුළ අභ්‍යන්තර චක්‍රලේඛ හෝ මහපෙන්වීම් නිකුත් කිරීම හා ඒ පිළිබඳව උනන්දුවක් දක්වන පාර්ශව වෙත දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කර නොතිබුණි. • තිරසර සංවර්ධන අරමුණු ඉටුකර ගැනීම සඳහා භෞතික සම්පත් හා කාර්ය මණ්ඩලය යොදවා ගැනීමේ ක්‍රමවේදයක් සහ ඒ සම්බන්ධ කාර්යයන් නියාමනය සඳහා ක්‍රමවේදයක් හඳුනාගෙන නොතිබුණි.
(ඉ)	2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය	2020 වර්ෂයේ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාව 2021 මාර්තු 31 දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, අධිකාරියේ 2020 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව, විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.
(ඊ)	1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය	ශුද්ධ අගය රු. 512,148,073 ක් වූ ස්ථාවර වත්කම් සඳහා ස්ථාවර වත්කම් ලේඛනය විධිමත්ව පවත්වා නොතිබුණි.
(උ)	2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය	ගිණුම් වර්ෂය අවසාන වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කලයුතු වුවද, අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන දින 293 ක් ප්‍රමාද වී එනම් 2021 ඔක්තෝබර් 21 දින විගණයට ඉදිරිපත් කෙරුණි.
(ඌ)	2019 ජනවාරි 12 දිනැති අංක ඩීඑම්ඒ/01 – 2019 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ 8.3 ඡේදය	අධිකාරිය විසින් 2020 වර්ෂය සඳහා වාහන පිරිවැය වාර්තා පිළියෙල කර කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර නොතිබුණි.
(එ)	රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.8 පරිච්ඡේදය	වැඩ නිම කිරීමට අපේක්ෂිත කාලයෙන් දින 28 ක් ඔබ්බට වලංගු වන සේ ඉදිකිරීම් කොන්ත්‍රාත් සඳහා කාර්යසාධන සුරක්ෂණයක් ලබාගත යුතු වුවත්, අධිකාරිය විසින් ජාතික පුනර්ජනනීය බලශක්ති උද්‍යානය තුළ ඉදිකර තිබුණු පිරිවැය රු. 6,409,745 ක් වූ වැසිකිලි සංකීර්ණයට අදාළව කාර්යසාධන සුරක්ෂණ ලබාගත් බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ඒ)	2007 ඔක්තෝබර් 03 දිනැති ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අතිරේක අංක 13	පිරිවැය රු. මිලියන 5 ක් ඉක්මවන ලද පොදු කොන්ත්‍රාත් සඳහා 1987 අංක 3 දරන පොදු කොන්ත්‍රාත් ගිවිසුම් පනතෙහි 8, 9 සහ 12 වගන්ති අනුව ක්‍රියාකල යුතු වුවත්, උක්ත කොන්ත්‍රාත්තුව සඳහා ඒ අනුව කටයුතු කර නොතිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර අධිකාරියේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

(අ) 2007 අංක 35 දරන ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරි පනතේ 47(1) වගන්තිය අනුව, බලශක්ති කාර්යක්ෂමතාවට අදාළ යම් ව්‍යාපෘතියක් පවත්වාගෙන යාම සඳහා ණය ඉල්ලුම් කරන ආයෝජකයන් වෙනුවෙන් ඇප ලබා දීමේ කාර්යය සඳහා සුනිත්‍ය බලශක්ති ඇප අරමුදල පිහිටුවා තිබුණි. අධිකාරිය විසින් එම අරමුදල් භාණ්ඩාගාර බිල්පත් සහ කාලීන තැන්පතුවල ආයෝජනය කර තිබුණු අතර, 2020 දෙසැම්බර් 31 දිනට එම ආයෝජනවල වටිනාකම රු. 111,803,519 ක් වී තිබුණි. එහෙත් සුනිත්‍ය බලශක්ති ඇප අරමුදල පිහිටුවීමේ අරමුණු ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය කාර්යයන් මේ දක්වා ඉටු කර ගැනීමට කටයුතු කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ආ) එසේම පනතේ 46(3) වගන්තියට පටහැනිව, කල්බදු පදනම් මත බත්තරමුල්ල ප්‍රදේශයෙන් ඉඩමක් ලබා ගැනීම සඳහා 2014 සිට 2015 දක්වා ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අරමුදලින් රු. 48,678,878 ක් ගෙවා තිබුණි.

(ඇ) පනතේ 42(1) වගන්තිය ප්‍රකාරව බලශක්ති ක්ෂේත්‍රයෙහි කාර්යසාධනය පිළිබඳ වාර්තාවක් වාර්ෂිකව අමාත්‍යවරයා වෙත මණ්ඩලය විසින් ඉදිරිපත් කළ යුතු අතර, පාර්ලිමේන්තුවේ සලකා බැලීම සඳහා අමාත්‍යවරයා විසින් එම වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කල යුතුය. නමුත්, අධිකාරිය විසින් පනතේ එම වගන්තිය ප්‍රකාරව අවශ්‍ය කටයුතු කර නොතිබුණි.

(ඈ) පනතේ 19(1) වගන්තිය අනුව නැවත බලගැන්විය හැකි බලශක්ති ව්‍යාපෘති සඳහා භාවිතා කරන නැවත බලගැන්විය හැකි බලශක්ති සම්පත් වෙනුවෙන් මුදල් විෂයභාර අමාත්‍යවරයා විමසා, අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන යම් ගාස්තුවක් රාජ්‍ය භාගය ලෙස වාර්ෂිකව අධිකාරියට ගෙවීමට සංවර්ධනකරු බැඳී සිටිය යුතු වුවත්, අධිකාරිය පිහිටුවා වසර 14 ක කාලයක් ඉකුත් වී තිබුණද, මේ දක්වා රාජ්‍ය භාගය අයකිරීමට කටයුතු කර නොතිබුණි.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර අධිකාරියේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

(අ) අධිකාරිය සතු වාහන සඳහා අධීක්ෂණ මෙහෙයුම් පද්ධතියක් ස්ථාපනය කිරීම සඳහා 2020 දෙසැම්බර් 16 දින රු.126,000 ක් වටිනා ජංගම දුරකථන 08 ක් මිලදීගෙන තිබූ අතර, විගණනය සිදුකළ 2022 ජනවාරි 18 දින වන විටත් එම පද්ධතිය ස්ථාපනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2020 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අරමුදලට අයත් රු. 385,196,337 ක් බැංකු ඉතිරිකිරීම් ගිණුම් 02 ක ද, අධිකාරියට අයත් රු. 73,536,822 ක් කාරක ප්‍රාග්ධන අවශ්‍යතාවය ඉක්මවා ජංගම ගිණුම් 05 ක ද ඵලදායී ආයෝජනයකින් තොරව රඳවා තිබුණි.

2.3 වෙනත් කරුණු

(අ) තාත්වික සේවා මට්ටමක් පවත්වා ගැනීමට හා සේවක සංඛ්‍යාව පිළිබඳ කාලීන සමාලෝචනයක් කිරීමට නොහැකි වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික ශ්‍රේණිවල පුරප්පාඩු 27 ක් ද, ද්විතීය මට්ටමේ පුරප්පාඩු 01 ක් ද, තෘතීය මට්ටමේ පුරප්පාඩු 22 ක් ද ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 11 ක් ද වශයෙන් 2020 දෙසැම්බර් 31 දිනට සුනිත්‍ය බලශක්ති අධිකාරියේ පුරප්පාඩු 61 ක් පැවතුණි.

(ආ) සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙළ කර තිබුණද, එමගින් අධිකාරියේ විවිධ අංශ විසින් ඉටු කිරීමට අපේක්ෂිත ක්‍රියාකාරකම් සහ ඉටු කර ගැනීමට අපේක්ෂිත මූල්‍ය හා භෞතික ඉලක්ක දක්වා නොතිබුණි.

(ඇ) කුඩා ජල විදුලි ජනන ව්‍යාපෘති සඳහා ඉඩම් අත්පත් කර ගැනීම වෙනුවෙන් 2009 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා ආයෝජකයන් 20 දෙනෙකුගෙන් තැන්පතු වශයෙන් ලබාගත් රු.5,049,485 ක් 2017 වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශනවල ගෙවිය යුතු වටිනාකමක් වශයෙන් ජංගම වගකීම් යටතේ දක්වා තිබූ අතර, ඉඩම් අත්පත් කර ගැනීමේ කාර්යය අවසන් කිරීමට සුදුසු පියවර ගෙන නොතිබුණි.

(ඇ) ලැබිය යුතු මුදල් යටතේ දක්වා තිබූ රු. 8,406,407 ක් වර්ෂ 01 සිට 04 දක්වා කාලයක් ද, රු. 38,041 ක් වර්ෂ 01 සිට 05 ක් දක්වා කාලයක් ද, ඉදිරියට ගෙන එමින් පැවති අතර, එම මුදල් අයකර ගැනීමට හෝ ඒ සඳහා වෙනත් සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීමට අධිකාරිය සමාලෝචිත වර්ෂය අවසානය දක්වා ම කටයුතු කර නොතිබුණි.

(ඉ) ලැබිය යුතු අත්තිකාරම් යටතේ දක්වා තිබූ රු. 11,823,521 ක් වර්ෂ 01 සිට 04 දක්වා කාලයක් තුළ අයකර ගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් දිගින් දිගටම ඉදිරියට ගෙන එමින් පැවතුණි.

(ඊ) වෙනත් ගෙවීම් හා ණය හිමියන් ලෙස ගිණුම්වල දක්වා තිබූ රු. 2,445,149 ක් වර්ෂ 01 සිට වර්ෂ 04 දක්වා කාලයක සිට ද, රු. 6,753,677 ක් වර්ෂ 05 ට වැඩි කාලයක සිට ද, ආපසු ගෙවිය යුතු තැන්පතු හා විවිධ ණයහිමියන් ලෙස දක්වා තිබූ රු. 2,756,376 ක් වර්ෂ 05 ට වැඩි කාලයක සිට ද, ඉදිරියට ගෙන එමින් පැවතුණු අතර, අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම මෙම මුදල් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති

විගණන පිළිතුරු

2023.01.17
විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය,
306/72, පොල්දූව පාර,
බත්තරමුල්ල.

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්ති ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

උක්ත කරුණට අදාළව 2022.06.23 දින ඔබ විසින් එවන ලද විගණකාධිපති වාර්තාව සඳහා පිළිතුරු මේ සමග ඉදිරිපත් කරමි.

1.2. මතය සඳහා පදනම

1.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලින් බැහැරවීම

(අ) 2019 වර්ෂයේ විගණිත මූල්‍ය ප්‍රකාශන සඳහා 2020 වර්ෂයේ දී හඳුනාගත් පූර්ව වර්ෂ ගිණුම්කරණ දෝෂ හා ඇස්තමේන්තු වෙනස්වීම් මත ඇති වූ බලපෑම සඳහා සිදුකරණ ලද ජර්නල් සටහන් මත, විගණන විමසුමේ මෙහි දක්වා ඇති රේඛීය අයිතමයන් හි වෙනස්වීම් පැණ නැගී ඇත.

රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිත අංක 03 "ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනස්කම් ගිණුම්කරණ ඇස්තමේන්තු සහ දෝෂ" ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව, සලකා බලන වර්ෂයේ හඳුනාගත් ගිණුම්කරණ වැරදි/ ඇස්තමේන්තු වෙනස්වීම්, අතීතානුයෝගීව නිවැරදි කර මූල්‍ය ප්‍රකාශන සඳහා වූ බලපෑම ගිණුම්කරණ සටහනක් ලෙස මේ සමග අමුණා ඇති අතර, ඇමුණුමෙහි සටහනට අදාල පැහැදිලි කිරීම් හා ඉදිරිපත් කිරීම් දක්වා ඇත.

(ආ) 2020 වර්ෂයේදී සංශෝධිත, 2019 වර්ෂයට අදාල ලැබිය යුතු ගිණුම් හී හා ගෙවිය යුතු ගිණුම් හී ශේෂ වෙස්වීම පහත පරිදි දැක්විය හැකිය.

2020 වර්ෂයේ දී හඳුනාගත් පහත දක්වා ඇති ලැබිය යුතු ගිණුම් හි ශේෂ 2019 වර්ෂයේ ආදායමට එරෙහිව ගැලපිය යුතු බැවින් අදාල ජර්නල් සටහන් නිවැරදි පරිදි ගිණුම්ගත කර ඇත. ශේෂයන් හි සිදුව ඇති වෙනස්වීම පහත පරිදි දැක්විය හැක.

විස්තරය	සංශෝධිත ප්‍රමාණය
ලැබිය යුතු ගිණුම්	
විදුලි ආදායම හම්බන්තොට / Power Generation of Hambanthota	354,967.00
ලැබිය යුතු ගිණුම් බලශක්ති අරමුදල/ Trade Receivable EF	135,629.00 (අඩුවීම)
VAT Receivable	
මුළු වෙනස්වීම (පෙර වර්ෂයට අදාලව)	13,667,254.00
ගෙවිය යුතු ගිණුම්	
VAT Payable	1,922,152.00 (අඩුවීම)
වෙනත් ගෙවිය යුතු වියදම්	27,712.00 (අඩුවීම)
මුළු වෙනස්වීම (පෙර වර්ෂයට අදාලව)	1,949,864.00

ඉහත වෙනස්කම් මත හඳුනාගත් ගිණුම්කරණ දෝෂ නිවැරදි කිරීමට අදාල ජර්නල් සටහන් පහත පරිදි දැක්විය හැකිය.

	විස්තරය	හර	බැර
(1)	රඳවාගත් ලාභ විදුලි ආදායම හම්බන්තොට	354,967.00	354,967,00
(2)	රඳවාගත් ලාභ ලැබිය යුතු ගිණුම - බලශක්ති අරමුදල	135,629.00	135,629.00
(3)	රඳවාගත් ලාභ VAT Receivable	13,176,658,00	13,176,658.00
(4)	VAT Payable රඳවාගත් ලාභ	1,922,152,00	1,922,152.00
(5)	වෙනත් ගෙවිය යුතු වියදම් රඳවාගත් ලාභ	27,712,00	27,712.00

විගණන පිළිතුරු

මූල්‍ය ප්‍රකාශන සඳහා වූ බලපෑම අතීතානුයෝගීව නිවැරදි කර ගිණුම්කරණ සටහනක් ලෙස මේ සමග අමුණා ඇති අතර, ඇමුණුමෙහි සටහනට අදාල පැහැදිලි කිරීම් හා ඉදිරිපත් කිරීම් දක්වා ඇත.

(ඇ) 2018 වර්ෂයේ මිලදීගත් "Fan Performance Testing Facility" වත්කම වියදමක් ලෙස ලියා හැරීම නිවැරදි කිරීම සඳහා, වත්කම මිලදී ගත් වර්ෂය සඳහා පොත් වලට හඳුනාගැනීම හා වර්ෂයන්ට අදාල ගිණුම් වලට ගැලපීම පහත පරිදි දක්විය හැක.

	විස්තරය	හර	බැර
(1)	වත්කම් හඳුනාගැනීම හා වියදමක් ලෙස ලියා හැරීම නිවැරදි කිරීම.		
	- වත්කම් ගිණුම		
	- රඳවාගැනීමේ ලාභ (2018 වර්ෂය සඳහා)	4,885,693.26	4,885,693.26
(2)	වර්ෂයන්ට අදාල ක්ෂය හඳුනාගැනීම හා පොත්වලට ලියා හැරීම		
	- 2018 රඳවාගැනීමේ ලාභ		
	- සමුච්චිතක්ෂය අරමුදල	495,261.99	495,261.99
(3)	- 2019 රඳවාගැනීමේ ලාභ		
	- සමුච්චිත ක්ෂය අරමුදල	977,138.52	977,138.52

2015 වර්ෂයේ වත්කමක් ලෙස හඳුනාගත යුතු විදේශ ප්‍රධාන යටතේ ශ්‍රී ලංකා සුනීත්‍ය බලශක්ති අධිකාරියට ලැබුණු සුළං කුලුණු සඳහා ලැබුණු ප්‍රදාන, වර්ෂයේ ආදායමට හඳුනාගෙන නොමැති අතර, ඒ සඳහා සිදුකළ වියදමක් වූ බදු (VAT) ගෙවීම, කෙරෙමින් පවතින වැඩ ලෙස සටහන් කර තිබුණි.

අදාල ලැබීම ආදායමක් ලෙස හඳුනාගැනීම හා වත්කම භාවිතයට පැමිණි අවස්ථාවේදී වත්කමක් ලෙස හඳුනා නොගැනීම දෝෂ සහගත බැවින් එය නිවැරදි කිරීමට අදාල ජර්නල් සටහන් පහත පරිදි දක්විය හැක.

	විස්තරය	හර	බැර
(1)	වත්කම් ගිණුම	12,816,562.21	2,299,935.00
	උපෂ (කෙරෙමින් පවතින වැඩ)		10,516,627.21
	රඳවාගත් ඉපයීම්		
(2)	රඳවාගැනීම් ලාභ	9,930,202,00	9,930,202.00
	සමුච්චිත ක්ෂය අරමුදල		
	(2015 - 2018 වර්ෂ සඳහා)		
(3)	රඳවාගැනීම් ලාභ	2,563,312,40	2,563,312.40
	සමුච්චිත ක්ෂය අරමුදල		
	(2019 වර්ෂය සඳහා)		

(ඈ) ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූල නොවීම.

SLPSAS-7 (ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිත අංක 07) ප්‍රකාරව ජංගම නොවන වත්කම් වල ඵලදායී ජීව කාලය වාර්ෂිකව සමාලෝචනය කළ යුතු වේ.

SLPSAS-3 ප්‍රකාරව ඇස්තමේන්තු හා වෙනස් වන්නේ නම් ඒ සඳහා ප්‍රතිශෝධන සිදු කළ යුතු වේ.

ශ්‍රී ලංකා සුනීත්‍ය බලශක්ති අධිකාරියේ ජංගම නොවන වත්කම් වල වටිනාකම ඉහළ අගයක් ගන්නා අතර, එම වත්කම් ප්‍රධාන කාර්යාලය, හම්බන්තොට සූර්ය විදුලි බලාගාරය හා ඉඳුරාන ජල විදුලි බලාගාරයේ ස්ථානගතව ඇත. පෙර වර්ෂවල පටන් වත්කම් නැවත ප්‍රත්‍යාගණනය සිදු කර ඉහත ගිණුම් ප්‍රමිත ප්‍රකාරව කටයුතු සිදු කළ යුතු බව හඳුනාගත්ත ද, රටෙහි පැවැති තත්ත්වය මත පියවර කිහිපයක් රට වසා දැමීම, සේවකයින් කාණ්ඩ වශයෙන් සේවයට ගෙන්වීම, පිට පළාත්වල සේවකයින් සේවයට නොගෙන්වීම වැනි හේතු මත තක්සේරුකරණ කාර්යය මණ්ඩලයක සේවය ලබාගැනීම ප්‍රශ්න සහගත විය. එබැවින් ඉදිරි වර්ෂය සඳහා වත්කම් ප්‍රත්‍යාගණනය සිදු කර, ජංගම නොවන වත්කම් වල සාධාරණ වටිනාකම් (fair value) හඳුනාගෙන නිවැරදිව ගිණුම් සඳහා ගැලපීම් කිරම සඳහා කටයුතු සිදු කිරීමට බලාපොරොත්තු වේ.

(ඉ) 2017 වර්ෂයේ පරිත්‍යාග වශයෙන් ලද ඉඳුරාන ඉඩම තක්සේරු කර සාධාරණ වටිනාකම හඳුනාගෙන නිසි පරිදි ගිණුම්ගත කළ යුතු වූවත්, රාජ්‍ය අංශයේ ඉඩම් ප්‍රත්‍යාගණනය (තක්සේරු කිරීම) තක්සේරු දෙපාර්තමේන්තුව හරහා පමණක් සිදු කළ යුතු වේ.

මේ සඳහා අවස්ථා කිහිපයක් තක්සේරු දෙපාර්තමේන්තුවේ සහාය ලබාගැනීමට ලිපි යොමු කළ ද, රටෙහි පැවැති කොවිඩ් 19 වසංගත තත්ත්වය තුළ 2020 හා 2021 වසර වල මේ සඳහා ඔවුන්ගේ සේවය ලබාගැනීමට නොහැකි විය. 2022 වර්ෂයේ දී ද මේ සඳහා නැවැත ලිපියක් යොමු කරන ලදි.

මේ සඳහා කඩනම්ව මැදිහත් වී ඒ සඳහා අවශ්‍ය කටයුතු සිදු කිරීම හා තක්සේරු දෙපාර්තමේන්තුවේ සහාය ලබාගැනීමට බලාපොරොත්තු වේ.

(ඊ) අයවැය ගත මූල්‍ය ප්‍රතිපාදන හා සත්‍ය වියදම අතර සැසඳීම් සිදු කර ඉදිරි මූල්‍ය ප්‍රකාශන වලදී ඉදිරිපත් කිරීමට කටයුතු කරමි.

(උ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව ආයතනයේ නඩු කටයුතු හා බාහිර පාර්ෂව සමග පවතින බැඳීම මූල්‍ය ප්‍රකාශනයෙහි හෙලිදරව් කිරීම් යටතේ ඉදිරිපත් කළ යුතු වේ. 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමග අදාල හෙලිදරව් කිරීම් සිදු කිරීමට ආයතනයට අතපසු වී ඇති බැවින් ඉදිරි වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සඳහා හෙලිදරව් කිරීම් නීති අංශය හා ඒකාබද්ධව සිදු කිරීමටත් ඒ අනුව මූල්‍ය ප්‍රකාශන මත තීරණ ගනු ලබන පාර්ශවයන් සඳහා සත්‍ය හා සාධාරණ නිගමණ සඳහා එළඹීමට අවශ්‍ය තොරතුරු සම්පාදනය කිරීමට බලාපොරොත්තු වේ.

(ඌ) 2020 දෙසැම්බර් මස 31 දිනට සේවක ප්‍රතිලාභ සඳහා වෙන් කිරීම් ගණනය කිරීම සම්පූර්ණ කළ වර්ෂ සඳහා (සේවක ප්‍රතිලාභ පනතට අනුව) ගණනය කළ යුතුය.

පෙර වර්ෂ වලදී ගණනය සිදු කළ ආකාරයන්ට අනුව, වෙන් කිරීම් ගණනය කිරීම දින පදනම් කරගෙන සිදු කර ඇත. (පෙර වර්ෂවල විගණනය සිදු කිරීමේ දී ඒ පිළිබඳ අවධානය යොමු කර නොමැති බව මා හට හැඟේ)

2020 වර්ෂයේ දී විගණනය සිදු කිරීමේ දී හඳුනාගත් මෙම ගිණුම්කරණ අනුකූල නොවීම 2021 වර්ෂය සඳහා ගණනය කිරීමේ දී නිවැරදි කිරීමට විගණන සාමාජිකයින් හා එකඟ වන ලදි.

(එ) ගිනුම් විෂයන් 03 කට අදාලව මූල්‍ය ප්‍රකාශනවල හා ශේෂ පිරික්සුම අතර රු. මිලියන 55.96 ක වෙනසක් විගණකාධිපති තුමා විසින් නිරීක්ෂනය කර තිබුනි. ඒවා නම්

සුනිත්‍ය බලශක්ති ඇප අරමුදලේ ශේෂය රු. 107,419,486/- ක් ලෙස මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුන ද 2020/12/31 දැනට ශේෂ පිරික්සුමේහි එය රු. 196,275,578/- ලෙස දක්වා තිබුනි.

අධිකාරිය විසින් 2019 වර්ෂයේ දී පරිගණක ගත ගිණුම් කරන පද්ධතිය හඳුන්වා දෙනු ලැබීය. එහි දී ඇප අරමුදලේ ආයෝජනයෙන් ලැබෙන පොලී ආදායම ආදායම් ගිණුමට බැරවීම හේතු කොට ගෙන එය සමුච්චිත ආදායමට අන්තර්ග්‍රහනය වී ඇත. එනමුත් මූල්‍ය ප්‍රකාශ සෑදීමේ දී ඇප අරමුදලට එකතු කර ඉදිරිපත් කර ඇති බැවින්, මූල්‍ය ප්‍රකාශන වලින් ඉදිරිපත්වන නොරතුරු නිවැරදිය. තවද ශේෂ පිරික්සුම් සටහන් නිවැරදි කිරීමට අදාල පරිගණකගත දත්ත ඇතුලත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලදී.

මූල්‍ය ප්‍රකාශනවල විලම්භිත අදායම රු. 1,388,606,544/- ක් ලෙස දක්වා තිබුනද ශේෂ පිරික්සුමේහි එය රු. 1,342,034,511/- ලෙස දැක්වීම හේතුවෙන් රු. 46,572,033/- ක වෙනසක් විගණකාධිපතිතුමාගේ නිරීක්ෂණයට ලක් වී ඇත.

මෙය පරිගණකගත ගිණුම්කරන පද්ධතියේ විලම්භිත ආදායමට බැර කිරීම නිසා එය සමුච්චිත ආදායමට අන්තර්ග්‍රහනය වී ඇත. මෙය ශේෂ පිරික්සුමෙ හි නිවැරදි නොවූවද මූල්‍ය ප්‍රකාශනවල නිවැරදිව ඉදිරිපත් කර ඇති බැවින් මූල්‍ය ප්‍රකාශන වලින් ඉදිරිපත් කරනු ලබන තොරතුරු නිවැරදිය. තවද සම්බන්ධවද ශේෂ පිරික්සුම් සටහන් නිවැරදි කිරීමට අදාල පරිගණකගත දත්ත ඇතුලත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලදී.

මූල්‍ය ප්‍රකාශනවල උපචිත ගිණුමේ ශේෂය හා ශේෂ පිරික්සුමේහි උපචිත වියදම් ශේෂය අතර රු. 247,007/- ක වෙනසක් විගණකාධිපතිතුමා විසින් නිරීක්ෂනය කරනු ලැබූ අතර, මෙය ශේෂ පිරික්සුමෙහි උපචිත නිෂ්කාශන වියදම් ගිණුමේ ශේෂයයි. මෙහි දී මූල්‍ය ප්‍රකාශනවලට ශේෂ පිරික්සුමේ උපචිත වියදම් ගිණුමේ ශේෂය සමඟ උපචිත නිෂ්කාශන ගිනුමේ වියදම් ශේෂය එකතු කර නිරූපනය කරනු ලැබ ඇත.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිලිබඳ වාර්තාව

(අ)

(ස) මූල්‍ය රෙගුලාසි 396 (ඇ) ප්‍රකාරව අදාල ශේෂ තහවුරු කරගැනීම සිදු කර, ලිපි මගින් දන්වා චෙක්පත් කාලසීමාව ඉක්මවා ඇති චෙක්පත ආයතනයේ ආදායමක් ලෙස නැවත හඳුනාගැනීමට කටයුතු යොදා ඇත.

(සස) මුදල් රෙගුලාසි ප්‍රකාරව ඇප මුදල් තැන්පතු ලබාගැනීමට අවශ්‍ය කටයුතු ඉදිරියේදී සිදු කරනු ලැබේ.

(ආ) 2020 අගෝස්තු 24 දින වනතුරු අප අධිකාරිය සතුව අනුමත බදවා ගැනීමේ පටිපාටියක් නොතිබූ බැවින් කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ පැවැත්වීමට නොහැකි විය. නමුත් බදවා ගැනීමේ පටිපාටිය අනුමත වීමෙන් පසු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ පැවැත්වීමට ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය වෙත දැනුම් දී ඇති අතර ඒ සඳහා අවශ්‍ය කටයුතු සිදුකරමින් පවති.

(ඇ)

(ස) පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් සකස් 2022 වර්ෂයේ ප්‍රකාශයට පත් කොට ඇත. ඒ අනුව සුනිත්‍ය බලශක්ති අධිකාරියේ සේවාවන් ලබා ගන්නා මහජනතාව ඇතුළු පාර්ශවකරුවන්ට නිසි ගුණාත්මක සේවාවන් ලබා දීම තව දුරටත් තහවුරු වනු ඇත.

(සස) අධිකාරිය සතු රථවාහන වල ඉන්ධන පරීක්ෂාව 2020 වර්ෂයේදී රටෙහි පැවති කොවිඩ් 19 තත්වය හේතුකොට ගෙන සැලසුම් කල ආකාරයට සිදු කිරීමට නොහැකි විය. 2021 වසර සඳහා නිසියාකාරව ඉන්ධන පරීක්ෂාව කරන ලදී.

(සසස) ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය සඳහා මානව සම්පත් සංවර්ධන සැලැස්ම සකස් කොට අවසන් අතර කළමණාකරන මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත.

(ඈ)

- ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ වැඩසටහන් 2020 වර්ෂය තුලදී ක්‍රියාත්මක කිරීමේදී ගෝලීය වශයෙන් සහ රට තුල පැවති කොරෝනා වෛරස් තත්වය මෙම වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට විශාල වශයෙන් බාධාවක් වූ නමුත් එම වර්ෂය තුල ක්‍රියාකාරී සැලැස්ම තුල පවතින ක්‍රියාකාරකම් බොහොමයක් ඉටු කිරීමට හැකියාව ලැබුනි.
- 2020 වර්ෂයේදී තිරසාර සංවර්ධන අරමුණු ඉටු කර ගැනීම සඳහා ආයතනික වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කරන ක්‍රියාකාරී සැලැස්ම සකස් කර තිබූ අතර ඒ අනුව එම වැඩසටහන් නියාමනය සිදු කර ඇත.කෙසේ නමුත් මේ වන විට ආයතනය සඳහා කාර්ය සාධක දර්ශක (KPI) ද හඳුන්වා දී ඇත.

විගණන පිළිතුරු

(ඉ) 2020 වර්ෂයට අදාල භාණ්ඩ සමීක්ෂණ වාර්තාව නිසි පරිදි සකසා ඇති අතර, ඉදිරි විගණන කළමණාකරණ කමිටුවට යොමු කර අනුමැතිය ලබාගැනීමට බලාපොරොත්තු වේ.

2021 අප්‍රේල් මාසයේ ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ ව්‍යාපාර ස්ථානය නව ස්ථානයක් කරා ගෙන යාම සිදු වූ අතර, ඒ සඳහා කටයුතු සිදු කිරීම හා කොවිඩ් 19 මත අදාල භාණ්ඩ ගණනය සිදු කිරීමට නොහැකි වීම මත වාර්තාව ඉදිරිපත් කිරීම ප්‍රමාද විය.

(ඊ) 2007 වර්ෂයේ ආයතනය පිහිටුවීම සිදු වී ඇති අතර, එවකට පැවැති ආයතනයේ භාණ්ඩ හා පෙර වර්ෂවල (2014 ප්‍රථම) භාණ්ඩ සඳහා නිසි පරිදි ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කර නොමැති අතර, ආයතනයේ ජංගම නොවන වත්කම් වල වටිනාකම (පොත් අගය) ඉහළ අගයක් ගන්නා බැවින් රාජ්‍ය ගිණුම් 6 හා 7 ප්‍රකාරව කාලීන වටිනාකම හඳුනාගැනීමට නැවත තක්සේරු කිරීමක් (ප්‍රත්‍යාගණනය) සිදු කිරීමට බලාපොරොත්තු වේ.එමගින් පෙර දත්තයන් හි වටිනාකම් කාලීනව හඳුනාගෙන ස්ථාවර වත්කම් ලේඛනය නිසි පරිදි යාවත්කාලීන කිරීමට බලාපොරොත්තු වේ.

(උ) චක්‍රලේඛ ප්‍රකාරව ගිණුම් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන දින 60 ක් තුල (පෙබරවාරි 28 දිනට) ඉදිරිපත් කළ යුතු වුවත්, 2020 මාර්තු මස වන විට මූල්‍ය ප්‍රකාශන නිම කිරීමෙන් අනතුරුව විගණන හා කළමනාකරණ කමිටුවේ අනුමැතිය ලබාගැනීමෙන් පසුව කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය ලබාගැනීම සඳහා අප්‍රේල් මාසයේ දී ඉදිරිපත් කරන ලදී.

නමුත් රටෙහි පැවති කොවිඩ් අර්බුදය මත රට වසා දැමීම නිසා කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය ලබා ගෙන එම තීරණය සහතික කර ගැනීමෙන් පසු අගෝස්තු මාසයේ දී විගණනය ගෙන ඉදිරිපත් කළ ද, විගණන අංශයන් විසින් දන්වා සිටියේ මූල්‍ය ප්‍රකාශන සියල්ලෙහිම, එනම්

1. ආදායම් ප්‍රකාශනයෙහි
2. මූල්‍ය තත්ව ප්‍රකාශනයෙහි
3. ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනයෙහි හා
4. මුදල් ප්‍රවාහ ප්‍රකාශන යන සියල්ලෙහිම,

- මූල්‍ය අධ්‍යක්ෂක,
- අධ්‍යක්ෂ ජනරාල්වරයා,
- සභාපතිතුමා,

අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු අත්සන් කර රබර් මුද්‍රාව තබා විගණනය වෙත ඉදිරිපත් කල යුතු බවයි. නමුත්, නැවත රට අගෝස්තු මාසයේ දී වසා දැමීම හේතුවෙන් එම අත්සන් සහිතව විගණනය සඳහා යැවීමට හැකි වූයේ ඔක්තෝබර් මාසයේදීය.

පැවැති කොවිඩ් 19 තත්වය මත කාර්යාල වසා තැබීම හා ඒ හා සමගාමීව පැවැත්වීමට නියමිත කළමණාකරණ රැස්වීම් හරහා නිසි අනුමැතීන් ලබාගැනීමට ප්‍රමාද වීම මත මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කිරීමට ප්‍රමාද විය.

(ඌ) DMA /01-2019 දරණ කළමණාකරණ විගණන චක්‍රලේඛයට අනුව ඉදිරියේදී වාහන පරිවැය වාර්තාව මාසිකව කළමණාකරන විගණන දෙපාර්තමේන්තුවට යැවීමට කටයුතු යොදා ඇත. පෙර වසර වල වාහන පිරිවැය වාර්තාව කාර්තුමය වශයෙන් සකස් කර ඇත.

(එ) අප විසින් කාලය දීර්ඝ කිරීමේ අනුමැතිය 2021 මාර්තු 15 ලිපියෙන් ලබාදෙන විට 95% ක පමණ වැඩ නිමකර තිබූ නිසා ද අපවෙත ලබාදී තිබූ කාර්යසාධන සුරක්ෂණය 2022 අප්‍රේල් 16 දින දක්වා වලංගුව තිබූ නිසාද එම කාලය තුල වැඩ අවසන් කිරීමට හැකි වෙතයි වූ අවබෝධ වූ නිසා කාර්ය සාධන සුරක්ෂණය දීර්ඝ කර ගැනීමට ක්‍රියාත්මක වී නැත.

(ඒ) ලංසු ලේඛන වල අඩුපාඩු සම්පූර්ණ කිරීම ප්‍රසම්පාදන අංශය විසින් කලයුතු වුවත් නිවැරදි ලෙස දැනුවත් නොවීම නිසා මෙය සිදු වී ඇත. මිලියන 5 ට වඩා වැඩි වීමකදී සමාගම් මැදුරේ ලියාපදිංචි සහතික පමණක් ඇති ආයතන ප්‍රසම්පාදනයට වලංගු වන බව මින් ඉදිරියට ලංසු ලේඛන වල අඩංගු කිරීමට කටයුතු කරනු ඇත.

2.2.3 අධිකාරියේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව

(අ) 2007 අංක 35 දරන ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරි පනත ප්‍රකාරව සුනිත්‍ය බලශක්ති ඇප අරමුදල ක්‍රියාත්මක වුවද පනතේ 47(2) (අ) වගන්තිය ප්‍රකාරව මෙම අරමුදල සඳහා ඒකාබද්ධ අරමුදලෙන් ආරම්භක ප්‍රාග්ධනයක් ලැබිය යුතුව තිබුණද සුනිත්‍ය බලශක්ති අධිකාරිය ස්ථාපිත කිරීමෙන් අනතුරුව මෙම අරමුදල සඳහා ඒකාබද්ධ අරමුදලින් මුදල් ලැබී නොමැත.

තවද 2007/10/01 දින සුනිත්‍ය බලශක්ති අධිකාරිය ස්ථාපිත කරනු ලබන විට පෙර පැවති ආයතනය වන බලශක්ති අරමුදල මගින් ආයෝජනය කර තිබූ රු. මිලියන 53ක මුදලකට එහි පොලී ආදායම වාර්ෂිකව එම අරමුදලටම එකතු වීමෙන් 2020 දෙසැම්බර් 31දින වන විට රු. මී. 102 දක්වා වර්ධනය වී ඇත.

(ආ) මෙම ඉඩම ලබාගෙන ඇත්තේ දකුණු ආසියාවේ ප්‍රථම බලශක්ති කාර්යක්ෂම ගොඩනැගිල්ල ඉදිකිරීම අරමුණු කරගෙනයි. 2007 අංක 35 දරණ ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරි පනතේ 46 (37-ඉ) ප්‍රකාරව බලශක්ති කාර්යක්ෂමතාවය වැඩිකිරීම සඳහා වන තාක්ෂණය ප්‍රවර්ධනය කිරීමට හා එවැනි ව්‍යාපෘති සඳහා බලශක්ති අරමුදල යොදාගත හැකිය.

(ඇ) බලශක්ති ක්ෂේත්‍රයේ කාර්යසාධන වාර්තාව සෑම වසරකම පිළියෙළ කරන අතර එය අමාත්‍යාංශය වෙත ලබාදීමට කටයුතු කර ඇත.ඉදිරියේදී එම වාර්තාව අමාත්‍යවරයා මගින් පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට නියමිතය.

(ඈ) රාජ්‍ය භාගය ලබා ගැනීම සඳහා අයවැය යෝජනා වලට ඇතුලත් කිරීමට අවශ්‍ය නිර්දේශ මුදල් අමාත්‍යාංශයට ලබාදීමට කටයුතු සිදු කර ඇත.

2.2.4 සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර බාවිතා කර ඇති බව

(අ) අධිකාරිය සතු වාහන අධීක්ෂණය කිරීම සඳහා මෙහෙයුම් පද්ධතිය ස්ථාපනය කිරීමට 2020 වර්ෂයේදී ප්‍රතිපාදන වෙන් කරවා ගෙන තිබුණි. නමුත් පැවති කොරෝනා වසංගත තත්වය හේතුවෙන් මෙහෙයුම් පද්ධතිය ස්ථාපනය කිරීම සඳහා ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කිරීමට නොහැකි විය. 2021 වර්ෂයේදී මේ සඳහා ප්‍රසම්පාදන වෙන් කර නොතිබිණි.

(ආ) එම මුදල් කාර්යක්ෂම ලෙස ආයෝජනය සිදු කිරීමට (රාජ්‍ය බැංකු වල) කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය නිසි පරිදි ලබාගෙන ඇති අතර, මුදල් විධිමත් ලෙස හා ඵලදායි ලෙස ආයෝජනය කිරීමට බලාපොරොත්තු වේ.

3. වෙනත් කරුණු

(අ) ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය සඳහා බදවා ගැනීමේ පටිපාටිය 2020 අගෝස්තු 24 වන දින අනුමත වූ අතර 2020 වර්ෂය අවසන් වන විට පුරප්පාඩු වූ තනතුරු සඳහා අභ්‍යන්තර උසස්වීම් පටිපාටිය ඔස්සේ පුරප්පාඩු පුරවන ලදී. ඊට පසු තව දුරටත් පැවැති පුරප්පාඩු අතරින් ආයතනයේ අපේක්ෂිත අරමුණු ඉටුකරගැනීම සඳහා වන අත්‍යාවශ්‍යම තනතුරු වූ සහකාර අධ්‍යක්ෂ (ඉංජිනේරු) තනතුරු සඳහා බඳවා ගැනීම 2021 වර්ෂයේදී සිදු කරන ලදී. ඒ අනුව ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 27 අතරින් 16 දෙනෙකු පත්කර ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගන්නා ලදී. මේ සඳහා බඳවාගැනීමේ පටිපාටියට අනුකූලව කටයුතු කර සහකාර අධ්‍යක්ෂ ඉංජිනේරු තනතුරු 10 කට සුදුසුකම් සහිත ඉංජිනේරුවන් බඳවාගෙන ඇත.

(ආ) 2020 වර්ෂය සඳහා වන වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම තුල අපේක්ෂිත මූල්‍ය හා භෞතික ඉලක්ක දක්වා නොතිබූ අතර එම අඩුපාඩු නිවැරදි කරගනිමින් 2022 වර්ෂය සඳහා සකස් කල ක්‍රියාකාරී සැලැස්ම තුල එම ඉලක්කයන් දක්වා ඇත.

(ඇ) කුඩා ජල විදුලි ජනන ව්‍යාපෘති සඳහා ඉඩම් අත්පත් කර ඒ සඳහා අවශ්‍ය කටයුතු කෙරෙහි අතරමැදි ආයතනයක් ලෙස ශ්‍රී ලංකා. සු. බල. අධිකාරිය කටයුතු කරයි. ආයෝජකයින්ගෙන් ලද මුදල් ජංගම වගකීම් යටතේ ගෙවිය යුතු මුදල් ලෙස හඳුනාගත්ත ද අදාල ව්‍යාපෘතීන් අවසන් වන තුරු මුදල් නිදහස් කළ නොහැකිය.

විගණන වාර්තාවේ සඳහන් කර ඇති රු. 5,049,485/- ක මුදල් සඳහා අදාල ආයෝජන ව්‍යාපෘතීන් හි වර්තමාන තත්ත්වය සලකා බලා අවශ්‍ය කටයුතු අදාල අංශය හා ඒකාබද්ධව සිදු කිරීමට කටයුතු යෙදවීමට බලාපොරොත්තු වේ.

(ඈ) ලැබිය යුතු මුදල් යටතේ දක්වා ඇති රු. 8,406,407/- ක මුදල තුල සෘක්‍ර ආයතනනයේ ගොඩනැගිලි කුලි වෙනුවෙන් ගෙවන ලද රු.මී. 8,033,271/- මුදලක් අන්තර්ගතව ඇත. මෙම මුදල අයකර ගැනීමට කෲ ආයතනයටම දිගින් දිගටම දැනුම් දුන්නත් ඔවුන් විසින් එම මුදල් නොගෙවූ බැවින් අමාත්‍යාංශය විගණන හා කලමනාකරණ කමිටු රැස්වීමේදී ගනු ලබන තීරණයක් මත එය සුනිත්‍ය බලශක්ති අධිකාරියේ වියදමක් ලෙස හඳුනා ගැනීමට තීරණය විය. ඒ සඳහා මහා භාණ්ඩාගාර අනුමැතිය 2021 වර්ෂයේදී ලැබුණි.

අනෙකුත් ලැබිය යුතු මුදල් සම්බන්ධයෙන් අයකර ගැනීම් සඳහාද අවශ්‍ය ක්‍රියාමාර්ග සූදානම් කර පවතියි.

(ඉ) මූල්‍ය රෙගුලාසිවලට අනුකූලව ඉහත මුදල් අයකර ගැනීම සිහි කැඳවීමේ ලිපි යොමු කිරීම මගින් හා ශේෂ තහවුරු කරගැනීමක් සිදු කර ඇත. ඒම ශේෂ අය කර ගැනීමට කටයුතු සිදු කිරීමට බලාපොරොත්තු වේ.

(ඊ) වෙනත් ගෙවීම් හා ණය හිමියන් සඳහා සිහි කැඳවීම් ලිපි යොමු කර ඇති අතර ඒ සඳහා පිළිතුරු ලබා නොදෙන අයිතමයන් හඳුනාගත් බැවින් ආදායම් ගිණුමට බැර කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් ඇත.

සභාපති
ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය

ආයතනික තොරතුරු

අධිකාරියේ නම

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය

නීතිමය තත්ත්වය

2007 අංක 35 දරන ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරී පනත මගින් ස්ථාපිත කරන ලද ව්‍යවස්ථාපිත අධිකාරියකි.

ලියාපදිංචි කල කාර්යාලය

72, ආනන්ද කුමාරස්වාමී මාවත, කොළඹ 07.
ටෙලි : 0112 575 203ර0112 575 030
ෆැක්ස් : 0112 575 089
විද්‍යුත් තැපෑල : info@energy.gov.lk
වෙබ් : www.energy.gov.lk

Designed & Produced by
mediaWIZE®
Annual Reports
Printed by
Photography by